# ආලෝකය




Scanned with CamScanner

# ආලෝකය

# ලෙනින් ගැන කතා

ප්‍රගති ප්‍රකාශක මන්දිරය
මොස්කව්

Scanned with CamScanner

## ප්‍රකාශකයන්ගෙන්

ව්ලදිමිර් ඉල්යිච් ලෙනින්...

ඔහුගේ නම නොඇසූ රටක්, ජාතියක් මෙලොව නැත.

ලෙනින්ගේ නායකත්වය යටතේ රුසියානු ජනතාව 1917 ඔක්තෝබර් මාසයේදී සමාජවාදී විප්ලවය ජයගෙන, ලෝකයේ පළමුවැනි සමාජවාදී රජය ගොඩනැඟූහ.

වි. අයි. ලෙනින්ගේ ජීවිතය හා ක්‍රියාකාරිත්වය කොතරම් විශාලදයත්, එහි හැම පැත්තක්ම අළලා විස්තර කිරීමට මෙ පොත සමත් නොවේ.

මේ පොතේ අඩංගු කතාවලින් කියැවෙන්නේ ජීවන තතු ස්වල්පයක් පමණකි. අපේ පාඨකයින් — බාලයන් මෙන්ම වැඩිහිටියන්ද මේ පොත ආශාවකින් කියවනු ඇතැයි අපි විශ්වාස කරමු. ඔබගේ අදහස් අපවෙත දන්වා එවන්නේ නම්, එයටද අපේ කෘතඥතාව හිමිවේ.

ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්

Scanned with CamScanner

# පටුන


සෙ. වොස්ක්‍රෙසේන්ස්කයා. රාත්‍රිය . . . . . . . . . . . . . . . . . 9

එම්. ෂගින්යාන්. ඉතිහාසය පිළිබඳ ප්‍රශ්න පත්‍රය . . . . . . . . . . . . . 14

එල්. රාදීෂෙව්. ඉදිරියට පදවනු! . . . . . . . . . . . . . . . . . . . 25

එම්. ප්‍රිලෙජායෙවා. සිත දවස . . . . . . . . . . . . . . . . . . . . 33

සෙ. වොස්ක්‍රෙසේන්ස්කයා. මඟුල් මුදු . . . . . . . . . . . . . . . 39

සෙ. වොස්ක්‍රෙසේන්ස්කයා. ආලෝකය . . . . . . . . . . . . . . . . . 45

සෙ. වොස්ක්‍රෙසේන්ස්කයා. අපූරු රථය . . . . . . . . . . . . . . . . 71

එන්. හෝඩ්සා. ලුහුබැඳීම. . . . . . . . . . . . . . . . . . . . . . . 85

පි. කාපිට්සා. අවිගත් නැඟිටීම . . . . . . . . . . . . . . . . . . . 88

වි. බොන්ච්–බ්රුයෙවිච්. සමාජවාදී විප්ලවයේ පළමුවැනි දවස . . . . . . . . 94

ඇස්. ඇලෙක්සේයෙව්. රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියා . . . . . . . . . . . 100

වි. බොන්ච්–බ්රුයෙවිච්. සෝවියට් රාජ්‍ය ලාංඡනය . . . . . . . . . . . . . 111

ඒ. කෝනනව්. සතුරු වෙඩිපහර . . . . . . . . . . . . . . . . . . . . 113

වි. බොන්ච්–බ්රුයෙවිච්. සක්මන . . . . . . . . . . . . . . . . . . . 116

ඒ. කෝනනව්. කෂිනෝවට ගිය ගමන . . . . . . . . . . . . . . . . . . 119

ඇස්. අන්තෝනොව්. ක්‍රෙම්ලින් හමුව . . . . . . . . . . . . . . . . . 131

ඇස්. ඇලෙක්සේයෙව්. රහස් ආයවනය . . . . . . . . . . . . . . . . . . 139

ස්. වොස්ක්‍රෙසේන්ස්කයා. මල් පැළ . . . . . . . . . . . . . . . . . . 141

ඇස්. ඇලෙක්සේයෙව්. හිම කුරුල්ලා . . . . . . . . . . . . . . . . . . 146

එල්. වොරොන්කෝවා. ලෙනින් ළමයිනට ඇලුම් කළේය . . . . . . . . . . . 149


Scanned with CamScanner

# රාත්‍රිය



උඩුමහලේ ළමා කාමරයේ නිදා සිටි ද්මිත්‍රි සහ මරියා කිසිවක් නොදත්හ. පිටර්බුර්ගයට ගොස් සිටි අම්මා අන් සියල්ලන්ට පෙර ඒ ගැන හැම දෙයක්ම දැන සිටියාය.

මැද ශාලයේ පහන් එළියෙන් මෙසයේ කොටසක් ආලෝකවිය. මෙසය මත ''සිම්බිර්ස්කියෙ ගුබෙර්න්ස්කියෙ වේදමස්ති'' නමැති පුවත්පතේ පිටපතකි.

ඕල්යා දෑතින් හිස බද අල්ලාගෙන, ඒ මේ අත වැනෙමින් කඳුළු වගුරුවයි.

වලෝද්යා ඒ බියජනක පුවත දෙස ඇසිපිය නොහෙළා බලාගෙන සිටී.

''... විශේෂ අධිකරණ මණ්ඩලය විසින් ගෙනෙරාලව්, අන්ද්‍රෙයූෂ්කින්, ඕසිපානොව්, ෂෙව්රෙව් සහ උල්යානොව් නම්වූ ත්‍රස්තිකරුවන් පස්දෙනා එල්ලා මරාදැමීමට තීරණය කරන ලදින්, එම තීරණය 1887 මැයි මස 8 ද ක්‍රියාවට යොදවන ලදී.''

ඒ පුවත අතින් මකා දැමීමට මෙන් වලෝද්යා පුවත්පතේ අකුරු අත්ලෙන් වැසීය. ඒ දුෂ්ට අපරාධය සැබෑවක් ලෙස පිළිගැනීමට ඔහුගේ බුද්ධිය ඔහුට ඉඩ නොදෙයි.

සාෂා ජීවතුන් අතර නැතැයි යන්න පිළිගන්නේ කෙසේද? බුද්ධිමත්, දීප්තිමත් යුක්ති ගරුක සාෂා එල්ලා මරා දැමීමට පුළුවන්ද?..

බලාපොරොත්තු රහිතබව සහ හද පත්ලෙන් නැගී එන කෝපය නිසා කෑගැසීමටද, වහාම කොහේහරි පැන දිවීමටද, මිනීමරුවන් අල්ලා උන්ට නිසි දඬුවම් දීමටද වලෝද්යාට සිත්විය.

ඕල්යා තුළද හටගත්තේ එවැනිම හැඟීමෙකි.ඇයට ඒ පුවත දැන්වීමට පෙර, ඒ සඳහා ඇගේ සිත දවස් කීපයක් තිස්සේ වලෝද්යා විසින් පිළියෙල කරන ලදී. අවසානයේදී සිදු වූ දේ විස්තර කළේය. එවිට ඈ බිම පෙරළෙමින් සාර් මරාදමන බවට තර්ජනය කරමින් කෑ ගැසුවාය.

වලෝද්යා වියලි ඇස්වලින් යුතුව ඒ පුවත දෙස බලයි. ඔහුට එහි අකුරු පේළි අතරින් තම වැඩිමහල් සොහොයුරා වන සාෂාගේ සේයාව මැවී පෙනේ.

එය සිදුවූයේ කෙසේද?..

අයියාත් මල්ලිත් දෙදෙනාම අටවාලයට වැදී පොත් කියවා උණුසුම් ලෙස වාද විවාද කළ කාලයක් විය. සියලු රටවල ජනතාව ගෙනගිය විරෝදර සටන් වලට දෙදෙනාම ඇලුම් කළහ. සාෂා ප්‍රංශ විප්ලවය හා පැරිස් කොමියුනය ගැන බොහෝ පොත් කියැවිය. පැරිස් කොමියුනාර්ඩ් වරුන්ගේ ඉරණම ගැන වලෝද්‍යාට විස්තර කියා දුන් හෙතෙම ප්‍රංශයේ මෙන් රුසියාවේද විප්ලවයක් ඇතිවන බවත්, එය ජයගන්නා බවත් කීවේය. සාෂා නිසැකවම විප්ලවවාදියෙකු වනු ඇතැයි එද වලෝද්‍යා සිතුවේය.

අවසාන වරට සාෂා ගෙදර ආවේ සරසවි නිවාඩු කාලයේදීය. වෙනදට වඩා නිහඬව සිටි සාෂා අණු දක්නය ලහටවී කාලය ගෙවමින් උපාධියට සූදනම් වන සැටි දුටු වලෝද්‍යා තුළ උදසීන බවක් ඇතිවූයේ, තම වැඩිමහල් සොහොයුරා විප්ලවවාදියෙකු නොවනු ඇතැයි ඔහු සිතූ නිසා විය යුතුය.

ගිම්හාන පැළ තුළ බංකුවක වාඩි වී දණහිස් මත දැත් තබාගෙන සමාධියට වැදුණු කලෙක මෙන් ගැඹුරු කල්පනාවක යෙදී සිටින තම සොහොයුරු වරෙක වලෝද්‍යා දුටුවේය. ගැඹුරු බැල්ම සහිත ඔහුගේ ඇස්වල මළානික බවකි. වලෝද්‍යා ඔහු දෙස බැලුවේ ප්‍රශ්නයක් අසන්නාක් මෙනි. සාෂා මට ගැනද, සොහොයුරියන් ගැනද කතා කළේය. ඔවුන් ඉතා හොඳින් රැකබලා ගන්නා ලෙසත්, ඔවුන්ට පසුතැවිලි වීමට ඉඩ නොතබන ලෙසත් සාෂා මල්ලිගෙන් ඉල්ලා සිටියේය. සාෂා සහ ආන්යා අධ්‍යාපනය සඳහා පීටර්බුර්ගයට ගිය පසු, ගෙදර නැවතුණු අය අතරින් වලෝද්‍යා වැඩිමහල් සොහොයුරු විය...

තම හිස කෙස් අතරින් ඇඟිලි තුඩු යැවූ වලෝද්‍යා කවුළුවෙන් එපිට පැතිර ඇති අඳුර දෙස බලමින් කල්පනා කරන්ට විය. සාෂාගේ මරණය නිසා ඔහු තුළ ඇතිවූයේ ඉවසිය නොහැකි වේදනාවකි. එතරම් කටුක මරණයකට තම සොහොයුරා ගොදුරුවීම නිසා ඔහුගේ ශක්තිය සිඳී ගියේය.

...ඕල්යා විසිත්ත කාමරයේ සෝපාවෙක සැතපී සිටියාය. කවුළුවෙන් එපිට ඇති පාම්ගස් වලට සඳ එළිය වැටේ, එහි සෙවණැලි කාමරය තුළට වැදෙන්නේ වන සතුන්ගේ උල් නිය සහිත පාදයන් මෙනි.

''නංගි නිදිද?'' යි වලෝද්‍යා ඇසීය.

පිළිතුරු නොදුන් ඕල්යා නොසෙල්වී සිටී. වලෝද්‍යා ගිනිකූරක් දල්විය. නටන ගිනිදැල්ල නිසා ඇගේ මුහුණ අප්‍රාණික බවක් පෙන්විය. ඇ මිය ගොසිනැයි ඔහුට සිතිණ.

''ඕල්යා, සුදු නංගියේ නැඟිටපන්'' යැයි කී වලෝද්‍යා ඇගේ හිස එසෙව්වේය.

ඇය සුසුම් ලමින් තම හිස, සොහොයුරාගේ ළය මත තබාගෙන ඉකිබිඳ අඬන්නට වූවාය.

Scanned with CamScanner

''සාෂා නැතිව අපි මොනවා කරන්ටද? අම්මාට මොනවා වේද? තාත්තා ජීවත්ව සිටියා නම්...''

''මේ පහරට තාත්තා මුහුණ දෙන්නේ කොහොමදැයි මා දන්නේ නැහැ'' යැයි වලෝද්යා තමාටම කියා ගත්තාක් මෙනි.

නංගි තවමත් ඉකිබිඳ අඬයි. ඈ සුසුම්ලන සැටි වලෝද්යාට දැනේ. හේ නංගීගේ උරහිස අල්ලාගෙන ඇය සනසමින් නිහඬ විය.

''වලෝද්යා ඇයි නිහඬව ඉන්නේ? මොනවා ගැනද නිතරම කල්පනා කරන්නේ?''

''සාෂා ගැන... අම්මා ගැන... ඉදිරියට යන කලදසාව ගැන...''

හඳ අහසේ මුදුන්වත්ම, ගෙතුළට වැටී තුබුණු සඳ එළිය කෙමෙන් අඩුව ගොස් ජනේලය අසලට විය.

හැඬීමෙන් දුර්වල වූ ගතත් සිතත් ඇති ඕල්යා නිදන්නට වූවාය. ඇගේ හිසට යටින් කොට්ටයක් තැබූ වලෝද්යා නිහඬව එතැනින් පිට වී උඩුමහලේ ඇති සාෂාගේ කාමරයට ඇතුළු විය.

එහි සාෂාගේ පර්යේෂණ උපකරණද, වීදුරු බට හා ශරාවන්ද තිබිණ. හැම දෙයක්ම මෙහි ඇත. නැත්තේ සාෂා පමණකි.

සඳඑතලයේ ජනේලය හැර දැමූ වලෝද්යා කමිස කර හැර ගෙන පිරිසුදු වාතය ගිලගත්තේය.

ගලාබසින දිය ඇල්ලක් සේ අදහස් ඇද හැලෙයි.

මොනවා කරන්ටද? සාර්ව මරා දමන්ටද? සාෂාගේ මරණය නිසා පළිගැනීම පිණිස ඔහු ගත් මඟ ගන්ටද?.. එයින් ජනතාවට වන ලාභය කුමක්ද? මීට අවුරුදු හයකට පෙර නරෝද්නික්වාදී ග්‍රිනෙවිට්ස්කි සාර් රජ මරා දැමුවේය. දෙවැනි ඇලෙක්සාන්දර් වෙනුවට තුන්වැනි ඇලෙක්සාන්දර් රජකමට පත්විය. තත්ත්වය වඩාත් නරක් විය, ජනතා දුක වැඩිවිය, ප්‍රගතිශීලි, අවංක හැම අදහසක්ම වළලන ලදී. තාත්තා ඉතා අමාරුවෙන් පටන්ගත් ගම්බද පාසල් වසා දැමීමට පටන්ගෙන ඇත.

හැම රාත්‍රියකදීම අම්මා දරු නැලවිලි ගීයක් ගයයි. දනුදු එම ගීය ඇසෙන්නාක් මෙනි:

''... සියවස් ගණනක සිට
මෙලොව රහස් සෙවීමට
තැත්කරන මිනිසාට
නව බලයක්
ලබාදිය යුතුමැයි.''

2*

සටන් කිරීම සඳහා මිනිසාට නව බලයක් ලබාදිය යුතුය. ඒ බලය කොහිද? එහි රහස කුමක්ද? අයුක්තිය, පෑගීම නැතිකරන්නේ කොහොමද? එය තනිවම කළ හැකි කාරියක් නොවේ. සිය ගණනකටද එය කළ නොහැකිය. එය කිරීමට දස ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ ධෛර්යය උවමනාය, ඒ සා විශාල ජන සංඛ්‍යාවක් ඒකරාශි කරන්නේ කොහොමද?

''සාෂා... නුඹ ගෙනගිය ඒ සටන්කාමී ධජය මම උසුලා ගෙනයන්නම්. ජය ලබාගැනීම සඳහා නුඹේ පරමාර්ථය වෙත මා ළඟා වන්නේ වෙනත් මඟකිනි. අයියණ්ඩිය! නුඹ ජීවිතය පූජා කළ ඒ ජනතා ව්‍යාපාරය වෙනුවෙන් මම ද ජීවිතය කැප කරමි...''

අරුණෝදයේ ප්‍රණීත සුළං පිපිණු මල්වල සුවඳ සමග මුසුවී හමායයි.

දැන් පදිංචි වී සිටින ගෙදරට පළමුවරට ආ දවසේ පාළු වී ගිය ඉඩම දෙස බැලූ අම්මා, අනාගත මල් වත්තක් ගැන සිතූ සැටි වලෝද්‍යාට මතක් විය. දැන් එහි වියලි අතු සහිත කණාටු ගස් එකක්වත් නැත. බැලූ, බැලූ හැම තැනම මල් පාත්තිය.

හිරු උදවිය. චෙරි ගස් ලා රත් පැහැයක් ගෙන තිබිණ. එල්ම් ගස් රන්වන් පාටින් දිලිසෙයි.

කරත්ත රෝද ගැටෙන හඬක්ද, අසුන් හේෂාවරය කරන සැටිද ඇසේ.

වලෝද්‍යා පහත මාලයට බැස ගෙට ඇතුළුවන දොර හැරියේය. අස් රියෙන් බට ආන්යා වලෝද්‍යාගේ ගෙල බදගනිමින් නොවැටී සිටියාය. ගෙට ඇතුළු වූ අම්මා හිස්වැස්ම ගලවා දමා 'ක්‍රික්' හඬ නංවමින් පඩිපෙළ නැඟ සාෂාගේ කාමරයට වැදුණාය.

''අන්න අම්මා ආන්යා එක්කර ගෙන ඇවිල්ල! ගිහිල්ල මූණ සෝදගන්න. ඇඬූ කඳුළෙන් අම්මා ඉදිරියේ පෙනී හිටින්ට එපා...'' යැයි වලෝද්‍යා ඔල්යාට කීය.

''හනිකට නැඟිටපල්ලා!'' යැයි පොඩිත්තන්ගේ කාමරයට ගිය ඔහු කීය. ද්මීත්‍රියිට ඇඳුම් ඇඳගැනීමට උදව් වූ වලෝද්‍යා මරියා නංගීගේ කොන්ඩය ගෙතීමට පවා උත්සාහ කළ මුත්, එය සාර්ථක නොවිය. ''අම්මා ආවා. අපි යමු.''

ළමයින් සියළු දෙනාම සාෂාගේ කාමරයේ දොර අසල සිට ගත්හ. අම්මා සාෂාගේ ඇඳ මත මුණින් වැතිර, කොට්ටයකින් හිස වසාගෙන සිටියාය.

වලෝද්‍යා මවට ළංවී ''අම්මේ'' යැයි ඇමතීය.

මරියා ඇලෙක්සාන්ද්‍රව්නා නොසැලී වැතිර සිටියාය. වලෝද්‍යා මව වෙතට ළං කළේය. සිහිනි මරියා ඇඳට නැග මවගේ ගෙල බදගෙන සිප ගත්තාය.

''අම්මී, මා දිහා බලන්නකො'' යැයි ඈ කීවාය.

ඇඳ මත වාඩි වුණු මරියා ඇලෙක්සාන්ද්‍රව්නා තම දරුවන් දෙස මහත් ඕනෑකමින් බැලුවාය. මඳ සිනාවකට සමාන යැයි කිවහැකි යමක් ඇගේ මුහුණෙහි දක්නට තිබිණ.

ළමයින් සියළු දෙනාම පෙළට සිටගෙන ඈ දෙස බලති. බලාපොරොත්තු රහිතබව සහ මාතෘ ප්‍රේමය ඒ ළමා ඇස්වලින් පෙනේ. ''අම්මා නැතිව අපට නම් කොහොමටවත් බැරිය, අප නැතිව අම්මාටත් බැරිය'' යන්න ඔවුන්ගේ නෙත්වල ලියා තිබිණි.

තම දරුවන් දෙස බැලූ මරියා ඇලෙක්සාන්ද්‍රව්නා සුපුරුදු ලෙස ''උදේ තේ බීමට යමු'' යැයි ඔවුන්ට කීවාය.

## ඉතිහාසය පිළිබඳ ප්‍රශ්න පත්‍රය

(සංක්ෂේපයකි)

ඉතිහාසය පිළිබඳ පරීක්ෂණය පැවැත්වෙන්නේ විදුහලේ පොදු ශාලාවේය. එය ඉතා අමාරු පරීක්ෂණයකි. ඉතිහාසය උගන්වන ගුරුතුමා නිතර අනුන්ගේ දෙස් දකින්නෙකි. පැටලිලි සහිත ප්‍රශ්න ඇතුළු කොට ඔහු ප්‍රශ්න පත්‍ර සාද තිබුණේය. නිදසුනක් වශයෙන් හතරවැනි කාර්ල් රජ පිළිබඳ ප්‍රශ්නය ඉතිහාස පොත අනුව සකස් නොවිණ. ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ගුරුවරයාගේ දෙශනයන්ද, වෙනත් ඉතිහාස පොත් සහ ශබ්ද කෝෂද කියැවිය යුතුය. හැම දෙයක්ම දන්නා වලෝද්යා උල්යානොව්ගෙන් කල්ඇතිව අසා දැනගැනීමට අනික් සිසුන්ට උවමනාවූවද, මේ වර ඒ සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවිය. මිනිසුන් නැවතත් තමා දෙස නෙත් කොණින් බලන සැටි වලෝද්යාට පෙනේ. පණුවන් දකින විට ඇතිවන පිළිකුල් සහගත හැඟීමක් එම බැලුම් නිසා ඇතිවිය. විදුහලට පැමිණි වලෝද්යා උල්යානොව් පොත් මිටිය බැඳ තුබූ හම් පටිය ලිහා දමා, පුරුදු පරිදි එය තම දබරගිල්ල වටා එතිය. සුපුරුදු තැන වාඩි විය. එහෙත් උල්යානොව් මලාණික වැ සිටින සැටි කාහටවුවද පෙනේ. ඔහුගේ වැඩිමහල් සොහොයුරු — ඇලෙක්සාන්දර් එල්ලා මරා දමා ඇති බව නගරවැසියෝ දැන සිටියහ. උල්යානොව් පවුලේ යෙහෙළියක් වන කෂ්කදමොවා ගුරුතුමියටද ඒ ගැන දැන්වෙන ලිපියක් ලැබී ඇති බවත්, වලෝද්යා ඒ පුවත ගැන දන්නා බවත් හැම දෙනාම දැන සිටියහ. එම පුවත කියැවූ වලෝද්යා පැවසූ අදහස් ගැනද සමහරු දැන සිටියහ: ''නැහැ. යා යුත්තේ ඔය මඟ ඔස්සේ නො වේ...'' කොහේ යන්ටද? යා යුතු මඟ කුමක්ද? කුඩා නගරවල වැසියෝ එකිනෙකා ගැන හැමදෙයක්ම, හැමදම දනිති. තම සගයින්ගේ බැලීම් වලෝද්යාට දැනෙන්නේය. ඒ අතර කාන්තා විදුහලේ ප්‍රංශ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයකට ඕල්යා පිළිතුරු දෙයි. ඇ මළගිය එකියක මෙන් සුදුමැලිය. ඇගේ කටහඬ දැඩිය. අනුන්ගේ තොරතුරු දැනගැනීමේ ආශාවක් තරුණියන් තුළ තිබුණද ඔවුහු තරුණයන්ට වඩා දයාබර සිත් ඇත්තියෝ වෙති. පංතියේ සිසුවියන්ගේ ආදරයට ලක්වැ සිටි, ප්‍රීතිමත්, නැණවත් ඕල්යාගේ මිතුරියෝ දැන් නිහඬව ඇයට අතදී ආචාර කොට මුළු වදිති. ඇගේ අත සුදුමැලිය, ශීතලය.

Scanned with CamScanner

පංතියේ තම යෙහෙළියන්ට වඩා ඉගෙනීමෙහි දක්ෂ ඕල්යා දැන් පිට එකියක් ලබන සැලකුම් ලබන්නිය..

උල්යානොව්ට පෙර ප්‍රශ්න පත්‍ර මේසය වෙත ගියේ ඔහුගේ පංතියේ තොල්ස්තෝයිය. ඔහු ප්‍රශ්න පත්‍රය අතට ගත්තේ වෙව්ලන ඇඟිලි වලිනි. ලකුණු තුනකට පිළිතුරු දීමෙහි ඔහු සමත් විය. ඉන්පසු වලෝද්‍යා උල්යානොව්ගේ වාරය පැමිණියේය. ඔහුට කොතරම් අපූරු ප්‍රශ්න පත්‍රයක් ලැබුණේද යන්න කිප වරක්ම කිමට මට පසු කලෙකදී සිදුවිය. ඉතිහාසය පිළිබඳ ගුරුවරයා අමාරු, අසීරු ප්‍රශ්න සියල්ලක්ම එකම ප්‍රශ්න පත්‍රයකට ඇතුළු කළේ පුදුම ඉරණමක් නිසා විය හැකිය. ලෝක ඉතිහාසයේ විප්ලව හා පංති සටන් පිළිබඳ සියලු ප්‍රශ්න එහි විය. පළමුවැනි ප්‍රශ්නය — උඩගු රෝමානු වංශාධිපතීන්ට එදිරිව තම අයිතිය සඳහා සටන් කොට කඳුකරයට වැදුණු රෝමානු නිර්ධනින් ගැනය. මුළු පංතියම බිය ගැන්වූ හතරවැනි කාර්ල් රජ පිළිබඳ ප්‍රශ්නයත් එහිම විය. තමාට සිදුවී ඇත්තේ නිකමම පරීක්ෂණයකින් සමත් වීමට නොවන බව උල්යානොව්ට වැටහිණ. විදුහල් පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ කල්පනාකාරී සහ අප්‍රසන්න පෙණුමද, තම සිසු සගයින්ගේ කුතුහලය මුසු බියසුලු විලාසයද, සිම්බිර්ස්ක් නගරයේ නිදිබර ගතියද දුටු උල්යානොව් තමා ඉදිරියේ ඇත්තේ, අනාගත ජීවිතය, ඉගෙනගැනි මේ අයිතිය හා විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නය බව වටහා ගත්තේය. ඔහුද වංශාධිපතීන්ට එදිරිව සටන් කොට කඳුකරයට වැදුණු රෝමානු නිර්ධනයෙකු මෙනි. ඊයේ දවස තෙක් ඔහුද පංතියේ අනෙකුත් සිසුන් මෙන් විය. එහෙත් දැන් ඔහුගේ වැඩිමහල් සොහොයුරා එල්ලා මරා දැමීමෙන් පසු පංතියෙන් පිට කරන ලද වසංගත රෝගියෙකු මෙන් ඔහු දෙස බලති. ඔහුට විරුද්ධව ඇති එම කවය සහ බාධක කොතරම් තාත්ත්විකදැයත්, එවායේ තියුණුබව පළමුවරට ඔහුට දැනෙයි... ඒ බාධක නැති කොට මිනිසුන් අතර සමානත්වය ඇති කිරීමට වැඩිමහල් සොහොයුරාට උවමනා විය. එවැන්නක් අවශ්‍යබව කියා සිටියේ ඔහුගේ අයියා පමණක්ද? ප්‍රශ්න පත්‍රය ඔහු කියැවීය: වංශාධිපතීන්ට එදිරිව ප්ලිබියන් වරුන්ගේ සටන, ප්‍රතිසංස්කරණය, බොග්දන් ග්මිල්නිට්ස්කි. ලෝක ඉතිහාසය සටන් වලින් පිරී පවතී. සටන් කළ යුත්තේ තනිවම නොවේ, කොන්වූ මගක් ඔස්සේ නොවේ. වලෝද්‍යා උල්යානොව් පිළිතුරු දීමට පටන් ගත්තේය. ඔහු නිසලව ළමා-ගැටවර කටහඬකින් කතා කළේය. පිළිතුරු පැහැදිලිය, ගැඹුරුය. කඩදාසියක මොනවාදෝ කුරුටු ගාන්ට පටන්ගත් ගුරුවරයා ඔහුගේ පිළිතුරු අනුමත කරන බවක් පෙන්වමින් හිස වනන්ට වූයේ නොදැනුවත්වමය. පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෝ එකිනෙකාගේ මුහුණු බැලූහ. ඉතාම උසස් අන්දමින් පිළිතුරු



Scanned with CamScanner

සපයා ඇති බැවින් විරුද්ධවීමට හේතුවක් නැත. විදුහලේ අධ්‍යක්ෂක මහලු තරබාරු කෙරෙන්ස්කිද සිතින් උල්යානොව්ගේ පිළිතුරු වලට එකඟ විය: වැඬේ අවදානම් වුවද කළ හැකි අන්දෙයක් නැත. දක්ෂතම ශිෂ්‍යයාට පිරිනමන රන් පදක්කම උල්යානොව්ට නොදී බැරිය. දැනිම අතින් ඔහු අන් අයට වඩා උසස්ය.

ඒ මොහොතේදී තරුණ ලෙනින් සිතුවේ මොනවා ගැනද? ඔහු ඉදිරිපිට වටිනා ජීවිත දෙකක් ගෙවිණ. ඒ ජීවිත දෙකම රුසියානු සමාජයට ආවේණික වූ සංකේතයන්ය. ජනතාවට අධ්‍යාපනය ලබාදීම සඳහා මුළු ජීවිතයම කැප කළ ඔහුගේ ආදරණීය පියා, විප්ලවයක් ගැන කල්පනා නොකළේය. සාමකාමී සංස්කෘතික වැඩවල නිරතවීමේ මඟ ඔහු ගත්තේය. තම සිතැඟියාවන් විනාශ වී යන සැටි ඔහු ජීවත්ව සිටියදීම ඔහුට දකින්නට සිදුවිය. අවුරුදු බොහෝ ගණනක් තිස්සේ ඔහු දැරූ පරිශ්‍රමය නිසා පටන්ගත් ගම්බද පාසල් වසා දමන ලදී. පියාගේ මඟ ප්‍රතිඵල රහිතය.

ඔහුගේ ආදරණීය වැඩිමහල් සොහොයුරු සාර්වාදයට එදිරිව තනිවම සටන් කිරීමේ ත්‍රස්තවාදී මඟ ගත්තේය. ඒ මඟද විනාශය ගෙනදුන්නේය.

නැත! ජනතාවට මිනිස් දිවියක් ලබාදිය හැක්කේ ඒ මාර්ගවලින් නොවේ!

Scanned with CamScanner

වලෝද්‍යා වයස හැවිරිදි තුනේදී.



උල්යානොව් පවුල. පාසල් ඇඳුමින්
සැරසී වලෝද්යා දකුණු කෙළවර
වාඩි වී සිටී,



Scanned with CamScanner



සිම්බීර්ස්ක්හි උල්යානොව් නිවස.

Scanned with CamScanner

වලෝද්යාගේ පියා වන ඊල්යා නිකොලායෙවිච් උල්යානොව්ගේ කාමරය.



Scanned with CamScanner

දෙවැනි තට්ටුවේ පිරිසිදු ආලෝකමත්
කාමරය වලෝද්යාගේය.



Scanned with CamScanner

සියලුම ළමයින්ගේ ආදර්ශයවූයේ වලෝද්යාගේ වැඩිමහල් සොහොයුරු ඇලෙක්සාන්දර්ය.



Scanned with CamScanner

ඇලෙක්සාන්දර් ගත් මහට වඩා වෙනස් මඟක් අප ගත යුතුය.



Scanned with CamScanner

වලෝද්යා පාසල්යන කාලයේදී.



එල්. රදිපෙව්

## ඉදිරියට පදවනු!

උෂ්ණ දවස්වලදී තොටුපළ හිමියා, තම මෙහෙකාර පිරිසගේ වැඩ කටයුතු ගැන සැලකිල්ලෙන් සිටිම පිණිස තොටුපළ අසලට වී සවස තේ බොයි. මෙතැන ඔහු සඳහා විශේෂ මඩුවකි. එහි කුඩා මේසයක් මත දුම්දමන සමවාරයකි. ඒ මත සුදු පැහැති තේ පෝච්චියකි. මඩුවෙන් අඩි කිපයක් ඈත වොල්ගාව නිසලව ගලා බසී. හිරු රැස් නිසා රිදී පැහැයෙන් දිලිසෙන වොල්ගාවේ කුඩා දිය රැලි මාළු කොරපොතු සිහියට නංවයි.

හැමද මෙන් අදත්, තොටුපළ හිමියා තම ප්‍රියතම තේ මඩුවට ආවේය. කොල්ලෙක් දිලිසෙන සමවාරය මේසය මත තැබිය. තද සුළං පහරක් නිසා තොටුපළ මදක් සෙලවිණ. ඒ අසල වූ කුඩා නැවක වක්වූ බටයකින් වාෂ්ප පිටවිය. පාරුවක, පාවහන් රහිත නැවියෝ ඒ මේ අත දුවති. උෂ්ණය නිසා විඩාපත් මගීහු සෙමින් සෙමින් තොටුපළ දෙසට ගමන් කරති.

''මුදලාලි මහත්මයා දන්නවද වැඩක්?'' යැයි තොටුපළ හිමියා ළඟට ආ නැවියෙක් කිය. ඔහුගේ දිග කලිසම දණහිස් දක්වා නවා තිබිණ. ''මේ දැන් මම ඔරු ළඟින් ගියා. එතන, එක්කෙනෙක් ඉල්ලා හිටිනව, එයාව ගඟ හරහා ගෙනයන්ට කියල. ඔරුකාරයො වැඩි කැමැත්තක් නැහැ. එයා බලකරනව. ගඟ හරහා මගින් ගෙනයාම තහනම් කරන නිතියක් නැතැයි කියල ඒ මිනිහ කියනව. ගඟ කාටවත් අයිති නැතිලු.''

හිස හරවා නොබැලූ තොටුපළ හිමියා මෙසේ කිය:

''එච්චරද?.. ගිහිං වැඩක් බලාගනින්!.''

ගඟ පහළ ඉවුරෙහි කළු පැහැ වනතුරු දුම්මල ලාටු ගානලද ඔරු කිපයකි. එතැන, සැහැල්ලු කමිසයක් හැඳගත් තරුණ මගියෙක් පැසුණු රැවුලකින් සහ ගැඹුරු, පැහැදිලි රැලි සහිත මුහුණකින් යුත් වොල්ගා ඔරුකාරයෙකුට මොනවාදෝ පැහැදිලි කරදෙයි:

''තේරුම් ගන්න! මිනිසුන්ව ගඟ හරහා ගෙනයාම තහනම් කරන්න කාටවත් බැහැ. එහෙම නිතියක් නැහැ... අපේ රටේවත් එහෙම නිතියක් නැහැ!'' යැයි ඔහු කියන විට, ඔහුගේ ඇස්වල උපහාසාත්මක පෙණුමක් ඇති විය.

''අපට මේක කොහොමටවත් තේරුම් ගන්න බැහැ මහත්තයායැ''යි පැසුණු රැවුලා පිළිතුරු දුන්නේය. ''එයා තොටුපළ බදු අරගෙන. සල්ලි රජෙක්. නගරය මිනිහගෙ අතේ. ඒක තමයි නීතිය.''

තරුණයා සෙමින් ඇස් බැම් උස් පහත් කළේය.

''ගඟ හරහා මඟින් ගෙනයාම බදු ගැනීම එයාගෙ වැඩක්. ඒ උණාට වෙනත් මිනිසුන් ගඟ හරහා මගීන් ගෙනයන කොට, ඒක තහනම් කිරීමට එයාට බැරි බව මම ආයෙමත් කියනව. එහෙම කරන්න එයාට අබමල් රේණුවක තරමවත් බලයක් නැහැ! තමුසෙලට බලය තියනව මිනිහට විරුද්ධව නඩු දන්න!''



පැසුණු රැවුලා සිගරට් කොටයට කෙළ ගසා නිවා දැමුවද, එය ගඟට විසි නොකළේය, (වොල්ගා මාතාවට ගරු කළ යුතුය) ඉවුරට විසි කොට පයකින් පාගා දැමීය.

''මිනිහ සල්ලි රජෙක්. එයාට නඩුකාරයින්ව සල්ලිවලට ගන්ට පුළුවනි! මිනිහට ඔක්කොම යටයි... හයිය හත්තිය ඇති එවුන් එක්ක ගහගන්ට යන්ට එපා! සල්ලි කාරයින්ට විරුද්ධව නඩු කියන්ට එපා! ඒ කතාව මහත්තය අහල නැතිද?''

''එය ඇත්ත නොවේ'' යැයි තරුණයා දැඩිලෙස කියා සිටියේය. ''මිනිහ තමුසෙලව නිකම් බය කරල තියනව. මේක හිතුවක්කාර වැඩක්. ඔප්පු කරන්ට සාක්ෂි උවමනා නැහැ. තමුසෙල නඩු කිව්වොත් මිනිහට දඬුවම් කරන්ට සිදු වෙනව!''

අතක් වැනූ පැසුණු රැවුලා පිළිතුරු නොදුන්නේය. ඊළඟ ඔරුවේ කබල් තොප්පියක් පැළඳ සිටි ඔරුකාරයා, වරෙක එක්පැත්තකට වාරුවෙමින්ද, තවත් වරෙක අනික් පැත්තට වාරුවෙමින්ද තොටුපළ දෙස බලාගෙන සිටියේ දෙගිඩියාවකිනි.

''යමුද?''යි තරුණයා ඔහුගෙන් ඇසීය.

''කොහොම උනත් තොටුපළ හිමියා අපට ආපසු එන්ට අණ කරාවි!'' ඔරුකාරයා අස්ථිර ලෙස කීය.

''අපි ගිහින් බලමු. ඒ ගොල්ල උත්සාහ කළාවෙ!''

පිළිතුරු බලා නොසිටි තරුණයා ඔරුව ගඟට තල්ලු කොට, එයට ගොඩ විය, සමබරව පා තබමින් ඔරු අවරය දක්වා ගියේය. ඔරුව වෙත ගිය ඔරුකාරයා හිස වැනුවේ තමා කැමති කරවා ගැනීමට ඉඩ හැරීම නිසා පුදුම වූවාක් මෙනි. ඔහුද ඔරුවට ගොඩ විය. හබල් පාසය ක්‍රික් යන හඬක් නැඟීය. හබල ගැසීම නිසා ජලය කැලතී මුදු හඬක් නගයි. මගියා ගැඹුරු කල්පනාවක යෙදෙමින් ඈත බලයි. ඔහු උපන් ද සිට ඒ යෝධ ගඟේ ඉමක් නැති විශාලත්වයද, ඇසට නොපෙණෙන තරම් දුරද දකින්නේය. එහෙත් ඒ නිසා

Scanned with CamScanner

ඔහුගේ කුතුහලය සිඳුනේ නැත. ඔරුව ඉක්මනින් පැදිණි. ඉවුරේ සිට ඔවුන් දුන් සැහෙන දුරක් ගොසිනි. එහෙත් එගොඩ තවත් බොහෝ ඈතය. හිටි හැටියේ ඔරුකාරයා පැදීම නතර කළේය.

''ඔන්න එගොඩ ආවා'' යැයි ඔහු කෝපයෙන් කෑගැසීය. ''ඒ පැත්ත නෙවෙයි අර පැත්ත — තොටුපළ දිහා බලන්න!''

දිග කමිසයකට උඩින් කෙටි කබායක් හැඳ සිටි මිනිහෙක් තොටුපළ කොණටම අවුත්, දෑත් එක්කොට බටයක් මෙක් කට වටේ තබාගෙන, කෑගසන සැටි ඔරුවේ සිටින්නන්ට හොඳහැටි පෙනේ.



''ඒ-ඒ-ඒ-යි! ආපහු පැදපල්'ලා ආ-ආ-ආ!'' යැයි හේ කෑගැසීය.

''මොකද, මිනිහා කෑගහන්ට පුරුදු වෙනවද'' යි ඇස් හකුළුවා ගත් තරුණයා ඇසීය.

''වෙන කවුද? හිතුවක්කාරයා. බෙරිහන් දෙන හැටි! මුළු වොල්ගාවටම ඇහෙනවා. හාම්පුතා! අපි එයාට කරන බාධාව මොකක්ද?! ඒ මිනිහගෙ නැව් පුරවල මිනිස්සු. ඒ උණාට එකකුටවත් තඹ සල්ලියක් හම්බ කරන්ට ඉඩ තියන්නෙ නෑ... ඒකා හැමදම හරි. මිනිහට ලොකු බලයක් තියෙනව...''

සංඥා පණිවුඩ යවන්නාක් මෙන් තොටුපළ උඩ සිටි මිනිහා දෑත් වනන්ට විය.

''ඒ-ඒයි! උඹලා බිහිරන්ද බොලව්! ආපහු පැදපල්ලා!'' යැයි ඔහු කෑගැසීය.

''තමුසෙ ඔරුව ඉස්සරහට පදිනව, ඉදිරියට පදවනු!'' යැයි තරුණයා කිවේය. ඔහුගේ ඇස් හැකිළිණ, ඇදිරි විය. ''තව හබල් දෙකක් තිබුණනම්!''

''එයින් පලක් නැහැ!'' යි මන්දෝත්සාහී වූ ඔරුකාරයා කිය. ''ඔන්න බලන්න! දැන් පටන් ගනිවි හරිම සෙල්ලමක්... මිනිස්සු රැස් වුනොත්, ආ? හැම පැත්තකින්ම දුවගෙන එනව!''

''කමක් නැහැ! එගොඩට පදිනව!''

දැඩි අදිටනකින් යුත් ඒ තරුණ හඬට අවනත වූවාක් මෙන් ඔරුකාරයාද එගොඩ බලා පැද්දේය. ගඟේ හරි මැද පසු කරයාමට ඔවුන්ට හැකි විය. එවිටම වාගේ කුඩා නැවේ දුම් බටය හඬ නැඟුවේය. ඒ හඬ කුකුළෙකුගේ බැරෑඩි හඬලෑමකට සම විය. නැව වේගයෙන් දුවන්ට පටන්ගත්තේ නොසැලී සිටි දියකඳ දෙබෑ කරන්නාක් මෙනි. පාවහන් රහිත නාවිකයින් කිපදෙනෙක් හාක්කයන් උස්සාගෙන තර්ජනාත්මක විලාසයක් පෑහ. නැංගුරම් දැමීමට සූදානම් විය. දණහිස දක්වා කලිසම නමාගත් පාවහන් රහිත මිනිසෙක් බැරෑඩි ගොරෝසු හඬකින් අණ කරයි. සුදු කවරයක් සහිත නාවික තොප්පියක් ඔහු පැළඳ සිටී. ඔහු මේ කුඩා නැවේ කපිතන් විය යුතුය.



Scanned with CamScanner

දකුණට හරවනු! ඉදිරියට වේගයෙන්!''

වරදකරුවන් රැගත් ඔරුව හා ඒ කුඩා නැව අතර දුර යාර පහක් පමණ වූ විට කපිතන් බැරෑඹි හඬින් කෑගැසීය:

''පස්සට-ගනු! නව-තිනු!''

නැවේ යන්ත්‍ර කිපවරක් හඬ නගා නිහඬ විය. නැව ඔරුවට හැපෙන තරම් ළංවූවිට, නැවියෝ හාක්ක කීපයක් ඔරු කඳට ගැසූහ.

''මගීන් ගෙනයාම තහනම්!'' බැරෑරුම් ලෙස කපිතන් කීය. ''නැවට ගොඩවන ලෙස ඉල්ලා හිටිනව.''

''මේ විධියට බාධා කරන්ට අයිතියක් නැහැ'' යැයි තරුණයා ඉක්මනින් පැවසීය. ''තමුසෙලාට වගකීමට සිද්ද වේවි!''

''ඒක අපට අයිති වැඩක් නෙවි. අපේ කාරිය අණ පිළිපැදීමයි. අපේ හාම්පුතා කියන විධියට අපි වැඩ කරනවා. එගොඩ යන්ට ඕන නම් නැවට නගින්න. ඔරුවට මින් එහා යන්න දෙන්නෙ නැහැ.''

තරුණයා ඔරුකාරයාට කුලිය ගෙවා, නැවට ගොඩ වී සටහන් පොත ගෙන, නැව අයිතිකරුගේ නම, වාසගම දන්වන ලෙස ඉල්ලා සිටියේය.

''ඒ විස්තර දෙන්ට පුළුවනි'' යි කපිතන් කීවේ උදාසීන ගතියකිනි. ''කැමතිනම් ලියා ගන්නව!''

තරුණයා ආපසු තොටුපළට ගෙනගිය විට, තොටුපළ හිමියා ඔහු හමුවීමට විත් කුළු පග බවක් හා මඳසිනා පාමින් කතා කළේය.

''මොකටද මහත්තය ඔතරම් මහන්සි වෙන්නෙ? මගීන් කට්ටියක් එකතු වුණාම නීතිය අනුව අපි මහත්තයව එගොඩ ගෙනියන්නම්... මහත්තය දැන් එන්න අපිත් එක්ක තේ ටිකක් බොන්න. මී පැණි තියෙනව, බටර් බනිස් තියනව...''

ආරාධනය නොඇසුණාක් මෙන් කතා කළ තරුණයා මෙසේ ඇසීය:

''ඔය තමුසෙ කියන නීත්‍යානුකූල මගීන් ගෙනයාම ඇති කළේ කව්ද?!''

''ම-මම'' යැයි ඔහු පිළිතුරු දුන්නේ මඳ සිනාවකින් මුව සරසාගෙනය. ''මම බදු ගෙවනව. ඒ හන්ද අනිත් එවුන්ට ඉඩදෙන්නෙ නෑ! කාරණාව ඕක තමා. තේ බොන්න එන්නෙ නැතිද?.. ඒක ඔහෙගෙ කැමැත්තක්...''

පෙට්ටි, වට්ටි, මළු සහ උර රැගත් මගීහු තොටුපලට එන්නට වූහ. බඩු පටවාගත් කරත්ත කීපයක්ද ඇවිත් තිබේ. පාරුවේ සිට තොටුපළ දක්වා පළල් ලැලි කීපයක් නැවියන් විසින් දමන ලදී. මගීහු පාරුවට ගොඩ වූහ. බඩුද පටවන ලදී. නැව හඬ දුන්නේය. යන්ත්‍ර හඬ දුනි. පමාවූවෝ අත් වනමින්, දූලි නංවමින් දුව එති. කපිතන් ඔවුන් එනතුරු බලා සිටියේ, හාම්පුතාට ඔවුන් නිසා ලැබෙන ආදායම නැති නොකරනු පිණිසය.

Scanned with CamScanner

''පටන් ගනින්!'' යැයි කපිතන් කෑගැසීය.

මගීන්ගෙන් හා බඩුවලින් පිරි පාරුවත් ඇදගෙන කුඩා නැව දුවන්නට විය.

තොටුපළ හිමියා සඳලුතලය වෙත හැරී ආවේය. කොලුවා ගිනිකැට වැනි ගල් අඟුරු කැට ගොඩක් ගෙන සමවාරයට දැමීය. තොටුපළ හිමියා හඳුනන නිලධාරියෙක් ඔහුගේ තේ මේසය ලඟට ආවේය. ඔරුව ඇල්ලීම පිණිස නැව දුවගිය සැටි දුටු හෙතෙම ඒ සිද්ධිය ගැන තොටුපළ හිමියා සමග කතා කරන්නට විය.

''දඟකාරයා.!'' යැයි උණු තේ පිරිසියට පිඹිමින් තොටුපළ හිමියා කිය. ''ඉලන්දාරියා ඉක්මන් කාරයෙක්...''

''දැන් කාලෙ හැදෙන තරුණයො අතර ඔය වගෙ උන් බොහොම ඉන්නව'' යැයි නිලධාරියා කීවේ හැන්දකින් තේ උගුරක් බොමිනි. ''මොකටද මිනිහ එහෙම කළේ. සැර ඇරගන්නද!.. දිය රැල්ලටත් ගිනෙනව උඩ පනින්ට. ඉතින් උඩ පැන්නම තොටුපළේ හැපෙනව. දිය රැල්ලෙ හපන්කම් එතැනින් ඉවරයි!..''

ඔරුව ගැනත්, මගියා ගැනත් ඉක්මනින් අමතක කරදැමූ ඔවුහු නගරයේ පුවත් සහ ඕපාදූප ගැන කතා කළහ. මේ සිද්ධිය ගැන මුළු නගරයම කතා කරන දවසක් එතැයි මොවුන්ගෙන් එකෙක්වත් විශ්වාස නොකළේය.

හිතුවක්කාරී ලෙස ක්‍රියා කිරීම නිසා තොටුපළ හිමියාට විරුද්ධව සමාරාවෙන් පැමිණිල්ලක් කර තිබෙන බව ඔහුට දන්වන ලදී. හේතුව කුමක්දැයි ඔහුට එකවර නොවැටහිණ. බොහෝ අවුල් වියවුල් වලට මූණ පෑ මේ මිනිහා ඒවායින් ගැලවීමෙහි සමත් විය. එහෙත් මෙවැන්නකට ඔහු කිසි දිනෙක මූණ නොපෑවේය. පැමිණිල්ල ඉදිරිපත් කර තිබෙන්නේ නීතිවේදියකු වන උල්යානොව් බවත්, ඔහු සමාරාහි අධිනීතිඥයකු යටතේ වැඩකරන් නෙකු බවත් ඔහුට දන්වන ලදී. තොටුපළ හිමියා ඉදිරියේ තරුණයාගේ මුරණ්ඩු මුහුණත්, ගැඹුරු බැල්ම සහිත උකුසු ඇසුත් දිස්විය. නිලධාරියා එද කී දියරැල්ලේ කතාවද ඔහුට මතක් විය. ''මදෑ කොළා! එයත් එනවා මාව බය කරන්න.'' ඔහු තමාටම කියා ගත්තේය. දුගී දුප්පත් ඔරුකාරයින් නිසා තමාට නඩු කීමට සිදු වෙතැයි ඔහු කිසි දිනෙක විශ්වාස නොකළේය.

ඔහු කළ වරද එතරම් බරපතළ නොවන බවද, හිතුවක්කාරී ලෙස ක්‍රියා කිරීමේ වරදට ඔහු අසුවීමට ඉඩ ඇති බැවින්, දණ්ඩ නීතිය අනුව, එම වරදට දඩ රහිත මසක සිරදඬුවමක් නියම බවද ඔහුට කීහ. ඒ ගැන නුදුවමනා ලෙස කලබල නොවීම පිණිස ඔහුට නීතිවේදියකුගේ උපදෙස් ගන්නා ලෙසද කීහ.

තොටුපළ හිමියාගේ නීතිවේදියා පළපුරුදු ඇත්තෙකි. වෘකයෙකු මෙන් අළු පැහැති හිසකේ ඇත්තෙකි. ගෙවීගිය කබායක් හැඳ සිටි හෙතෙම



Scanned with CamScanner

නිතර දුම්කුඩු උරයි. වරද බරපතල නුවූවද, හිතුවක්කාරී ක්‍රියාවක් කර තිබෙන බව නම් ඔප්පු වී ඇතැයි නීතිවේදියා ඔහුට කීය. "නඩුවෙන් දිනන්ට ලෙහෙසි වෙන්නෙ නැහැ. උත්සාහ කරල බලමු" යැයි හෙතෙම කීය.

අත්තිකාරම් මුදලක් ලබාගත් හෙතෙම නියමිත දිනයේදී එම කාරියෙහි යෙදුණ. තොටුපළ හිමියාට විරුද්ධ පැමිණිල්ල දිස්ත්‍රික්ක උසාවිය දක්වා ගියේය. විත්තිකරුගේ නීතිවේදියා දිස්ත්‍රික්ක නඩුකාරයාගේ කාර්යාලයේදී පැමිණිලිකරු හමුවිය. කුළුපගබවක් පෙන්වමින් පැමිණිලිකරු ඇමතූ හෙතෙම මෙසේ කීවේය:



"යාළුවා, සමාරාවෙ ඉඳලද ආවේ? බොහොම දුර ඉඳල නෙව! එහෙ සිට මෙහෙට හැතැප්ම සියකටත් වැඩියි නෙව... අපේ රටේ මඩගොහොරු සහිත පාරවල් ගැන කියන්න ඕනද!"

දුර ප්‍රමාණය සුළු පටු නොවන බව පිළිගත් පැමිණිලිකරු නීතිවේදියා සමග වැඩි කතාවට නොගියේය. ඉක්මනින්ම දෙදෙනා දිස්ත්‍රික් නඩුකාරයා ඉදිරියට කැඳවන ලදී. ඉදිමුණු ඇස්ඇති තරබාරු දිස්ත්‍රික්ක නඩුකාර තැන පැමිණිල්ල කියවා බලා දෙපක්ෂයටම සමාදාන වන ලෙස යෝජනා කළේය. එම යෝජනාවට කොහෙත්ම කැමති නැති බව දන්වා සිටි පැමිණිලිකරු නීත්‍යානුකූලව විත්තිකරුට දඬුවම් දිය යුතුයැයි කීය. නොපැහැදිලි තැන් කීපයක්ම ඇති බැවින් නඩුව ඇසීම කල්දැමීමට තමා තීරණය කළේයැයි නඩුකාරතැන පසුව දන්වා සිටියේය.

නගරයට ආ නීතිවේදියා තීරණය ගැන තොටුපළ හිමියාට කියා සිටි විට, ඔහු තම යටි රැවුල අත ගාමින් කල්පනාකාරීව මෙසේ අසන්නට විය:

"ඒ ඉලන්දරියා ඔතරම් මහන්සි ගන්නෙ මොන උවමනාවකටද කියල මට කියන්න?! අනේ ඇත්තට, මට නම් ඔය කාරනේ කොහොමටවත් තේරුම් ගන්න බැහැ! මම මහත්තයට ගාස්තුව ගෙවනව. මහත්තය මා වෙනුවෙන් පෙනී හිටිනව. නොමිලේ නම් ඇඟිල්ලක් වත් හොලවන්නෙ නැහැ. එහෙම නෙවිද? ඒ ඉලන්දරියා එයාගෙම මුදලුත් වියදම් කරගෙන, කාලෙත් නාස්ති කරගෙන, දුර ඉඳල එනව. මොකක්ද මේකෙ තේරුම?!"

"තරුණ විසේ ගෙටත් උසේ!" යැයි නීතිවේදියා කීවේ දෙඋර සොලවමිනි: "මිනිහා උද්දච්චයා. එයාගෙ කෙළි ඔතැනින් ඉවරයි. දිස්ත්‍රික් නඩුකාරයා මිනිහට පාඩමක් උගන්වාවි! එයාගෙ පැමිණිල්ල හමස් පෙට්ටියට දැම්මා!"

කිවයුතු දේ මොනවාද යන්න නීතිවේදියා දන්නේය.

ශරත් ඍතුව ගෙවීයාමට ආසන්නය. වොල්ගාව හරහා ශීත සුළං හමන්නටවිය. ගං ඉවුර අසල ගස්වල කොළ වියළි

Scanned with CamScanner

හැලිගොස් අතු පමණක් ඉතිරි විය. සැඩ සුළං සහිත ශීත දවසක දෙපක්ෂයම කැඳවන ලදී.

ඒ වර නීතිවේදියා එනතුරු තොටුපළ හිමියා කලබල වී, නොසන්සුන්ව බලා සිටියේය.

දිස්ත්‍රික් නඩුකාර තැන දෙවැනි වරටත් නඩුව කල්දමූ බව පසුදින තොටපළ හිමියා හමුවූ නීතිවේදියා කිය. ඔහු දැත් පිරිමදිමින් කොක් හඬලමින් සිනාසුනේය: ''කරන්ට ඕන දේ නඩුකාර හාමුදුරුවො දන්නවා. නඩුව කල්දමන්න ආයෙමත් හේතුවක් හොයාගත්ත. ඉලන්දරියා නොඉවසන්නෙක් බව නම් තමුසෙට කියන්ට ඕන''. තරුණයා නිසා නීතිවේදියා ආස්වාදයක් ලැබූ බවක් ඔහු කතා කරන සැටියෙන් පෙනේ. ''මිනිහ උසාවියට ආවෙ හොඳටම තෙතබරි වෙලයි. සමාරාවෙ ඉඳල මෙහෙ එන්ට කොතරම් අමාරුද කියන එක තමුසෙම දන්නව නෙව. ඒ උණාට ඒ යෝදයා ඒක ගණනකටවත් අරගෙන නැහැ. නඩුකාර හාමුදුරුවො සමාදන වන ලෙස යෝජනා කළා. මිනිහ තදින්ම විරුද්ධ වුණා. තෙත ඇඳුම් වේලා ගන්ට එයා උසාවියෙ කාමරයකට රිංගුවා. මිනිහව හෙම්බත් කරවල පරාද කරන්ට ඕන. එතකොට එයාම අතහැර දාවි.''

තොටුපළ හිමියා නිහඬ විය. බාධක රහිත සමතලා පාරක් ඔස්සේ යනවිට හදිසියෙන් පැන නැගි අදෘශ්‍යමාන යකඩ කණුවකට තමාගේ හිස වැදුනාක් මෙන් ඔහුට දැනිණි...

කාලය ගෙවී ගියේය.

වොල්ගා නදිය හිම තට්ටුවකින් වැසී ගොස් දැන් බොහෝ කල්ය. ඒ ගඟ හරහා කිසිකලෙක ඔරු පාරු නොගියාක් මෙනි. තොටුපල අපූරු කතාවල එන හිම මාලිගයකට සමානය.

අළුත් අවුරුද්දට දවස් කීපයකට කලින් නීතිවේදී ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව්ට දිස්ත්‍රික් නඩුකාරතැන ඉදිරියේ පෙනී සිටින ලෙස දන්වන ලදී. උල්යානොව් පවුලේ උදවිය ව්ලදිමීර් සහ තොටුපළ හිමියා අතර හබය ගැන දනිති. ව්ලදිමීර්ගේ මව චෙස්දම් අදිමින් සිටි තම පුතා දෙස තැවුල් සිතින් බලමින් කල්පනා කළාය. නැවත වරක් නොනිඳා දුම්රියෙන්ද, අශ්ව කරත්තයකින්ද, පයින්ද ගමන් කිරීමට තම පුතාට සිදු වී ඇති බව දන්නා අම්මා ඔහු ගමනින් වළක්වා ගෙදර නවත්වා ගැනීමට බැරි බවද දන්නිය. එහෙත් නිහඬව සිටීමට ඇ සිත නොදෙයි.

''පුතේ, තොටුපළේ මුදලාලිට විරුද්ධව දාපු පෙත්සම ඉල්ලා අස්කර ගනින්! ඔය වැඩකට නැති ගමනින් උඹ හෙම්බත් වෙනව විතරයි.''

''අම්මේ, උසාවියට නම් යන්ට ඕනැ'' යැයි පුතා කීවේ මුදු හඬකිනි. දාන් ලෑල්ල දෙස බලා සිටි ඔහු මව දෙසට හැරී කතා කළේය: ''කරන්ට පටන් ගත්ත වැඩේ ඉවරයක් කරන්ට ඕන! මෙවැනි අවස්ථාවක් අතහැර දාම්ම හොඳ නැහැ.

31

Scanned with CamScanner

නඩුව කොච්චර කල් දම්මත් නීතිය අනුව දඬුවම් කිරීමට සිද්ද වෙනවාමයි. තොටුපළ හිමියා ගැන සියදහස් ගනනක් ජනතාවද මුළු නගරයද දනගනු ඇත. එය වටිනා පාඩමක් වනුඇත. ඒ ගොල්ලන්ගෙ උපක්‍රමය පැහැදිලියි. කල්දමනවා. දින නියම කරනවා. වෙන දෙයක් නොකර බැරි හන්ද උන් එහෙම කරනව... හරියට අපේ මේ දම් පොරය වගෙ. ඔන්න යටත් වෙනව...ඒඋපක්‍රම වලින් මාව මට්ටු කරන්න බැහැ. දුම්රිය පිටත්වෙන්නෙ රෑ — පාන්දරින්... රෑ යාමෙට නැගිටින්න සිද්ද වෙලා තියෙනවා.''



*

වසන්තය පැමිණියේය. හිම කැටි කැඩී, බිඳී සෙමින් දිය වියාමට පටන් ගත්තේය. පාවෙන හිම දූපත් අතර පරතෙරය ක්‍රමයෙන් වැඩි විය. හිරු රැස් නිසා හිම වාෂ්ප බවටපෙරළෙත්ම දුමාරයක් නගී. දිය වී යන හිම කැට සහිත දිය කඩිති මත වැටෙන හිරුරැස් රන් පැහැයෙන් බබලයි. ගඟ හරහා මගින් ගෙනයාම ආරම්භ වුවද තවම නිතිපතා බඩුබාහිරාදිය ගෙනයාම පටන් ගෙන නැත. නැව් හූහඬ දෙමින් එකිනෙකා අමතා ගත්හ. තොටුපළ කවමත් අයිස්වලින් වැසිලාය. යකඩ උල් වලින් මිනිස්සු අයිස් කඩති.

ඔරු පාරු කීපයක් මිනිසුන් එගොඩ මෙගොඩ කිරීම පටන්ගති. මස්මරන ලොකු ඔරුද, කුඩා බෝට්ටුද මගින් ගෙනයන්නට විය. හැමතැනම හිරගෙයි වැටී සිටි තොටුපළ හිමියා ගැන කරන කතා ඇසේ.

කබල් තොප්පියක් පැළඳ සිටි ඔරුකාරයාට තමා වීරයෙකැයි සිතේ. මිනිසුන් එගොඩ මෙගොඩ ගෙනයන හැම වාරයකදීම තොටුපළ හිමියා සිරගෙට යැවූ තරුණ මගියා ගැන ඔහු කියයි. ඒ තරුණයා ගැන කී හැම වාරයකදීම ඔහු කතාව රසවත් කිරීමට දෝ අතින් යමක් එකතු කළේය.

''ඒ ඉලන්දරියා අපේ කෙනෙක්-වොල්ගා වැසියෙක්. මිනිහ තරුණයා, ඒ උණාට යෝධයෙක්. කටහඬ සීනු හඬක් වගෙ. ඉදිරියට පදිනවා! යැයි එයා මට කීවා. මගේ දැත් එයාගෙ අණට කීකරු උණා වගෙ ඔරුව පදින්ට පටන් ගත්තා.''

''බලාගෙන හිටපන්! මුදලාලිය හිරේ ඉන්නෙ වැඩි කලක් නෙවි. එළියට ඇවිත් හොඳ පාඩමක් උගන්වාවි.''

ඔරුකාරයා ජයග්‍රාහි ලීලාවෙන් සිනාසුණේය:

''නැහැ, තේ බීලා තොටුපළේ මුදලාලිට උස්මුරුත්තෙ හැදිල! මීට පස්සෙ නම් හිරේ වැටෙන්න කැමති වන එකක් නැහැ! ඒකා අපට අරියාදු කළොත්, අපි ඒකාට... මෙහෙම කියනව...''

ළය පුරා හුස්ම ඉහළට ඇදගත් ඔරුකාරයා බැරෑඩි හඬින් කෑගැසීය:

''ආපහු පස්සට! නැවතියන්!''

එම්. ප්‍රිලෙෂායෙවා

# සීත දවස



එය පසුගිය සියවසේ පිටර්බුර්ගයේදී සිදුවූවකි. සාර් කාලයේදී ලෙනින්ග්‍රාඩය එනමින් හැඳින්විණ. ව්ලදිමිර් ඉල්යිච් උල්යානොව් ඒ දවස්වලදී පිටර්බුර්ග්හි වාසය කළේය.

සීත සෘතුවේ එක් දවසක ව්ලදිමිර් ඉල්යිච් පුටිලව් කම්හලට ආවේය. කම්හලේ නිෂ්පාදන ක්‍රමය සකස් කර තිබෙන සැටි බැලීමට විශේෂඥයෙක් පැමිණෙන බව, ඔහු හඳුනන ඉංජිනේරුවකු විසින් කම්හලේ පාලකයින්ට දන්වන ලදී.

කාර්යාලයේ ලිපිකරුවා ඇතුළුවීමේ අවසර පතක් ලිවේය:

''කම්හල බැලීමට වි. අයි. උල්යානොව් මහතාට අවසර දී ඇතැ'' යි එහි සඳහන් විය. ලිපිකරුවාට ස්තුති කොට ව්ලදිමිර් ඉල්යිච් කම්හල් භූමියට ඇතුළු විය. එහි වැඩපොලවල් හා යන්ත්‍රශාලාද බොහෝ විය. කම්කරුවන්ගේ දක්ෂතාවය දුටු ව්දිමිර් ඉල්යිච් බොහොසෙයින්ම සතුටට පත්විය. කම්හලේ යන්ත්‍ර සූත්‍ර හා ලියවන පට්ටල් ඔහුගේ සිත් ගත්තේය. කම්කරුවන් බොහෝ වෙහෙසට පත්වී සිටින සැටි ඔහු දුටුවේය.

''පහන් එළිය එතරම් ආලෝකමත් නැති නිසා, කම්කරුවින් කාස රෝගින් වගෙ පේනවායැ'' යි බාස් උන්නැහේ කීවේය.

ශීත සමයේදී වේලාසනින් ඇඳිරි වැටේ. වානේ පටිසාදන වැඩපොළ ආලෝක කර තිබුණේ භූමිතෙල් ලාම්පුවලිනි. පියස්සේ සිට පහතට එල්ලෙන දිග ලනු අග සවිකර ඇති කොකුවල මේ ලාම්පු එල්ලා තිබිණි. ව්ලදිමිර් ඉල්යිච් මේ වැඩපොළ නැරඹුවේය. ඇඳිරි පහන් එළිය නිසා එහි වැඩකළ හැම දෙනෙකුම ලෙඩුන් මෙන් පෙනිණ. වැඩපොළේ බාස් උන්නැහේ ව්ලදිමිර් ඉල්යිච් පාලකයෙක්යැයි සිතා හැමදෙයක්ම පෙන්වමින් විස්තර කළේය. හැමදෙයක්ම ඉතා හොඳින් සිදුවූ නමුදු අවසානයේදී ඇතිවූ එක් සිද්ධියක් අසතුටුදායක විය.

''මොකද බොල උඹට වෙලා තියෙන්නේ?'' යැයි පුංචි බස්සෙකුගේ මෙන් වටකුරු ඇස් ඇති තරුණ කම්කරුවකු ඇමතූ බාස් උන්නැහේ සැරවිය.

වානේ පටි සෑදෙන පිල්ලක් අඬුවකින් අල්ලා සවිකළ කම්කරුවා, එක්

අතකින් ලොකු පාන් කැල්ලක් කටේ ඔබාගැනීම නිසා බාස් උන්නැහේ කෝපයට පත්විය.

"මොකද මිනිහෝ?" බාස් උන්නැහේ උස් හඬින් නැවත ප්‍රශ්න කළේය.

"බඩගිනි උණා, ඉතින් පාන් කැල්ලක් හොයා ගත්තා" යැයි පිළිතුරු දුන් කම්කරුවා සිනාසුනේය.

"විරිත්තන්න එපා. උඹ කා එක්කද කතා කරන්නෙ?"

කම්කරුවාද මඳක් කෝප විය.



"බාස් උන්නැහේ යන දිහාක යනව..."

බාස් උන්නැහේද කෝප විය:

"ගරුසරු නැතිව කතා කළාට උඹට දඩ ගසනවා."

බාස් උන්නැහේ සෙමින් පියවර නගයි. ව්ලදිමීර් ඉල්යිච්ද ඔහු පිටුපසින් යයි. බාස් උන්නැහේ කුඩා ඇඳිරි කාමරයකට වැද කම්කරුවාගේ වැටුප් පොත ගෙන ඔහුට දඩ ගැසූ බව ලියන්ට සූදනම් විය.

"ඔය පොත දෙන්න බලන්ට" ව්ලදිමීර් ඉල්යිච් ඉල්ලා සිටියේය.

වානේ පටි සාදන කම්හලේ සහ අනිකුත් වැඩපළවල වැඩ-චරියාව කියවා බැලූ ඔහු පුදුමයට පත්විය. "වැඩ කිරිමේ වේලාව දවසකට පැය 12 කි. විවේක කාලයක් නැත. දවල් ආහාර සඳහා වැඩපලවල් වලින් පිටතට යාමට අවසර නැත."

"කෑම නොකා කොහොමද වැඩ කරන්නෙ?" ව්ලදිමීර් ඉල්යිච් ඇසීය.

"ගෙවල්වලින් කෑම අරගෙන එනව."

"ඒ උණාට ඒ මිනිහා පාන් කැල්ලක් කෑව හන්ද තමුසෙ බැණ වැදුණා නෙවද?"

"ඒකා මැරවරයෙක්" යැයි බාස් උන්නැහේ මුමුණුවේය. එහෙත් කම්හල බැලීමට පැමිණ සිටින මහත්මයා දඩ ගැසීමට විරුද්ධ බව ඔහුට අවබෝධ විය. පුදුම මහත්මයෙක්!

වැඩපළ තුළවූ යකඩ බාල්කයකට ගසන ලදින් ඉන්, ටාං, ටාං, ටාං, යන හඬක් පිට විය. එවිටම කම්හල් භූමියේ නලා කීපයක් හඬ නැඟුවේය. "වැඩ නතර කරපල්ලා! දවල් වැඩ වාරය ඉවරයි!"

"ඒයි, ජ්යොදර්! උඹට දඩ ගහන්නේ නැහැ. වැඩපළ බලන්න ආ මහත්තයට පින් දීපන් යැ" යි කම්කරුවා ඇමතූ බාස් උන්නැහෙ කීය.

කම්කරුවා හැරී නොබැලුවේය.

"කළගුණ නොදත් කාලකණ්ණියා, මහත්තුරුන්ට ස්තුති කරපන්" යැයි කෝපයට පත් බාස් උන්නැහේ කෑගැසීය.

Scanned with CamScanner

‘‘බඩගිනි උණාම මහන්සි උණාම ආචාරශීලි වෙන්ට වෙලාවක් නැහැ’’ යි ව්ලදිමිර් ඉල්යිච් සිනහවෙමින් කීය.

සිය ගණනක් කම්කරුවන් සමග ඔහුද කම්හල් බිමෙන් පිට විය. පැයකට පසු අගොරෝඩ්නි පටුමාවතේ ගෙදරක පුටිලව් කම්හලේ කම්කරුවෝ රැස්වූහ. ඔවුන්ගේ මේ රැස්වීම අමතා කතා කිරීමට ව්ලදිමිර් ඉල්යිච්ට ආරාධනා කර තිබිණි. ඔහු පැමිණෙන තුරු කම්කරුවෝ බලා සිටියාහ. ඔවුන් ලෙනින් දැන සිටියේ ෆ්යොදර් පෙත්රෝවිච් නමිනි.

සවස් වත්ම ශීත තවත් දැඩි විය. තද කුණාටුවක්ද හමන්නට විය. ව්ලදිමිර් ඉල්යිච් හිම කබායේ කර පටිය උස්සා ගෙන ගමන් කරයි.

‘‘දවල් කෑමත් නැතිව පැය දෙළහක් වැඩ කරන්ට ඕන, ඒ මදිවට දඩ ගහනවා-ජීවිතයක හැටි!’’ ව්ලදිමිර් ඉල්යිච් තමාටම කියා ගත්තේය.

රැස්වන තැනටආ විට, හඳුණන කම්කරුවෙක් විසින් ඔහු පිළිගන්නා ලදී.

‘‘වැඩපොළ බලන්නට ආ මහත්තයට පිං දිපන්! එයා නිසා අද බේරුනට හෙට දඩ කෑමට සිද්ද වෙනවමැ’’ යි උපහාසත්මක ලෙස කියන සැටි ඔහුට ඇසිණ.

‘‘අද සිදුවූ දේ ගැන සාකච්ඡා කරනවා’’ ව්ලදිමිර් ඉල්යිච් සිතිය.

‘‘කතාව ඇත්ත. හෙට දඩ ගහවී. ඒ ගැන සැක නැහැ’’ යි කම්කරුවන් රැස්ව සිටි කාමරයට ඇතුළු වෙමින් ව්ලදිමිර් ඉල්යිච් පැවසීය.

මේසයක් වටා කම්කරුවන් පහළොස් දෙනෙක් පමණ වාඩිවී උන්හ. බසු පැටවකුගේ මෙන් ඇස් ඇති තරුණ කම්කරු ෆ්යොදර් ඔවුන් අමතා කතා කරයි.

‘‘ආයුබෝවන් සහෝදරවරුනි, ආයුබෝවන් ෆ්යොදර්, රහස් දේශපාලන වැඩ කරන විට මාත් පෙනී හිටින්නේ ෆ්යොදර් පෙත්රෝවිච් යන නමින්’’ යැයි ව්ලදිමිර් ඉල්යිච් කීවේය.

‘‘අනේ සහෝදරවරුනි, වැඩපොළ බලන්ට ආ මහත්තයා තමා මේ ඇවිල්ල ඉන්නේ’’ යැයි ෆ්යොදර් කීය.

කාමරය තුළ නිහඬතාවය පැතිර ගියේය. සමහරු බුම්මා ගත්හ. අධෛර්යයට පත් වූයේ ව්ලදිමිර් ඉල්යිච් නොවේ. ඔහු වඩාත් උනන්දු විය.

‘‘සහෝදරවරු සුපරික්ෂාවෙන් සිටීම ඉතාම හොඳ’’ යැයි කී ව්ලදිමිර් ඉල්යිච් මෙසේද පැවසීය: ‘‘පියොදර් සහෝදරයා, කාරණය නියම ලෙසම තේරුම් අරගෙන. කම්හල බලන්ට ආ මිනිහා ගියා. හාම් පුතාලයි, බාස්ලයි එතැන ඉන්නව. ඉස්සර කළා වගේම දිගටම දඩ ගහවී.’’

තරුණ කම්කරු පියොදර් බංකුව මත වාඩිවී, ඇසිපිය නොහෙළා පියොදර් පෙත්රෝවිච් නමින් පෙනී සිටින ව්ලදිමිර් ඉල්යිච් දෙස බලයි. ඔහු දිගටම



Scanned with CamScanner

කතා කරගෙන යයි. කම්කරුවෝ මහත් ඕනෑකමකින් ඔහුට සවන් දෙති. ඔහු ඔවුන්ගේ අනාගතය ගැන කතා කළේය.

''අප සටන් කළ යුත්තේ කොහොමද? සියලුම කම්කරුවො එකට සංවිධාන වෙලා හිටියොත් විතරයි'' ඔහු කීයේය.

''කතාව ඇත්ත! ධනපතියන්ට විරුද්ධව තනි පංගලේට සටන් කරන්න බැහැ'' මෙසේ සිතුවේ පියොදර්ය. එම හැඟීම නිසා තම සිත තුළ අමුතු ධෛර්යයක් හා ප්‍රීතියක් ඇතිවූ බව ඔහුට හැඟේ. ව්ලදිමීර් ඉල්යිච් දිගටම කතා කරගෙන යයි, කම්කරුවෝ ඔහුගේ මතයට එකඟ වූහ. රෑ බෝවන තෙක් මෙසේ සාකච්ඡා කළ ඔවුහු සාර්ගේ හා ධනපතින්ගේ පාලනයට එදිරිව වැඩ පිළිවෙලක් ගැන කතා කළහ.

රැස්වීම හමාර වූ පසු පියොදර් කතිකයා වෙත ඇවිත් මෙසේ කීය:

''මම සහෝදරයව ගිහිං ඇරලන්නම්!'' තරුණ කම්කරුවාගේ ඇස් ප්‍රීතිය නිසා බැබලිණ. ලෙනින්ගේ පාඩම ඔහු සිත් ගත්තේය.

එවිට, ව්ලදිමීර් ඉල්යිච් එම අදහසට නොකැමැති විය.

''මාව ඇරලන්ට එන්ට එපා. අපි විප්ලවවාදියො. මහ පාරෙදි විප්ලවවාදින් පස්සෙ පොලිස් ඔත්තුකාරයො ආවොත්? එතකොට අපි දෙන්නම අහු වෙවි. එක් එක්කෙනා වෙන වෙනම යන්ට ඕන. සැබෑ දෙශපාලන වැඩ කරන කොට, පියොදර් සහෝදරය, ඊට එකඟව නීති පිළිපදින්න ඕන. සැබෑ වැඩකරනවා යැයි කියන්නෙ මොකක්ද? ඒක තමා රහසෙ වැඩකිරීම. පොලිස් ඔත්තුකාරයින්ගෙන්, පොලිස් ඒජන්තලාගෙන්, ධනපතින්ගෙන්, බාස්ලාගෙන් බේරිලා, අපේ සංවිධාන ගැන උන්ට නොදැනෙන්ට වැඩකිරීම. තේරුණාද?''

පොඩි දරුවෙකුට යමක් අවබෝධ කර දෙන්නාක් මෙන්, ඔහු පියොදර් වෙත දබරැල්ල දිගු කළේය. එහි හාස්‍යය මෙන්ම බැරෑරුම් බවක්ද තිබිණ.

කම්කරුවෝ එකා බැගින් පිට වූහ. මෙසේ දෙතුන් දෙනෙක් පිටව ගිය පසු ව්ලදිමීර් ඉල්යිච් ගෙදරින් එළියට ආවේය. විප්ලවවාදී සටන් ගැන කම්කරුවන්ට කියා දීම පිණිස සැබෑ දෙශපාලන කටයුතුවල යෙදුණු, ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව්, එද පියොදර් පෙත්රෝවිච් නමින් පෙනී සිටියේය.

සීතල තවත් දැඩි විය. කම්කරුවන් ඉතා ඕනෑකමකින් තමන්ට සවන් දීම නිසා ඔහු ප්‍රීති විය. දඩ ගැසීම ගැනද, ධනපති විරෝධී සටන් ගැනද කම්කරුවන්ට විස්තර කිරීම සඳහා පත්‍රිකාවක් ලිවිය යුතු යැයි ඔහු තීරණය කළේය.

එම පත්‍රිකාව ගැන සිතමින් ඔහු ගමන් කරයි. සිතුවිලි රැසක්ම ගලා ඒම නිසා ඔහු ප්‍රබෝධමත් විය, එවිටම වාගේ ව්ලදිමීර් ඉල්යිච්ගේ නෙත් යමෙකු කෙරෙහි රැඳිණ... අහසේ සුදු පැහැති වළාකුළු පායයි. ලා රන් පැහැයෙන් යුත් සඳ

Scanned with CamScanner

අගොරෝද්නි පටු මාවතේ ඇති හැම පොප්ලර් ගසක්ම සහ බංකුවක්ම ආලෝක කළාක් මෙනි. පටු මාවත හිස්ය... පටුමගේ එහා පැත්තෙන් මිනිහෙක් ගමන් කරන සැටි ව්ලදිමීර් ඉල්යීච් දුටුවේය. ගෙවල්වලට හා වැටවල්වලට මුවා වෙමින් යන ඒ මිනිහා කවරෙක්ද? ඔහු පොලිස් ඔත්තු කාරයෙකු බව දැනගත් ව්ලදිමීර් ඉල්යීච් ඒ බව නොඅඟවා සන්සුන්ව ගමන් කළේය. එහෙත් ඔහු ගමන් වේගය වැඩි කළේය. පිටර්ගොප් මහ මාවතේ ගමන් කරන අස්රියක හඬ ඇසෙයි. තවත් හයියෙන් පා නැගූ ව්ලදිමීර් ඉල්යීච් ඒ අස් රියට ගොඩ විය. එහෙත් පොලිස් ඔත්තු කාරයාටද රියට ඇතුළු වීමට පුළුවන් විය. ව්ලිදිමීර් ඉල්යීච් ඇස් කොණින් ඔහු දෙස බැලුවේය: කළු කණ්ණාඩි කුට්ටමක් පැළඳි සිටි ඔහුගේ උඩු රැවුලද කළුය. රියෙන් පිටවීමට ඇති දෙර අසල ආසනයක වාඩි වූ ව්ලදිමීර් ඉල්යීච්, හිම කබායේ කරපටිය උස්සා ගෙන කුමක් කළ යුතුදැයි කල්පනා කළේය: පොලිස් ඔත්තුකාරයාගෙන් බේරී යන්නේ කොහොමද! පදිංචි නිවස දක්වා බොහෝ දුර යා යුතුය. ව්ලදිමීර් ඉල්යීච් නිදිකිරා වැටෙන බවක් ඇඟවිය. හිස පාත් කර ගත්තේය. අස්රිය ඒ අත මේ අත පැද්දෙයි. අස්රියේ ජනේල වීදුරු මත හිම වැටී, ඒවා අයිස් බවට පත් වී තිබෙන නිසා විනිවිද නොපෙනේ. මේ නිසා කොතෙක් දුර ගමන් කර ඇත්දැයි දැනගැනීමට බැරිය. තමා වාඩි වී සිටින ආසනයට පිටුපස දෙවැනි බංකුවෙහි ඔත්තුකාරයා වාඩි වී සිටින බව දන්නා ව්ලදිමීර් ඉල්යීච් පැන යන්නේ කෙසේදැයි කල්පනා කරයි.

''ගෙදරට නැවතුම් පලවල් තුනකට මෙහා බහින්න ඕන. නොවරදවාම බහින්න ඕන තැන විතරක් වරද්දගන්ට නරකයි!'' ව්ලදිමීර් ඉල්යීච් සිතුවේය. නිදිමත ගතියක් පාමින් ජනේලයට හිස ලංකර ගත් ඔහු කටින් ජනේල වීදුරුවට පිඹිමින් හිම දිය කර හැරියේය. කොන්දෙස්තරට කතා කොට ඊළඟ නැවතුම් පළ ගැන අසත හැක. එහෙත් එසේ කළහොත්, කටහඬ අනුව තමා කවුද යන්න ඔත්තුකාරයා දැනගනු ඇත. ඔත්තුකාරයාට තමා හැඳිනගැනීමට ඉඩ නොතැබිය යුතුය!

හිම දිය කර හැරීම නිසා ජනේල වීදුරුවේ විනිවිද පෙනෙන ලපයක් ඇති කිරීමට ව්ලදිමීර් ඉල්යීච්ට පුළුවන් විය. රියෙන් පිටවිය යුතු ස්ථානය වැඩි ඈත නොවේයැයි දැනගැනීමට මේ හිම රහිත වීදුරු ලපය ආධාර විය. යා යුත්තේ වැඩිදුර නොවේ. මීළඟ නැවතුම් පොළ නොවේ... එහා නැවතුම් පොළ. අස්රිය නැවතිණ.

''කවුද බහින්නේ?'' කොන්දෙස්තර ඇසිය.

කිසිවකු පිළිතුරු නොදුන්හ. ව්ලදිමීර් ඉල්යීච්ද නිහඬව සිටී. අස්රිය ගමන පටන් ගත්තා පමණි. නැගිට සිටි ව්ලදිමීර් ඉල්යීච් සැණෙකින් එළියට පැන



3—2332

Scanned with CamScanner

ගත්තේය. හනිකට දුව ගොස් ගෙවත්තකට ඇතුළු විය. එහි වැටට මුවාවූ ඔහු මොහොතකට හැරී බැලුවේය. මීට පෙර ඒ ගෙවත්ත දැක තිබෙන ව්ලදිමීර් ඉල්යිච් එය මතක තබා ගත්තේය. අස්රිය නැවතිණ. මහ පාරට බැසගත් ඔත්තුකාරයා වට පිට බලමින් ඔහු සොයයි: මහ පාරේ එකෙකු වත් පෙනෙන්ට නැත. අසල ගෙවල්වල ජනේලවලින් පහන් එළියක්වත් නොපෙනේ. අස්රිය නැවත ගමන් කළේය.

38 ගෙවත්ත මැදින් ගොස් එහා පාරට වැදී, කරදර රහිතව ව්ලදිමීර් ඉල්යිච් ගෙදර ආවේය. ගෙහිමි කාන්තාව ඒ වේලාවේ නිදා සිටියාය. ව්ලදිමීර් ඉල්යිච් ශබ්ද නොකර දෙපයේ ඇඟිලි තුඩුවලින් කුස්සියට ඇතුළු වී කේතලය ලිප තබා, තේ සාදගෙන, පාන් කෑල්ලක් හපමින් තේ බීවේය. ඔහුට හොඳටම බඩගිනි දැනිණ.

''ඉතින් සහෝදරවරුනි, අපි දැන් නැවතුනේ කොතැනද?'' යි උණු තේ බොමින්ම ව්ලදිමීර් ඉල්යිච් තමාගෙන්ම ඇසීය. ''කොහොමද වැඩේ. පොලිස් ඔත්තුකාරයාගේ ඇස්වලට වැලි ගහපු හැටි!'' ඔහු සිනාසුනේය. ''අපි නැවතුනේ එතැනයි...''

ව්ලදිමීර් ඉල්යිච් ජනේලය දෙස බැලුවේය. හිමෙන් වැසී තිබුණු ජනේල විදුරුවල අපූරු මල්වල සේයාවන් මැවී තිබෙන සැටි ඔහු දුටුවේය.

''අපට කවුරුත් පිහිට වෙන්නේ නැහැ. අපේ නිදහස අපිම ලබාගන්න ඕන'' යැයි සුදෝසුදු හිම කැටි දෙස බලමින් ව්ලදිමීර් ඉල්යිච් සිතුවේය.

Scanned with CamScanner

# මඟුල් මුදු



වසන්තය පැමිණියේය. සුෂෙන්ස්කොයෙ ගම* වටා ඇති කළු පැහැති පොළව ලා දළු කොළ සහිත පැලැටිවලින් වැසිණ. තැනින් තැන කපා දමන ලද ගස් සහිත කැලෑ පෙදෙසද නැවත නව සිරියක් පෑය. සීත ඍතුවේදී හිමෙන් වැසී, පසුව මඩ ගොහොරු බවට පත්වූ පාරවල්ද වියලී ගොසිනි.

එළිපත්තේ බංකුවක වාඩි වී සිටි ඔස්කාර්, ගෙහිමි මහළු කාන්තාව ගෙත්තම් කරන සැටි බලා ඉන්නේ බුම්මා ගෙනය. ඇගේ අත් විසින් ගෙත්තම් කටු වේගයෙන් එහා මෙහා යැවෙයි.

''මොකද පුතේ උඹ අසනීපෙන්ද?'' යි ඈ ප්‍රශ්න කළාය.

ඔස්කාර් පිළිතුරු වශයෙන් කිසිවක් නොකීවේය. තමා අසනීපයෙන්දැයි නොදන්නා ඔස්කාර් පිළිතුරු දෙන්නේ කොහොමද? ඔහුගේ අසනීපය ගැන ව්ලදිමීර් ඉල්යිච් පැයක්ම ප්‍රශ්න ඇසීය: කොහෙද රිදෙන්නෙ, මොකද අමාරුව? හරිහැටි යමක් කීමට ඔස්කාර්ට බැරිය ''ඇඟට පණ නැහැ'' යැයි ඔහු කීය. එහෙත් ඔහු විසි දෙහැවිරිදි තරුණයෙකි. ''අත්දෙක ඇඟට බරක් වගෙ. නිදා ගන්නකොට අත්දෙක ලොකු අවහිරයක් වගෙ, ගල්ගැහිල. ගමන් කරන කොට අත්දෙක නිකම් බොරු අත්දෙකක් වගෙ වැනෙනව. වාඩි වෙන කොට දැත් කොහොම තියාගන්ටද කියල දන්නෙ නැහැ'' යි ඔහු කීය.

''මිනිහෙකුට අත්දෙක ලොකු අවහිරයක් නෙවැ'' යි ඔස්කාර් කියේ දුක් ගැනවිල්ලක් මෙනි.

ව්ලදිමීර් ඉල්යිච් හඬ නගා සිනාසුණේය:

''අපි තමුසෙව සනීප කරනව, ඔස්කාර් ඇලෙක්සාන්ද්‍රවිච්, ඇත්ත වශයෙන්ම සනීප කරනව.''

ව්ලදිමීර් ඉල්යිච් පුදුමාකාර පුද්ගලයෙක් — හැමදම ප්‍රීතියෙන්, සයිබීරියාවට පිටුවහල් කර සිටියදිත් කිසි ගණනකට ගන්නේ නැහැ, පොත් පත් බොහොම කියවනව, ලියනව, දඩයමේ යනව, චෙස් – දම් අදින ගමන්

---

* සුෂෙන්ස්කොයෙ, 1897 සිට 1900 දක්වා වි.අයි.ලෙනින් පිටුවහල් කර සිටියේ සයිබීරියාවේ මේ ගමටය.

Scanned with CamScanner

අමාරු ගැටළු විසඳනව. හැමදම හවසට ඔහු ඔස්කාර්ට දේශපාලන ප්‍රශ්න ගැන කියාදෙයි.

අල්ලපු ගෙදර ල්යෝන්කා පාසල් පොත් සහිත උරයත් රැගෙන දුව ආවේ, පාරේ දූවිලි නංවමිනි. ඔහු පාවහන් හැඳ නොසිටියේය.

ඔස්කාර්ට කර්මාන්තයක් උගැන්වීම සඳහා ඔහු භාරදීමට නගරයට ගෙන යන විට ඔහුගේ වයස ල්යෝන්කාගේ වයසට වඩා වැඩි වූයේ යම්තමිනි. කම්කරුවෙක් වූ තම පියා සමග ගමන් ගත් ඔස්කාර් නෙව්ස්කි මහ මාවතේ මහ සාප්පුවක් අසල නැවතුණි. එහි ප්‍රදර්ශන ජනේලය රත් පැහැති සේද රෙද්දකින් සරසා තිබිණි. වටිනා මැණික් සහිත රන් මාලද, අලංකාර වළලුද, රන් මුදු සහ මුතු අල්ලා සාදන ලද නොයෙකුත් ආභරණද දුටු පුංචි ඔස්කාර් මවිතයට පත් විය. සමහර මැණික් ගල් මී පැණි පාටට හුරුය. තවත් සමහර මැණික් ගල් අරුණෝදයේ පිනි බිඳු සිහි කරවයි... ''ඔන්න ඔය වගේ ආභරණ හදන්ට ඉගෙන ගනින්'' යැයි පියා ඔස්කාර්ට කීවේය. ''මම උඹව රිදී රත්රන් වැඩ කරන ආචාරියට භාර දෙනව.'' ඔස්කාර් හොඳටම ප්‍රීතියට පත්විය. විලූද පුටුවක වාඩි වී, විලූද තොප්පියක් පැළඳ ගෙන සුරංගනා කතාවල එන මැණික් ආභරණ හදන සැටි සිතින් මවාගත් පුංචි ඔස්කාර් සතුටු විය.

ඔස්කාර්ට හඳුනා ගැනීමට ලැබුණු පළමුවැනි උපකරණය මුදු සෑදීමට ගන්නා වානේ රිටය. ආභරණ සාදන ටයිපර් නැමැත්තා එම වානේ රිටෙන් කී වරක් ඔස්කාර්ගේ හිසට ගැසුවේද යන්න ගණන් කළ නොහැකි විය. ටයිපර් ඔහු කිසි දිනෙක නමින් ඇමතුවේ නැත. ඔහු ඔස්කාර් ඇමතුවේ ''මෙහෙ වර බොල, කොල්ලො!'' යනුවෙනි.

ටයිපර්ගේ ළමයින් බලා ගැනීම, ඔහුට කෑම බීම ගෙනඒම සඳහා නිතර කඩේට දිවීම, ආදිය කළ ඔස්කාර් ඒ අතරතුර විවේක කාලයේදී ආභරණ සෑදීම ඉගෙන ගත්තේය. මෙසේ අවුරුදු හතරක් වැඩ කළ ඔස්කාර්, ටයිපර්ගෙන් වෙන් විය. දහසය හැවිරිදි ගැටවරයෙකු වූ ඔහු එතැන් සිට පුටිලව් කම්හලට ගියේය.

ආභරණකරු ඔස්කාර් ලියවන පට්ටල් කරුවෙකු විය. හැමදෙනාගේම හිංසාවට භාජන වූ මේ ගැටවරයා නිර්භය විප්ලවවාදියෙකු විය. කෙට්ටු සිරුරකින් හෙබි ඔහු පසුව ශක්ති සම්පන්න කම්කරුවකු විය. කම්කරුවන්ට එදිරිව කම්හල හිමියාට ඔත්තු සපයන්නෙකු වරක් ඔස්කාර්ගේ අතින් හොඳ ගුටි පූජාවක් ලැබුවේය. ඔස්කාර්ට විරුද්ධව නඩු පවරා ඔහු තුන් අවුරුද්දකට සයිබීරියාවට පිටුවහල් කරන ලදී.

... වාඩි වී හුන් තැනින් නැගී සිටි, ඔස්කාර් තම කාමරයට ඇතුළු වී ඇඳෙහි වැතිර, දෑත් හිස මත තබාගෙන, කල්පනා කරන්ට විය. ඔහුට නිදිබර ගතියක් දැනිණ.



Scanned with CamScanner

කරත්තයක රෝද ගැටෙන හඬක්ද කොල්ලන්ගේ කෑ කෝ ගැසීම්ද නිසා ඔහු අවදි විය. සිර්යානොව්ලාගේ ගෙදර අසල කරත්තයක් නවතා තිබිණි. නාගරික පන්නයට හැඳ පැළඳගත්, හිස්වැසුම් සහිත කාන්තාවන් දෙදෙනෙක් රිය තුළ වාඩි වී සිටින සැටි ඔහු දුටුවේය. ල්යෝන්කාත් ඇතුළු කොල්ලො රංචුවක් කරත්තය වට කර ගෙන සිටිති.

''ව්ලදිමිර් ඉල්යිච් බඳින්ට යන තරුණිය නෙවද අර ඇවිත් ඉන්නේ!'' යැයි තමාටම කියා ගත් ඔස්කාර් ගෙයින් එළියට එක පිම්මට දුවගොස් රිය අසලටම ආවේය.



''ඔහෙගෙ නම නදේෂ්ද කොන්ස්තන්තිනොව්නාද? ආයුබෝවන්!'' යැයි සිහින් දේහයක් ඇති තරුණිය ඇමතූ ඔස්කාර් කීවේය. ඈ අළු පැහැති හැට්ටයක් ඇඳ සිටියාය.

තරුණිය නිර්භය ලෙස ඔහු දෙස බැලුවාය. ඇගේ ඇස් ලා නිල් පාටය. ඈ තම මුහුණ මඳ සිනාවකින් සරසා ගෙන කතා කළාය:

''මා හිතන හැටියට ඔහෙ ඔස්කාර් ඇලෙක්සාන්ද්‍රවිච් වෙන්ට ඕන. ඔහෙ අසනීපයෙන් කියල දැනගන්ට ලැබුණ. දැන් නම් ලෙඩ පාටක් පෙනෙන්ට නැහැ නෙව! ආයුබොවන්!'' ඈ ඔහුට අතදී ආචාර කළාය. ''හඳුනා ගන්න, මේ මගේ අම්මා එලිසවේටා වසිලෙව්නා. ව්ලදිමිර් ඉල්යිච් අපව හම්බ වෙන්ට නාවෙ ඇයි? එයා අසනීපෙන්ද?'' යි ඕ ඇසුවාය.

''ව්ලදිමිර් ඉල්යිච් දඩයමේ ගියා'' යැයි එකවර පිළිතුරු දුන් ල්යෝන්කා දූලි නංවමින් පනියි.

අනිත් ළමයි ද ඔහුගේ කීම එක හඬින් අනුමත කළහ.

''ව්ලදිමිර් ඉල්යිච් ඔය ගොල්ල එනතුරු බොහොම උවමනාවෙන් බලා හිටිය. අද ඕනවටම වගෙ දඩයමේ ගියා'' යැයි ඔස්කාර් කීවේ ඇගේ අසතුට තුනී කරන්නාක් මෙනි.

''ඉතින් අපි මොනවද කරන්නේ? ආපහු යන්ට සිද්ද වේද?'' යි ඈ ඇසුවේ මඳ සිනා පාමිනි.

''එහෙම ආපහු යන්ට එපා. දඩයමේ ගිහිං හැන්දෑ වෙනකොට ගෙදර ඒවි'' තීරණාත්මක ලෙස මෙසේ කීවේ ල්යෝන්කාය.

ඔස්කාර් සහ කොලු රංචුව කාන්තාවන්ගේ බඩු බාහිරාදිය උස්සා ගෙට ගෙන යමින් ඔවුන්ට උදව් කළහ.

හවස ජනේලයට තට්ටුකළ ල්යෝන්කා ව්ල්දිමිර් ඉල්යිච් ඔස්කාර්ට එන්ට කියන බව ඔහුට කීය. ඔස්කාර් මූණ සෝද හිස පිරාගෙන, පිරිසුදු ඇඳුම් හැඳ ගත්තේය.

සිර්යානොව්ලාගේ ගෙතුළින් ප්‍රීතිමත් හඬක් ඇසෙයි. ප්‍රමෝදයට පත්ව

සිටි ව්ලදිමිර් ඉල්යිච් නදේෂ්ද කොන්ස්තන්තිනොව්නාට කෝප්ප පීරිසි ආදිය තැබීමට උදව් කළේය. ගෙනා තෑගි ඉක්මනින් බෙදා දෙන ලෙසත්, ගෙනා පොත් සියල්ල නොසඟවා පෙන්වන ලෙසත් ඔහු ඉල්ලා සිටියේය.

''අපොයි බැහැ'' යැයි හිස වනමින් කී නදේෂ්ද කොන්ස්තන්තිනොව්නා තරහ වූ සැටියක් පෙන්වූවද, ඇගේ බැල්ම මුදු මොළොක් විය. ''අප පිළිගන්න නොහිටි නිසා තෑගි දීම කල් දමනවා. අපව පිළිඅරගෙන අපට උදව් කළේ ල්යෝන්කායි, ඔස්කාර් ඇලෙක්සාන්ද්‍රොව්චුයි, ඒ හන්ද ඒ දෙන්නට තෑගි දෙනවා'' යැයි කී නදේෂ්ද කෘෘප්ස්කයා, ලස්සන පින්තූර සහිත පොතක් ල්යෝන්කාට තෑගි කළාය. ''මෙන්න ඔස්කාර්ගෙ ලෙඩේට බෙහෙත්'' යැයි කී ඇ පෙට්ටියක් පෙන්නුවාය.

''ඔව්, ඔව්, අගේ ඇති බෙහෙත්'' මෙසේ කී ව්ලදිමිර් ඉල්යිච් ඇගේ කීම අනුමත කළේය.

අස්ථිර ගතියකින් පෙට්ටිය දෙසට ලංවූ ඔස්කාර් ලනු කපා එහි පියන හැර ඇතුළත තිබූ දේ පරීක්ෂා කරන්නට විය. පෙට්ටියේ තිබූ බඩු නිල්පාට තෙල් කඩදාසියකින් ඔතා ඇත. කඩදාසිය දිග හැරියේය. තමා දකින දේ විශ්වාස කිරීමට පවා බැරි බව ඔස්කාර්ට සිතේ. ආභරණ සෑදීමට අවශ්‍ය කුඩා කිණිහිරයක් එහි විය. මෙසේ කඩදාසි දිග හරින විට, ආභරණ සෑදීමට උවමනා උපකරණ සියල්ලම ගෙනැවිත් තිබෙන බව ඔහු දුටුවේය. අන්තිමට ඔහු අතට ගත්තේ මුදු සෑදීමට ගන්නා වානේ රිටය.

''ඔන්න තමුසෙ වෛර කරන රිට! මෙහෙ දෙන්න, ඕක බලන්න!'' යැයි ව්ලදිමිර් ඉල්යිච් ඉල්ලා සිටියේය.

''දුෂ්ටයෙකුගෙ අතේ තියන විට වෛර කළ බව ඇත්ත'' යැයි ඔස්කාර් කීය. ඔහුට අපහසුවක් දැනිණ.

කෙට්ටු කාන්තාවන් දෙදෙනෙක් හැතැප්ම හාරදස් පන්සියයක් පමණ දුර ගෙවා ඇවිත් තිබෙනුයේ බරැති මේ පෙට්ටියත් සමඟය. මාරුවීමේ නැවතුම් පළවල් විශාල ගණනකි. සමහර තැන්වලදී කිසිවෙක් උදව් වුණා විය හැකිය, එහෙත් බොහෝ තැන්වලදී මේ දෙදෙනාම ඒ බරැති පෙට්ටිය උස්සා ගෙන ගියා විය යුතුය.

''ඔහෙ තමා වැරදිකාරයා'' යැයි ව්ලදිමිර් ඉල්යිච් වෙත හැරී දෙස් කී ඔස්කාර් මෙසේද පැවසීය: ''මම ඒව ඉල්ලා හිටියෙ නෑ, ඇත්ත වශයෙන්ම ඉල්ලා හිටියෙ නෑ, ඒවා ලබාගැනීමේ සිහිනයකින් පහු උණා විතරයි.''

ගමේ ලී කැටයම් කපන පට්ටලයෙන් ඔහුට වැඩක් නොවිය. එහෙත් මේ පළාතේ පොහොසතුන්ට ආභරණ සාද දීමට නම් විශාල හැකියාවක් තිබුණද උපකරණ නොමැතිවීම නිසා එය නොකළ හැකි විය. ඔස්කාර් මේ ගැන වරක්

Scanned with CamScanner

ව්ලදිමිර් ඉල්යිච්ට කිවේය. ඔස්කාර්ට එය අමතක වුවද, ව්ලදිමිර් ඉල්යිච්ට අමතක නොවීය.

"ඔහෙගෙ අසනීපය ගැන ව්ලදිමිර් ඉල්යිච් කොතරම් දිග ලියුමක් ලිව්වදැයි කිවොත්, අපි ලැහැස්ති උණා ලියවන පට්ටලයක්ම කරගහ ගෙන එන්න" යැයි සිනාසෙමින් එලිසවෙටා වසිලෙව්නා කී විට, ඈ දෙස බැලූ ව්ලදිමිර් ඉල්යිච් නිහඬ වන ලෙස ඇට සංඥා කළේය.

පසු දා උදේ ඔස්කාර් ලොකු උත්සවයකට සූදනම් වන්නාක් මෙන් කාමරය සෝදන්නට විය, මේසය ශුද්ධ කොට ඒ මත ඉටි රෙද්දක් දැම්මේය. ආභරණ සාදන උපකරණ මේසය මත තැබීය.

පළමුවෙන්ම සෑදිය යුත්තේ කුමක්දැයි ඔහු දනී.

සාක්කුවට අත යවා කොපෙක් පහේ කාසියක් ගත් ඔස්කාර් ඒ දෙස බැලීය. දෙහිස් රාජාලි රූපය ඔහුට පෙනිණ. පොලිස් කාරයින්ගේ තොප්පිවල ඇති රාජාලි රූපය — රුසියානු පොලිසියේ ලාංඡනය ඔහුට මතක් විය. රාජාලියා එක් පාදයකින් සෙංකෝලයක් රැගෙන සිටී. එය ඔහුට ආභරණ ශිල්පී ටයිපර්ගේ වානේ රිට මතක් කළේය.

කොපෙක් පහේ කාසිය කිණිහිරය මත තැබූ ඔස්කාර් මිටියෙන් එය තලන්ට වූයේ කෝපයෙන් මෙනි. කාසිය කුජි විය. ඉන් පසු කෝවයට දමා එය උණු කළේය. දැන් එය රසදිය මෙනි. උවමනා හැඩයට නවාගත් පසු එය වතුර බඳුනකට දැමූ ඔස්කාර්ට දැන් අවට ලෝකය අමතක වී ගොසිනි. එය පිරකින් ගා, මැද, වානේ රිට ට ඔබා මුදුවක් බවට හැරවීය. දැන් එය, රත් පැහැති රනින් කළ මුදුවකි. දහවල් වන විට කෑමට එනලෙස ගෙහිමි කාන්තාව ඔහුට අඬගැසූ නමුදු ඔහු අතක් වනා විවේකයක් නැති බව ඇඟවීය. දැන් ඔහුට ඉදිරියේ වැඩකි. ඔහු තම දෑත් දෙස බැලීය. අතේ කණ්ඩරාවන් තරමක් ඉදිමී තිබුණද, සැහැල්ලු බවක් දැනෙයි. පණැති අත් අමතර අවයව හැටියට නොව තමාගේම බව දැනේ. ඇඟිලි නමා මිට මෙලවීය, නැවත ඇඟිලි දිගහැර බැලීය. ප්‍රීතියකි!

පින්ලන්ත බසින් ගීයක් ගයමින් දිගටම වැඩ කළේය. සවස් වන විට දෙවැනි මුදුවද සාද නිම කළේය. ලස්සන මල්වැලක් පිරිසුදු කඩදසියක ඇඳ එය ගිනිපෙට්ටියක අලවා, මුදු දෙක ඒ තුළ බහාලීය.

හිරු එළිය වැටෙනවාත් සමග නැගී සිටි ඔස්කාර් —ෂා ගංඉවුරට ගොස් ඩැන්ඩෙලියන්, බටර් කප් සහ ලිලී මල් එකතු කළේය. ඉන් ලස්සන මල් පොකුරක් සාදගැනීමට ඔහුට පුළුවන් විය. ගිනි පෙට්ටිය තුළින් මුදු එළියට ගෙන බැලීය. හිරු රැස් වැටීම නිසා මුදු දීප්තමත්ව බැබලෙන්ට විය. එතරම් අපූරු මුදු ඔහු, ඔහුගේ ජීවිතයේදී කිසි දිනෙක දැක නැත.

7*



Scanned with CamScanner

ඔහු සෙමින්, සෙමින් සිර්යානොව්ලාගේ ගෙදරට ආවේය. පසුව ගිස්වැස්ම අතට ගෙන දුවන්නට විය. හැකිතරම ඉක්මනින්, තම තෑග්ග ව්ලදිමිර් ඉල්යිච්ට හා නදේෂ්ද කොන්ස්තන්තිනොව්නාට පිළිගැන්වීමට ඔහුට උවමනා විය.

පිරිසුදු ජලයෙන් පිරි වැව් ගැනද, සුවඳ විහිදෙන මල්වලින් පිරි කැලෑ ගැනද, අවංක මිතුරන් ඇති මිනිසාගේ ප්‍රීතිය ගැනද ඔස්කාර් ගියක් ගැයීය. ඔහුගේ එම ගීය සයිබිරියානු සුළං විසින් ඈත ස්ටෙප්ස් තණබිම් දක්වා ගෙනයන ලදී.



*

එද ඔස්කාර් සෑදූ මුදු අද වි. අයි. ලෙනින්ගේ මධ්‍යම කෞතුකාගාරයේ දැකිය හැක. කාලය විසින් ඒවායේ දීප්තිය නැතිකර දැමුවද, තවමත් ඒවා අලංකාරය. හද පත්ලෙන් පැන නැගි හැඟීමෙන් හා වැඩක් නැති නිසා කාන්සියෙන් පෙළී සිටි අත්වලින් නිමකළ ඒ මුදු සුන්දරය. එය මිනිස් ආදරයේ තිළිණයකි. ඒවා මිත්‍රත්වයේ මුදුය.

**සෙ. වොස්ක්‍රෙසේන්ස්කයා**

## ආලෝකය



තුන් දවසකට පෙර පටන්ගත් වැස්ස තවමත් නොකඩවා වසී. පාත්තිවල මල් පොළවට නැමී බර වී තිබුණු අතර සුළං පහරට අසුව ගසින් බිමට වැටුණු ගැට ඇපල් ගෙඩි වතුර පිරි වළවල්වල පාවෙයි. කුරුල්ලෝද මේ ධාරානිපාතයට අසුව තෙත බරි වූහ. ගඟේ ජලය පිරිගොස් වේලි පුපුරා උතුරා යන්නට ළංවිය.

දැව දඬුවලින් සාදන ලද කුඩා ගෙයක් මේ මොරසූරන වැස්සට හා නොසන්සුන්තාවයකට අසුවූ සිරකරුවෙක් මෙනි. හිරු රැසින් නැවී ගියජූලි මාසයේ උෟෂ්ණ දවස්වලදී මේ ගෙදර විසූ අය ප්‍රීතියෙන් හා ප්‍රමෝදයෙන් සිටියහ. උල්යානොව් පවුලේ සියළු දෙනාම සම හිතවත් අමුත්තා — ව්ලදිමීර් ඉල්යිච් එනතුරු බලා සිටියහ.

... තමාගේ දූ දරුවන් සියලු දෙනාම විපත්වලින් බේරී සිටිතැයි මීට දහ දවසකට පෙර උල්යානොව් මැතිණිය සිතුවාය. ව්ලදිමීර් ඉල්යිච් සයිබීරියාවේ තුන් අවුරුද්දක් පිටුවහලේ සිට ආවේය. ඔහුට, කර්මාන්තමය නගරවල පදිංචි වීමට සාර් ආණ්ඩුව තහනම් කළ නිසා ඔහු ප්ස්කොව් නගරයේ පදිංචි විය. එතැන සිට විප්ලවවාදී පිටර්බූර්ගයේ කම්කරුවන් සමග සබඳකම් ඇති කර ගැනීමට ඔහුට හැකිය. පැරණි රුසියානු නගරයේ පදිංචි වූ ව්ලදිමීර් ඉල්යිච් රුසියාවේ හැම නගරයකම ඇති කම්කරු කවයන් හා විප්ලවවාදීන් සමග සබඳකම් ඇති කර ගනිමින්, සමස්ත රුසියානු විප්ලවවාදී පුවත්පතක් පළ කිරීම සඳහා සූදනම් විය.

තම මව හා සහෝදර සහෝදරියන් හමුවීමට පදෝල්ස්ක් නගරයට ජූනි මස මුලදී එන බවට හෙතෙම පොරොන්දු විය. එහෙත් සිත් තැවුල් ගෙනදෙන ප්‍රවෘත්තියක් ලැබිණ. පිටර්බූර්ගයේදී ව්ලදිමීර් ඉල්යිච් සිරභාරයට ගෙන ඇත. දෙසතියක් තිස්සේ ඔහු හිරගෙදර ලගියි. ඔහුගේ මව — මරියා ඇලෙක්සාන්ද්‍රව්නා ඒ පුවත අසා, දුක උහුලාගැනීමට බැරිව රෝගාතුර වූවාය. ඒ කුඩා ගෙතුළ ඇඳිරි බවක්ද, අපහසු ගතියක්ද දැනුණෙන් හැම දෙනම සිත් තැවුලෙන් පසුවූහ. ද්මීත්‍රි ඉල්යිච්ගේ දෙපා ළඟ වැතිර සිටින ගෙදර බල්ලා — ත්‍රිද්කාද කණක් සොලවමින්, හාම්පුතා දෙස බලයි. මා ගැන සැලකීමට තරම් වෙලාවක් නොවෙයි මේ යැයි උගේ බුද්ධිමත් ඇස් කියන්නාක් මෙනි.

Scanned with CamScanner

මරියා ඇලෙක්සාන්ද්‍රව්නාට ප්‍රතිකාර කිරීමට දෙස්තර පැමිණ සිටී.

ආන්නා ඉල්යිනිච්නා, මරියා ඉල්යිනිච්නා සහ ද්මීත්‍රි ඉල්යිච් කෑම ගන්නා කාමරයේ වාඩි වී දෙස්තර ලෙඩා පරීක්ෂා කරනතුරු බලා සිටිති. සිරභාරයට ගෙන සිටින තම සොහොයුරාට ආධාර වන්නේ කෙසේදැයි පහත් හඬින් සාකච්ඡා කරති. ද්මීත්‍රි ඉල්යිච් වෙද පොතක් පෙරළමින් අම්මාට වෙදකම් කිරීමට උත්සාහ ගනී. ව්ලදිමීර් ඉල්යිච් සිරභාරයට ගැනීම නිසා වැදුනේ බලවත් පහරකි, විප්ලවවාදී පුවත්පතක් ආරම්භ කිරීමේ සැළැස්මද විනාශයට පත් විය. එහෙත් මේ සොහොයුරියන් දෙදෙනාට සහ සොහොයුරාට කළ හැකි උදව්වක් නැත. මරියා ඉල්යිනිච්නා සහ ද්මීත්‍රි ඉල්යිච් සිරගෙදරින් නිදහස් වූයේ මේ නොබෝද්දය. ආන්නා ඉල්යිනිච්නා සහ මාක් තිමොපේයෙවිච් පොලිස් නිරීක්ෂණයට භාජන වී සිටිති...

නොකඩවා වැසි වසී. ජනේල වීදුරු දිගේ ගලා බසින වැහි බිංදු රැලි ගැසී දුනුමෙන් සැදෙයි. කිකිළියක් අත් අඩු ගසා කෙකරගායි. ඉමක් නැතිව වසින වැසි නතර වන තෙක්, තමාගේ අත් අඩු යටට වී උණුසුම් වන ලෙස ඈ තම කුකුළු පැටවුන්ට කියන්නාක් මෙනි.

රෝගී මරියා ඇලෙක්සාන්ද්‍රව්නා පරීක්ෂා කර බැලූ දෙස්තර ලෙවිට්ස්කි කාමරයෙන් පිටවෙත්ම, ඇගේ දරුවන් තිදෙනාම නැගී සිටියහ.

''දෙස්තර මහත්මයා, ලෙඩාට කොහොමද? බෙහෙත් දෙන්ට ඕනද?'' යි ආන්නා ඉල්යිනිච්නා ඇසුවාය.

''කලබල වෙන්ට එපා, කලබල වෙන්ට එපා. පිරිසුදු වාතය, එළිමහනේ ඇවිදීම, ප්‍රීතිදායක ආරංචිවලින් සිත සතුටු කරවීම — ඒවා තමා බෙහෙත්'' යැයි දෙස්තර කීවේය.

''අම්මාගේ හෘද වස්තුවේ රෝගයක් තියෙනව. කොතරම් දුක් විඳිමට ඇට සිද්ද වෙලා තියනවද'' යි මරියා ඉල්යිනිච්නා කිවාය.

''අම්මාට වයස හැටපහක් නෙව, ඒකත් සුළු පටු වයසක් නොවේ'' යයි ද්මීත්‍රි ඉල්යිච් පැවසීය.

දෙස්තර යටි රැවුළ අත ගාමින්, ද්මීත්‍රි ඉල්යිච් අත ඇති වෙද පොත දෙස ඕනෑකමින් බැලුවේය.

''යාළුවා! මවගේ හදවතට වෙදකම් කිරීමට වෙද පොත් බලන්ට එපා. මවකගේ හදවතක ඇති බලගතු ශක්තියේ රහස තවම හෙළි වී නැහැ. ඇගේ සිත සතුටු කරවීම තමා ඉතාම හොඳ බෙහෙත. ලෙඩාට නැගිටින්ට මම නියම කළා. හෙට ආපසු ලෙඩා බැලීමට එනවා. ආයුබෝවන්!'' යැයි කී දෙස්තර ගමනට සැරසිණ.

දෙස්තර මහතා හැරලීම පිණිස ඔහු සමග ද්මීත්‍රි ඉල්යිච් ගියේය. දෙස්තර



Scanned with CamScanner

ලෙවිට්ස්කි ඔහුගේ හොඳම මිතුරෙකි. කලකට පෙර පිටුවහල් දඬුවම ගත කිරීමට ද්මීත්‍රි ඉල්යිච් පදෝල්ස්ක් නගරයට ආවේය. විප්ලවවාදී කටයුතුවලට සහභාගි වීම නිසා වෛද්‍ය විදුහලෙන් අස් කරනු ලැබූ මේ දේශපාලන අපරාධ කාරයාට රැකියාවක් දීමට එකද දෙස්තර කෙනෙකු වත් අකමැති විය.එහෙත් දෙස්තර ලෙවිට්ස්කි ඔහු තමාගේ සහකාරයකු ලෙස පත් කර ගත්තේය. එතැන් සිට ලෙවිට්ස්කි උල්යානොව් පවුලේ කිට්ටු මිතුරෙක් බවට පත් විය.

දූවරුන් මව බැලීමට ඇගේ කාමරය දෙසට යත්ම, මව දොර හැරගෙන එළියට ආවාය. ඈ හිස පිරා, හැඳ පැළඳගෙන සිටියාය.

''අම්මේ! සැප සනීප කොහොමද?''

''වරදක් නැහැ'' යැයි මරියා ඇලෙක්සාන්ද්‍රව්නා කීවාය. ප්‍රීතියෙන් සිටින සැටියක් පෙන්වීමට මව උත්සාහ දැරුවද, ඇගේ බෙල්ලේ මස් පිඩු නැටෙන සැටි පෙනේ. ''මම අදම පීටර්බුර්ග් යනවා'' යැයි ඈ කීවාය.

''අම්මා අසනීපයෙන් නෙව, යන්ට එපා!'' යැයි දූවරුන් දෙදෙනා එකවර කීහ.

''මෙතනට වෙලා නිකම් ඉන්න මට බැහැ. හිරගෙට වැටී සිටින පුතාගේ — වලෝද්යාගේ දුක තුනී කරන්නට මට හැකි වේවි. පොඩි පුතේ!'' යැයි ද්මීත්‍රි ඉල්යිච් ඇමතූ ඈ මෙසේද කීවාය: ''දුම්රිය පළට ගිහින් මට තුන්වැනි පන්තියෙ ටිකට් එකක් ගේන්න. උණුහුමට ඇඳ ගන්න. කකුල් තෙමා ගන්ට එපා. මේ වැස්ස හින්ද ලෙඩ රෝග හැදෙනවා.''

මවගේ ගමන වැළැක්වීමට තමන්ට බැරි බව තිදෙනාම දනිති. ඈ දෙවැනි පංතියේ ගමන් කළ යුතුයැයි ඔව්හු කියා සිටියහ.

''බැහැ, බැහැ, සල්ලි ප්‍රවේසම් කර ගන්න ඕන. වලෝද්යාට අද්වකාත් කෙනෙක් අල්ලන්ට සිදු වේවි. ආන්යා, මගෙ ගමන් ඇඳුම පිළියෙල කරන්න. මම පුංචි දූත් එක්ක ගමන් බෑගය පිළියෙල කරන්නම්'' යැයි අම්මා කීවාය.

වැහි කබාය හැඳගත් ද්මීත්‍රි ඉල්යිච් බල්ලාගේ කරපටියට දම්වැල අමුනා ඌත් සමග දුම්රිය පළට ගියේය. මවගේ ගමන් ඇඳුම් අල්මාරියෙන් එළියට ගත් ආන්නා ඉල්යිනිච්නා අළුත් කරපටියක් අල්ලා මසන්නට වූවාය.

''දයාබර අම්මාගේ යුද ඇඳුම'' යැයි සෙනෙහස බර මුදු හැඟීමෙකින් ඈ තමාටම කියා ගත්තාය.

ඒ ඇඳුම මසා ඇත්තේ උත්සවවලට සහභාගි වීමට නොවේ. එහෙත් පොලිස් කාරියාලවලට යාමටත්, ප්‍රාදේශිය ආණ්ඩුකාරයින් හමුවීමටත්ය. විප්ලවවාදී ව්‍යාපාරයට සහභාගි වීම නිසා තම දූ පුතුන් විපත්තිවලට මූණ පාන හැම අවස්ථාවකදීම අම්මා ඉවසිලිමත්ව අසීරු, අමාරු සටනක් කරන්නීය. ඇගේ හදවත කොතරම් වේගයෙන් සැළෙන්නේද යන්න දන්නේ ඒ ගමන්



Scanned with CamScanner

ඇඳුම පමණකි. ''ඔහෙගෙ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබෙනවා'' යැයි කෲර ලෙස නිලධාරීන් කියන විට ඇගේ හදවත ගල් ගැසෙයි. මේ අම්මා අමතා කොතරම් ඇනුම් පද කියන්නට ඇතිද: ''ඔහෙගෙ වැඩිමල් පුතාව එල්ලා මැරුවා.'' ඒවායින් ඇගේ හදවත තුවාල වුණද, ඇ පසු නොබැස්සාය. බලාපොරොත්තු රහිත නොවූවාය. නැවත පෑන අතට ගෙන නිලධාරීන්ට පෙත්සම් ලිවාය. ''ගරු කටයුතු උතුමාණෙනි! ඔබගෙන් යටහත් ලෙස ඉල්ලා සිටිමි''යි ඒ කාලයේ පෙත්සම් ලියන බසින් ලිවාය. පොලිසියේ ලේඛනාගාරවල එවැනි පෙත්සම් කීයක් තිබේද? දුක් කඳුළු සහිත අත් ලේන්සු ගමන් කබායේ යට සාක්කුවට දමා සඟවාගෙන ඇ ගෙදර පැමිණි වාර කොපමණද!



*

ජනේලය මත නොකඩවා වැටෙන වැහි බිංදු ශබ්ද නගයි. කිකිළිය කෙකර ගායි. වැසි සුළඟට අසුවන අතුවල කොළ ජනේලවලට වැදෙමින් 'සර', 'සර' හඬක් පිට කරයි.

ඈත එන රියක සිනු හඬක් ඇසේ. ආලින්දයේ හා කාමර තුළ ප්‍රීතිය පළ වෙන හඬකි:

''අම්මේ! වලෝද්යා ඇවිල්ලා! අම්මේ!''

''අනේ පුතේ! අනේ පුතේ!' යැයි කියමින් දුව එන මව, ''උඹ සනීපෙන්ද? උඹව නිදහස් කළාද?'' යි අසන්නීය.

''හොඳටම සනීපෙන්, නිදහසේ ඒවගේම බොහොම සන්තෝෂෙන්'' යැයි කී ව්ලදිමීර් ඉල්යිච් තෙත් වැහි කබාය ගලවා දමා මව වැළඳ ගනී.

''දුම්රිය පළට යන කොට මට හම්බවුණා! කවුදෝ ඉක්මනින් ගමන් කරනව. වැස්සත් බලන්නෙ නැතුව මඩවලවල් හරහා යන්නෙ කවුද කියල බැලුවා! මේ පදෝල්ස්ක්වල කවුද ඔයතරම් ඉක්මනින් දුවන්නෙ? බැලින්නම් වලෝද්යා!'' යැයි ද්මිත්‍රි ඉල්යිච් ප්‍රීතියෙන් කිය.

''අනේ අයියේ! කියන්නකො මොනවද සිද්ද වුණේ කියල.'' මරියා ඉල්යිනිච්නා තම අයියා ඇමතීය.

''දුවේ, මේ ඇඳුම නමල අල්මාරියෙ තියන්න. දැන් ඔය ඇඳුම මට උවමනා නැහැ'' යි මරියා ඇලෙක්සාන්ද්‍රව්නා කිවාය.

''හොඳමයි, අම්මේ!'' යැයි ආන්නා ඉල්යිනිච්නා කියේ මහත් සතුටකිනි. කළු පැහැති ඒ ගමන් ඇඳුම තම ප්‍රීතිමත් ජීවිතයට නැවතත් වැද කණගාටුව ගෙන දේවි යැයි බියවූවාක් මෙන්, ඇය ඇඳුම අල්මාරිය තුළට දමා තදින් දොර වැසුවාය.

සොහොයුරියන් දෙදෙනා කෑම මේසය පිළියෙල කරති. ද්මිත්‍රි ඉල්යිච්

සමවාරයට කටින් පිඹියි. ප්‍රිද්කා දිගැති රතු දිව එළියට දමා ගෙන, හිස සලමින් කාමරයක් පාසා යයි. ඌ ව්ලදිමිර් ඉල්යිච් ළඟට විත් සුරතල් පායි, කඳ සහ හිස පයට හැපෙන සේ ඔහු ළඟින් යයි. තම අමුත්තා මූණ පෑ අවදනම ඌ තේරුම් ගත්තාක් මෙනි. ප්‍රිද්කා 'සැන් බර්නාර්' වර්ගයට අයත් බල්ලෙකි. ස්වාමියා සහ ඔහුගේ මිතුරන්ට සහායවීම උගේ ජන්ම ගතියකි. හිම කඳු මුදුනක හිමෙන් යටවූවකුට ආධාර දීමට ඌ සමත්ය. වැහි කුණාටු හා හිම කුණාටු නොතකා රතු කුරුසය සහිත බෙහෙත් මල්ලක් කරෙන් ගන්නා ඌ දිවයමින් තුවාල ලැබූවන්ට ආධාර වෙයි. තම මිතුරා වන මිනිසාට ආධාර කිරීම් වස් ඌ සිය ජීවිතය පවා නොතකා නිතර උපකාර කරයි. 49

''උඹ හරි හොඳ ප්‍රිද්කා'' යැයි කියමින් ඌගේ හිස අත ගාන ව්ලදිමිර් ඉල්යිච් බල්ලා දෙස බලා මෙසේ කියයි: ''පොලිස්කාරයො මෙහෙ එනවද කියා ඉව අල්ලා බලපන්. එනවනම් අපට දන්වාපන්.''

කී දේ තමාට තේරුම් ගියාක් මෙන්, ප්‍රිද්කාද දෙර ළඟ වැතිර දෙකන් ඔසවා ගෙන බලා සිටී.

නැවත මේ කුඩා ගෙදර උදවිය සිනාසෙති, ප්‍රීති වෙති.

තම මව ඉතා ප්‍රවේසමෙන් සෝපාව මත වාඩි කරවූ ව්ලදිමිර් ඉල්යිච් ඈ අසලින් වාඩි විය.

''ගෙදර ඉන්න කොට හරිම ප්‍රීතියක් දැනෙනව. හිතට සැපයි! ඉර පායන දවසට මෙතන හරිම ලස්සනයි නෙවද.''

''වහින දවස්වලට වුණත් මේ ගෙදර සැපදායකයි. බලපන්, වැහි අඳුරත් තුනී වෙලා!'' යැයි මරියා ඇලෙක්සාන්ද්‍රව්නා ඔහුට කියයි.

''කියපන් මල්ලියෙ උඹ කොහොමද හිරෙන් නිදහස් උනෙ, මක්කටද හිරගෙට වැටුනෙ!'' ආන්නා ඉල්යිනිච්නා කියා සිටියාය.

මරියා ඇලෙක්සාන්ද්‍රව්නා මේසය අසලට ගොස් තේ වත්කරයි.

''පීටර්බුර්ගයට ආව හැටියෙම මාව පොලිස්කාරයො අල්ල ගත්ත. ඉස්සෙල්ලම මට ඕන උණා සාක්කු හිස් කරන්න. දඩු පොලිස්කාරයො දෙන්නෙක් මගෙ දෑත් අල්ලා ගෙන පිටිපස්සට නැමුවා. තව එකෙක් මා දිහා බලාගෙන ඉන්නව මම මොනව හරි ගිලිව්ද කියල. මගේ සාක්කු පුරා සල්ලි රූබල් දෙදහක් විතර. ප්ලෙඛානොව්ට* ලොකු දිග ලියුමකුත්. පුවත්පත සංවිධානය කළ යුතු සැලැස්ම, රහසේ දෙශපාලන වැඩ කරන අයගෙ ඇඩ්රැස්. රහස් සංඥා. මේවා ඔක්කොම මගෙ සාක්කු වල.''

---

* ගියොර්ගි ප්ලෙඛානොව් (1856—1918) රුසියානු විප්ලවවාදියෙකි. මාක්ස්වාදී න්‍යායාචාර්ය වරයෙකි.



Scanned with CamScanner

''මම නම් බයටම මැරේවි!'' යැයි මරියා ඉල්යිනිච්නා කීවාය.

දබර'ඟිල්ල දිගු කරමින් කතා කළ ව්ලදිමීර් ඉල්යිච් මෙසේ පැවසීය: ''ඒ උණාට, ඒ ඇඩ්රැස් සහ රහස් සංඥා සියල්ල කිරිවලිනුයි, දෙහි අම්ලවලිනුයි ලියා තිබුණෙ. කුච්තාන්සි ආදි කොළවල මුද්‍රිත අකුරු පේලි අතරින් ලියා තිබුනෙ. පොලිස්කාරයො ඒකොළ ඉස්තිරික්කෙන් මැදල බලාවිද නැද්ද කියල මම සිර කාමරේ ඉඳගෙන කල්පනා කළා.''

''ඉතින් ඊට පස්සෙ මොකද උනේ?'' මරියා ඉල්යිනිච්නා නොඉවසිලිවත් ලෙස ප්‍රශ්න කළාය.

''දවස් දහයකට පස්සෙ මාව ගෙන්නල නිලධාරින් කිව, පිටර්බුර්ගය ඇතුළු තවත් නගර හැටකට ඇතුළු වීමට මට අවසර නැතැයි කියල. ඒ ගැන මට තදින් දැනුම් දෙන බවකිව. ප්ස්කොව් නගරයෙන් එළියට යන්ටත් එපා කිව. මගේ ලියකියවිලි, කුච්තාන්සි, සල්ලි ඔක්කොම මට ආපහු බාර දුන්නා. මා දුටු දේ මටම විශ්වාස කරන්න බැරි වුණා. 'සාර් ආණ්ඩුවෙ ගොන්කමක හැටි' කියල මට හිතුනා. එවලෙම මම බොහොම විනීත අන්දමින් දෙමාපියන් බැලීමට පදෝල්ස්ක් යන්න අවසර ඉල්ලුවා.''

ව්ලදිමීර් ඉල්යිච්ට තනිව ඒමට ඉඩ නොදුන් පොලීසිය ඔහු සමග පොලිස් භටයෙකු එවීය. ඒ පොලිස් භටයා පදෝල්ස්කිහි පොලිස් කාරියාලයට ඔහු ඉදිරිපත් කළ යුතු විය.

පදෝල්ස්ක්හිදී තවත් අභාග්‍යයකට මූණ පෑමට සිදු විය. පොලිස් පතියා ව්ලදිමීර් ඉල්යිච්ගේ පාස්පෝට් බල පත්‍රය ඉල්ලා ගෙන, එහි කොළ පෙරළා බලන බවක් අඟවා, එය තම ලාච්චුවට දමා වසා ගත්තේය. ''තමුසෙට පිටරටවල් ගානෙ රස්තියාදු වීමට ඕන නැහැ. පාස්පෝට් බලපත්‍රය මා ළඟ තිබුණාවෙ.'' යැයි ඔහු කීවේය.

''එවිට මට හොඳටම තරහ ආවා. අපේ පුවත්පත මුද්‍රණය කරන සැලැස්ම සියල්ලම ඒ වංචාකාර තක්කඩියා, එයාගෙ කාලකණ්ණි මේස ලාච්චුවට දමල වහපු බව මට තේරුණ. මම කෝපයෙන් මහ හඬින් කෑගැහුව. තමුසෙගෙ මේ නීති විරෝධි ක්‍රියාවට විරුද්ධව උසස් නිළධාරීන්ට පැමිණිලි කරනවයි කියල මම කෑගැහුව. මම කොතරම් හයියෙන් කෑගැහුවදැයි කීවොත්, පොලිස් නාකියා බය උණා. මම පිටත්වෙන්ට හදන කොට මිනිහ විගහට ලාච්චුව හැරලා පාස්පෝට් එක මගෙ අතට දීල කියනව, එයාට විරුද්ධව පැමිණිලි කරන්ට එපායි කියල.''

අන්තිම වචන කීපය ව්ලදිමීර් ඉල්යිච් කීවේ මහ හඬින් සිනාසෙමිනි. හාන්සි පුටුවේ පිටි ඇන්දට හේත්තු වී දැසින් කඳුළු බිංදු පනින තෙක් ඔහු සිනාසුණේය.

මරියා ඉල්යිනිච්නාද ඔහුට නොදෙවැනි සේ සිනාසුණාය.

Scanned with CamScanner

''ඉතින් පුතාට පාස්පෝට් බලපත්‍රය ලැබුණා ද?'' යි ඔහුගේ මව — මරියා ඇලෙක්සාන්ද්‍රව්නා ප්‍රශ්න කරන්නී තම බලාපොරොත්තු සුන්බව සඟවා ගත්තිය.

''ඔව්, අම්මේ! මට ජර්මනියට යන්ට සිද්ද වෙලා තියනවා'' යැයි කී ව්ලදිමිර් ඉල්යිච් නැගිට දෙර අගුළු දමා පහත් හඬින් මෙසේ කීවේය: ''අපි ලොකු වැඩක් කිරීමට තීරණය කළා. පුවත්පතක් මුද්‍රණය කරන්ට යනව.''

තම හදපත්ලෙන් පැන නැගි සැළැස්මයන් ගැන ව්ලදිමිර් ඉල්යිච් මහත් ආසාවෙන් කියන්නට විය. කම්කරුවෝ සටන් සඳහා නැගී සිටිති. සාර්වාදයට එදිරිව ස්වාධීනත්වය සඳහා කරන සටන මෙහෙයවන්ට ප්‍රධාන මණ්ඩලයක් උවමනාය. දසලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ට හා ගොවින්ට, ඔවුන්ගේ කාර්යයන් ගැන කියා දෙන, ක්‍රියාකිරීම සඳහා එකම වැඩපිළිවෙලක් ඉදිරිපත් කරන, විප්ලවවාදි සමස්ත රුසියානු පුවත්පතක් අවශ්‍යයය. පිටුවහලේ සිටින කාලයේදී ඔහු සහ ඔහුගේ සගයෝ පුවත්පතක් බිහි කිරීමේ සැළැස්ම ගැන තීරණයක් ගත්හ. එය රුසියාව තුළ මුද්‍රණය කළ නොහැකිය, මන්දයත්, පොලිස් මර්දනය තිබෙන බැවිනි. ඒ නිසා පිටරටක එය මුද්‍රණය කිරීමට තීරණය කළහ. නීති විරෝධි ලෙස රහසේ එම පුවත්පත රුසියාවට ගෙනැවිත්, විශ්වාස කටයුතු මිනිසුන් මගින් එය කම්කරුවන් අතර බෙදා හරිනු ඇත.

රිගා, ස්මොලෙන්ස්ක්, පිටර්බුර්ග්, මොස්කව් ආදී නගරවලට ගිය ව්ලදිමිර් ඉල්යිච් එහිදී සහෝදරයින් හමුවී, සබඳකම් ඇති කරගන්නා විධිය, වාර්තා එවිය යුතු ආකාරය ආදිය ගැන සාකච්ඡා කොට සංවිධාන ඇති කළේය.

''පත්‍රයේ නම මොකක්ද?'' යි ආන්නා ඉල්යිනිච්නා ඇසුවාය.

''ඉස්ක්‍රා'' (ගිනි පුපුර). ''ගිනි පුපුරුවලින් මහා ගින්නක් ඇවිල යාවි. මතකද?''

''ඔව්, ඔව්, පුෂ්කින්ට* පිළිතුරු යැවූ දෙසැම්බර්වාදියෝ** එහෙම කීවා.'' යැයි මරියා ඉල්යිනිච්නා කීවාය.

තම ළමයින් දෙස බලා සිටින අම්මා, ඔවුන් වැදගත් කටයුත්තක් ගැන සිතා ඇති බව වටහා ගත්තාය.

''සුබ මොහොතින්, සුබ මොහොතින්!'' යැයි ඈ තොල මතුළාය.

''ආන්නා-අක්කේ! අක්කට සිද්ද වේවි මට පස්සෙ ජර්මනියට එන්න. පත්තරේ අච්චු ගැහීම සංවිධාන කිරීමේදී අක්කගෙ උදව් ඕන. පිටුවහල් කාලය

---

* ඇලෙක්සාන්දර් පුෂ්කින් (1799—1837) රුසියානු මහා කවියාය.

** දෙසැම්බරවාදියෝ — සාර්ගේ පාලනයට එදිරිව නැගී සිටි වංශවත් විප්ලවවාදි හුය. 1825 දෙසැම්බර් මාසයේදී ඔවුහු ආයුධ ගත් කැරැල්ලක් ඇති කළහ.





Scanned with CamScanner

ඉවර උනාම නදේෂ්ද ජර්මනියට ඇවිල්ල අපට උදව් කරාවි.'' යැයි ව්ලදිමීර් ඉල්යිච් කිය.

''ඔන්න, ආන්නාට එයාගෙ සාහිත්‍යමය දස්සකම් පෙන්වන්න වාරයක් ඇවිල්ල'', මෙසේ කිවේ අම්මාය.

ආන්නා ඉල්යිනිච්නා ප්‍රීතියෙන් පිනා ගියාය. සාහිත්‍යමය කටයුතුවලට ඇල්මක් නිතර දක්වූ ඈ ළමයින් සඳහා පොත් හා කතන්දර පොත් ලිවාය, ඉතාලි, ඉංග්‍රීසි, ජර්මන් ආදි භාෂාවලින් රුසියන් බසට පොත් පරිවර්තනය කළාය. දුන් කම්කරුවන් සඳහා පුවත්පතක් පිළියෙල කිරීමේ වැදගත් කාර්යයට ඈ ද සහභාගිවීමට යන්නිය.



''වොල්ගාවට, සමාරාවට, නිෂ්නියට යන්නට ඇත්නම්, සීස්රාන්වලට ගිහිල්ල ඊට පස්සෙ නදේෂ්ද හමුවීමට යන්නත් ආසයි,'' මෙසේ කිවේ ව්ලදිමීර් ඉල්යිච්ය.

''කාන්සියෙන්ද ?'' යි අනුකම්පා සහගත ලෙස අම්මා ඇසුවාය.

''ඇත්තටම ඔව්'' යැයි අවංකව පිළිතුරු දුන් ලෙනින් කිය. ''අපේ පළමු වැනි වෙන්වීම මෙයයි. එහෙ විප්ලවවාදීන් සමග සම්බන්ධකම් ඇති කර ගෙන තියනව මගෙ බිරිඳ — නදේෂ්ද. මං හරි කැමතියි ඒ ගොල්ලන්ව හමුවෙලා කතා කරන්න, හැමතැනම ගිනිමැල ඇති කරන්න. කම්කරුවො සටන්වලට කැමැත්තෙන් ඉදිරිපත් වෙනව. ගිනි ඇවිලිය හැකි ද්‍රව්‍ය රුසියාවෙ වැඩි වෙමින් පවතිනව. අපේ ''ගිනි පුපුර'' නමැති පත්තරය ඒ ගිනි අවුලා දමාවි. එයින් මුළු රුසියාවම පුරා ආලෝකයක් ඇතිවේවි.''

''එහාට ගිහින් එන්ට පොලිසියෙන් අවසර ඉල්ලමුද ?'' යි අම්මා යෝජනා කළාය.

''අවසර එක වරක් නොවෙයි, ඉල්ලුවේ, එහි යාම සම්පූර්ණයෙන්ම තහනම් කළා.''

අම්මාඃ ගැඹුරු කල්පනාවක යෙදෙන්ට වූවාය.

''යමු, මම පුතාගෙ කාමරය පෙන්වන්නම්.''

'බර'-'බර' හඬ නංගවමින් දෙදෙනාම තරප්පු පේළිය දිගේ උඩු මහලට නැංගාහ.

''හරියට සිම්බීර්ස්ක්වල ගෙදර වගේ!'' යැයි කී ව්ලදිමීර් ඉල්යිච් දෑත් දිග හැර සීලිම ඇල්ලුවේය.

වම් පසින් යකඩ ඇඳකි. කොටු සහිත කම්බිලියකින් එය වසා ඇත. දකුණු පසින් ජනේලයක් සහ සඳලුතලයයි. ජනේලය අසල ලියන මේසයකි. කොළ පැහැති කවරයක් සහිත පහනකි. පොත් රාක්කයක තමා ඇලුම් කරන පොත් ගොඩකි.

Scanned with CamScanner

''මම මෙහාට වෙලා විවේක ගන්නම්. ඒ වගේම අගේට වැඩත් කරන්නම්. සහෝදරවරු කීප දෙනෙකුට මෙහෙ එන්නට කිව. ඒ ගොල්ලන්ගෙන් උපදෙස් ගැනීමට මට ඕන. ඒ ගොල්ල එනතුරු මම මෙහෙ ඉන්නව, අම්මේ!'' යැයි ඔහු කීවේය.

ව්ලදිමිර් ඉල්යිච් සඳලුතලයට ගියේය. වැස්ස පායා තිබිණ. වත්තේ මල්වලින් සුවඳ වහනය වේ. හිරු රැස් නිසා සතුටු වූ කුරුල්ලෝ මිහිරි ගී ගයති.

''අම්මේ, යමු මල්වත්තට.'' යැයි යෝජනා කළ ව්ලදිමිර් ඉල්යිච්, ''කබාය ඇඳගන්න. අම්මා අපට නිතර උගැන්වූ ප්‍රිදි සපත්තුවලට උඩින් කවර දමා ගන්න. කකුල් තෙමා ගන්න එපා'' යැයිද කිය. 

අම්මා පුතා දෙස ප්‍රීති සිතින් බැලුවාය.

''දන්නවද පුතේ, නදේෂ්ද හමුවීමටත් උඹගෙ ''ගිනිපුපුරු'' කණ්ඩායම් හමුවෙලා කතාකරගැනීමටත් වැඩ පිළිවෙලක් මම කල්පනා කළා'' යැයි අම්මා කීවාය.

''අම්මේ!''

''ඔව්, ඔව්, මගේ ලේලි හඳුනා ගන්නත් එපායැ.'' එසේ කියන විට අම්මා ගේ නෙත්වල කාන්තියක් ඇති වූවාක් මෙනි.

''අම්මා නදේෂ්දව හඳුණනවා නොවැ'' යි පුදුමයට පත් ව්ලදිමිර් ඉල්යිච් පැවසීය.

''පොලිසිය ඒ ගැන දන්නෙ නැහැ නෙව. උඹ කසාද බැන්දෙ පිටුවහලෙ ඉන්න කොට, උඹ මනමාලිව ගෙදර කැඳවා ගෙන ආවෙ නැහැ නෙව...''

''පොලිසිය අවසර දුන්නෙ නැහැ: එයාට තව මාස හයක් පිටුවහලෙ ඉන්ට සිදු වෙනව.''

''ඒ හන්ද, මට උඹේ බිරිඳව — මගේ ලේලිව හඳුණා ගන්ට ඕන. ඒක අම්මා කෙනෙකුට ඇති අයිතියක්. ඒ අයිතිය උදුරා ගන්ට උන්ට බැහැ. මම පිටර්බුර්ග් නගරයට ගිහිල්ල අවසර ඉල්ලන්නම්.''

''යන්න පුළුවනි අවසර නැතුව, අම්මේ!''

''මට තනියම යන්න බැහැ. වයස හැට පහක් නෙව. හෘද වස්තුවත් ලෙඩ වෙලා. ඇත්තටම මට ඇති ලෙඩක් නැහැ. පුතා එයාගේ අම්මාට, එයාගෙ බිරිඳව හඳුන්වලා දෙන්ට ඕන, තේරුණද. පුතේ හෙට මං පිටර්බුර්ගයට යනවා.

ව්ලදිමිර් ඉල්යිච් නිහඬව මවගේ දෑත් සිප ගත්තේය.

ඒ අතර ආන්නා ඉල්යිනිච්නා තරප්පු පෙළ නගිමින් උඩු මහලට ආවාය.

''මල්ලියෙ උඹට මේ කාමරය හොඳද? අන්තිමෙට අම්මා උඹව මුණ ගැසුනා.'' යැයි ඇ කීවාය.

Scanned with CamScanner

ව්ලදිමිර් ඉල්යිච් දැත් සොලවමින් නිහඬ විය. ඔහුගේ මුහුණ ප්‍රීතියක්ද, එමෙන්ම ලජ්ජා ගතියක්ද පළ කළේය.

''ආන්නා, හෙට මම යනව පිටර්බුර්ගයට. දුව ගිහිල්ලා මගෙ ගමන් කබාය පිළියෙල කරන්න. ද්මීත්‍රි කියන්න දුම්රිය පළට ගිහින් මට ටිකට් එකක් අරගන්න කියල. මේ පාර නම් මට දෙවැනි පංතියෙ යත හැකි'' යි ඇ මුදු හඬකින් කීවාය.

*



පසුදු උදෑසන රෝගියා බැලීමට දෙස්තර ලෙවිට්ස්කි ආවේය.

''ඔහෙලගෙ අම්මා හොඳ සනීපයෙන්'' යැයි හෙතෙම ද්මීත්‍රි ඉල්යිච් අමතා කීය.

''දෙස්තර මහත්මයා, සම්පූර්ණයෙන්ම හරි. අම්මාගේ ලෙඩේට හොඳම බෙහෙත ප්‍රීති වීම තමා.''

ද්මීත්‍රි ඉල්යිච් දෙස්තර සමග ගෙවත්තට ගියේය.

''මම ඔහෙට අපේ අයියව හඳුන්වා දෙන්නම්'' යැයි ද්මීත්‍රි ඉල්යිච් දෙස්තරට කීය. විප්ලවවාදියෙකු හා උගතකු ලෙස ව්ලදිමිර් ඉල්යිච් ගැන අසා ඇති දෙස්තර ලෙවිට්ස්කි, උපැස් යුවලක් පැළඳ ගෙන, බස්තමක් අතින් ගෙන, ගාම්භීර ලෙස වත්තේ ඇවිදින මැදිවියේ පුරුෂයෙකු දැකීමට බලාපොරොත්තු විය. ලීයෙන් සෑදූ දිග මිටියක් කර තබා ගෙන සිටින, පළල් උරහිස් ඇති තරුණයෙකු දුටු දෙස්තර පුදුම විය.

නංගී ගැසූ ක්‍රොකට් පංදුව කඩොලු දෙකක් හරහා යන සැටි, වම් ඇස අඩවන් කර ගනිමින් ඔහු බලා සිටියේ උනන්දුවෙනි.

''හරි දක්ෂයි, හපනී!'' යැයි ඔහු මහත් සතුටින් කෑගැසීය.

ක්‍රොකට් මිටිය වම් උරහිස මත තබා ගෙන, මිතුරු ලීලාවකින් දෙස්තරට අත දුන් හෙතෙම, ක්‍රීඩා කිරීමට එන ලෙස ඔහුට ආරාධනා කළේය. ව්ලදිමිර් ඉල්යිච් දෙස්තර දෙස තියුණු බැල්මක් හෙළීය. දෙස්තර ලෙවිට්ස්කි වයසින් ඔහුට වඩා අවුරුදු දෙකකින් පමණ බාලය. දෙස්තරගේ යටි රැවුළ දුඹුරු පැහැතිය. තුනී හිසකෙස්, සනව වැඩී ඇත. ඔහුගේ ඇස් අළු පැහැතිය. විනිවිද යන ගැඹුරු බැල්ම ඔහුගේ දැඩි ආත්ම ශක්තිය හා බුද්ධිය ගැන කියයි. ඒ අතර යෞවන, පිරිසිදු කරුණාබර හැඟීම් පළකරන අංගයන්ද දෙස්තරගේ හැඩ හුරුකම් කියා පායි.

තම අයියා සහ දෙස්තර මිත්‍ර වූ බැව් දුටු ද්මීත්‍රි ඉල්යිච් සතුටු විය.

එදින ඉරිද දිනයක් වූ බැවින්, ඔරු පැදීමට යමු යි දෙස්තරට ව්ලදිමිර් ඉල්යිච් යෝජනා කළේය.

Scanned with CamScanner

අළුත් මිතුරා ඉතාම හොඳ කෙනෙකු බව දෙස්තර ලෙවිට්ස්කි තේරුම් ගත්තේය. බොහෝ දේ ගැන උවමනාවක් දක්වන, උසස් සංස්කෘතියකින් හෙබි, ප්‍රීතිමත් සහ උසස් ගතිගුණ ඇති මේ පවුල සමග සදහටම සබඳකම් ඇති කර ගැනීමට ඔහු කැමති විය.

පහ්රා ගඟ හරහා ව්ලදිමීර් ඉල්යිච් ඔරුව පැද්දේය. පදෝල්ස්ක් කෝරළයේ බිළිඳු මරණ සංඛ්‍යාව මෙතරම් ඉහළ නැඟ තිබෙන්නේ ඇයි? යුද්ධ හමුදාවට අළුතින් බඳවාගන්නා ආධුනිකයින්, මේ තරම් විශාල ගණනක් සෞඛ්‍ය අතින් පිරිහුණු තත්වයක සිටින්නේ ඇයිද? ලෙඩරෝග වලින් පෙලෙන නිසා ළමයින් මැරෙනවා නොවෙද? ආදී ප්‍රශ්න ඔහු දෙස්තරගෙන් ඇසුවේය. 55

''ඒකට වගකියන්ට ඕන, සුප්‍රසිද්ධ පදෝල්ස්ක් තොප්පි කර්මාන්තය.'' යැයි දෙස්තර පිළිතුරු දුන්නේය.

ව්ලදිමීර් ඉල්යිච් නළල රැලි ගන්වමින් දෙස්තර දෙස බැලීය.

''ඒ කතාවෙ තේරුම?''

''පදෝල්ස්ක් පළාතේ ජනයාගෙ ශාරීරික වර්ධනය ගැන මම හදරනවා. ජනයාගෙ සෞඛ්‍යය නිතර දුබල වීමේ හේතුව හැමතිස්සෙම රසදිය අතගෑමයි. තොප්පි සෑදීම සඳහා හාවන්ගේ ලොම් පාවිච්චි කරනවා. මේ ලොම් පදම් කිරීමට රසදිය යොදනවා. මේ විදියට හදන හැම තොප්පියක් නිසාම හැම මිනිහෙකුගෙම ශරීර සෞඛ්‍යයට හානි සිදු වෙනවා. මේ වනචාරී ක්‍රමයට විරුද්ධව මම විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ උනාට පැක්ටරි හිමියා, පැක්ටරි හිමියාමයි. ඒ මිනිහට ලාභ ලැබෙනවනම් අනිත් මිනිසුන්ගෙ සෞඛ්‍යයට හෙණ වැදුනත් එයාට කමක් නැතැ'' යි දෙස්තර ලෙවිට්ස්කි කාරණය විස්තර කරමින් පැවසීය.

''කතාව සම්පූර්ණයෙන්ම හරි, ඉතින් මීළඟට මොනවද කරන්න හදන්නෙ?'' යැයි ව්ලදිමීර් ඉල්යිච් ඇසීය.

''එක ප්‍රංශ සඟරාවක මම කියෙව්වා ප්‍රංශ තොප්පි කර්මාන්තය, ලොම් වගී රසදියෙන් පදම් නොකර පොටැසියම් මිශ්‍රණයක් යොදනවා කියල.''

''ඒ ගොල්ලන්ට විස කැවෙන බව කම්කරුවො දන්නෙ නැතිද?'' යි ව්ලදිමීර් ඉල්යිච් ප්‍රශ්න කළේය.

''මම ඒක පැක්ටරි හිමියන්ට පමණක් නොවෙයි, පුංචි හස්ත කර්මාන්ත කාරයින්ටත් කම්කරුවන්ටත් විස්තර කළා. රස්සාව නැති කරල දල කම්කරුවන්ට බඩගින්නෙ මැරෙන්ට බැහැ නෙවැ'' යි දෙස්තර කීවේය.

''කම්කරුවන් බොහෝ දෙනෙකුට විස්තර කළාද?''

''කම්කරුවන් සිය ගණනකට ඒ ගැන කීවා.''

''ඔය ගැන මුළු රුසියාවෙම ඉන්න කම්කරුවො දැනගන්ට ඕන. ඒ වගේම දෙන් ප්‍රදේශයෙ ආකරවල කම්කරුවන් සූරාකන සැටිත්, ඉවානොවො

Scanned with CamScanner

වස්නිසෙන්ස්ක්වල රෙදි කම්කරුවන් සූරාකන සැටිත්, ලෙනාහි රන් ඉල්ලම් වල කම්කරුවන් සූරාකන සැටිත්, පදෝල්ස්ක් කම්කරුවෝ දැනගතයුතු'' යැයි ව්ලදිමීර් ඉල්යීච් කීවේය.

''ඒ උනාට කොහොමද ඒක කරන්නෙ?''

''ඒ ගැන සියළු කම්කරුවන්ට පුවත්පතක් මගින් දැනුම් දෙන්ට ඕන. ඒ විතරක් නෙවි, කර්මාන්ත හිමියන්ට විරුද්ධව සංවිධානාත්මක ලෙස සටන් කරන්ට ඒ ගොල්ලන්ට උගන්වන්න ඕන. විමුක්තියේ මාර්ගය පෙන්වා දෙන්ට ඕන.''

දෙස්තර ලෙවිට්ස්කි බැරෑරුම් ලෙස සිනාසුනේය.

''ඔය වගෙ ප්‍රවෘත්ති පළ කරන්න පුවත් පතක් තියෙනවද?'' යි හෙතෙම ඇසීය.

''එවැනි පුවත්පතක් තියෙන බව මා දන්නවා'' යැයි ව්ලදිමීර් ඉල්යීච් ස්ථිර ලීලාවකින් කීවේය. ''ඒ පත්‍රයේ නම තමා 'ගිනි පුපුර'. ඔය ප්‍රශ්නය ගැන ලියුමක් ලියල ද්මීත්‍රි අතට දෙන්න. එයා දන්නවා එය යවන්ට ඕන තැන''.

ව්ලදිමීර් ඉල්යීච් හබල් ඔරු කඳ මත තබා ගෙන පහ්රා ගං ඉවුර දෙස බැලීය.

ගං ඉවුරේ වල් පැලෑටි වැවී ඇත. ඉන් එහා තණ පිට්ටනියකි, සුදු මල් පැලෑටි වසා ගෙන විල්ලෝ වැල් උසට වැවී, කුඩාරමක හැඩයක් ගෙන ඇත. විල්ලෝ වැල් අතරින් වැටෙන හිරුරැස් නිසා ලා දළු පණ ලැබුවාක් මෙනි.

''මේ පළාත කොතරම් අපූරුද, පිරිසුදු වාතය, සොබාදහමේ සිරියාව, ඒ උනාට විස කැවීම නිසා මිනිස්සු මැරෙනවා. ළමයින්ට මාන්දම හැදෙනව. තමන්ගේ ඉරණමෙහි හාම්පුත්තු තමන් විය යුතු බව පුවත්පත කම්කරුවන්ට උගන්වාවි...''

''ඒක සම්පූර්ණයෙන්ම හරි. හැබැයි ඇත්ත වශයෙන්ම එහෙම පුවත්පතක් තියනවනම්...''

''එවැනි පුවත්පතක් ඇති වේවි. ආදරණීය දෙස්තර, සත්තකින්ම ඇති වේවි.''

ගෙදර හැරී ආ ව්ලදිමීර් ඉල්යීච් කාමරයක් පාසා යමින් දෑත් පිරිමදින්නට වූයේ සතුටකිනි. අන්තිමේදී ඔහු මල්ලීට මෙසේ කීය:

''මල්ලියෙ, උඹගෙ දෙස්තර හොඳ කෙනෙක්. කාරිය ශූරයෙක්. 'ගිනි පුපුර' පත්‍රයට වාර්තා ලියන්ට මිනිහව උනන්දු කරවන්න. එයාට දෙන්න කාල් මාක්ස්ගෙ පොත් කියවන්න... එයා කාරිය ශූර, හොඳ මිනිහෙක්!''

Scanned with CamScanner

*

හවස මරියා ඇලෙක්සාන්ද්‍රව්නා පිටර්බුර්ගය බලා පිටත් වූවාය. ඇය හැරලීම පිණිස දරුවෝද පදෝල්ස්ක් දුම්රිය පළට ගියහ.

''වැඩකට ඇති ගමනක් නෙවි, අම්මා ගියෙ'' යැයි පිටත්වූ දුම්රිය දෙස බලාගෙන කී ආන්නා ඉල්යීනිච්නා මෙසේද කීවාය: ''අම්මා ඉල්ලන විධියෙ අවසරයක් පොලිසිය දෙන්නෙ නැහැ.''

''ඒ උනාට අම්මා හිතූ දේ ගැන වැයම් නොකොළොත්, අම්මාට සැනසීමක් නැහැ.'' යැයි මරියා ඉල්යීනිච්නා කීවාය.

''අම්මා ආපසු එන්න ඉස්සෙල්ලා අපට වැඩ ගොඩක් තියෙනව කරන්න. පස්සෙ අපට විවේක ගන්න පුළුවනි.'' යි ව්ලදිමීර් ඉල්යීච් කීය.

තම වැඩට සෑහෙන ''මහත සටහන් පොතක්'' සොයා දෙන ලෙස ඔහු මල්ලිගෙන් ඉල්ලා සිටියේය. මේ ළඟදී ඔහුට ලැබුණු ''විද්‍යාත්මක විමර්ශනය' නම්වූ සඟරාවේ 5 වැනි කලාපය ඒ කාරිය සඳහා සුදුසු යැයි ද්මීත්‍රි ඉල්යීච් අයියාට දැන්වීය. ව්ලදිමීර් ඉල්යීච් ඒ යෝජනාවට එකඟ විය. සඟරා කලාපයේ පිටු පෙරළා බැලූ හෙතෙම සී. වුගුනොව්ගේ ''මිනිස් ග්‍රෛව් කශේරුකාව සහ පරිණාමවාදය'' නම්වූ ලිපිය කෙරෙහි සිත් යොමු කළේය.

''අපේ වැඩේට මේක සෑහෙනවා. මේ ලිපියේ අච්චු අකුරු පේළි මැදින් අපි රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කෙටුම්පත් වැඩ පිළිවෙළ ලියමු. ඒ විධියට අපට පුළුවනි එය පිටරට ගෙනියන්න'' යැයි ව්ලිදිමීර් ඉල්යිච් කීවේය.

කෝප්පයකට කිරි වත් කරගෙන, අළුත් පැන් තලයක්ද අතට ගෙන වාඩිවූ ඈන්නා ඉල්යීනිච්නා ''ග්‍රෛව් කශේරුකා'' ලිපියේ මුද්‍රිත අකුරු පේළි අතරින් ලියන්නට වූවාය. ඈ වෙහෙසට පත්වූ විට ද්මීත්‍රි ඉල්යීච් කෙටුම්පත් වැඩ පිළිවෙළ ලියන්ට පටන් ගත්තේය.

සති අන්තයේ නිවාඩු ගතකිරීම පිණිස සෙනසුරාද මොස්කව් සිට මාක් තිමොපේයෙව්ච් ගෙදර ආවේය. ව්ලදිමීර් ඉල්යීච් ඔහු වෙත නව සැළැස්මක් ඉදිරිපත් කළේය. මුළු රැයම ඒ අනුව වැඩ කළ මේ දෙදෙනා ''රහස් මේසයක්'' සෑදීම සඳහා වෙහෙසුණහ. රුසියානු සමාජ ප්‍රජතන්ත්‍රවාදී පක්ෂයට අයත් වටිනා ලියවිලි පොලිසියට අසු නොවන සේ සඟවා තැබීමට මෙවැනි මේසයක් උවමනා විය.

පසුද එළිය වැටෙන තුරු වෙහෙසුණු මාක් තිමොපේයෙව්ච්ට එම සැළැස්ම සාද නිම කිරීමට පුළුවන් විය.

සුප්‍රසිද්ධ ඉංග්‍රීසි විද්‍යාඥ ජේම්ස් වොට් වාෂ්ප බලයෙන් ක්‍රියා කරන පළමුවැනි යන්ත්‍රය සොයා ගැනීම සඳහා මෙතරම් මහන්සි වූයේ දැයි සිතීම

උගහටය. ව්ලදිමීර් ඉල්යීච් සහ මාක් තිමොපේයෙවිච් පක්ෂයේ ලියවිලි ආරක්ෂා කිරීම සඳහා එතරම් විශාල වෙහෙස මහන්සියක් දරා මේසයක් සෑදූහ.

දම් කොටු සියයක් සහිත මේසයක් වූ එය වටේ හතරදෙනෙකුට ක්‍රීඩා කළ හැකිය. කකුල් තුනක් ඇති මේ මේසය කුහරයකින් යුක්තය. ඒ කුහරය තුළ ලාච්චු කීපයකි. එවායේ ඉහළ තට්ටුව කැටයම් සහිත පනේලයකින් වසා ඇත. කැටයම් පනේලය ගැලවූවොත් ඉහළ තට්ටුවේ පියන හැරී ගොස් රහස් කුහරයක් මතුවේ. ඒ පියන තුළද කුහරයකි.



"පොලිසිය ලාච්චු හැර බලන්ට පටන් ගනීවි. පියනෙහි සනකම කැටයම් පනේලයකින් වැසී ඇත. ඒ නිසා එය තුළ කිසිවක් ඇතැයි කාටවත් සැක කළ නොහැක. වැඩේ නම් හරිම අනර්ඝයි!" ව්ලදිමීර් ඉල්යීච් සතුටු විය. "දැන් ඉතින් බොහොම දක්ෂ ශිල්පියෙක් ඕන ලාච්චු හදන්ට. හැබැයි, එයා බොහොම විශ්වාසවත් කෙනෙක් වෙන්ට ඕන."

"බොහොම දක්ෂ ශිල්පියෙක් මම හඳුණනව, ඒ වගේම එයා ගැන වග කියන්ටත් පුළුවනි." යි මාක් තිමොපේයෙවිච් කීවේය.

ඒ දක්ෂ ශිල්පියාගේ නම කිසිවෙක් නොදත්හ. එහෙත් සැලැස්ම අනුව ඔහු විසින් සාදන ලද ඒ මේසය තුළ අවුරුදු දහ හතක් තිස්සේ, එනම් ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය දක්වාම රහස් ලියවිලි සඟවා තැබීය. පළපුරුදු පොලිස් පරීක්ෂකයෝ කී වරක් ඒ මේසය පරීක්ෂකර බැලුවෝද, කුහරය සහිත පියන තට්ටු කර බැලුවෝද, ලාච්චු සියල්ල ගලවා මේසය ඒ මේ අත පෙරළා බැලුවෝද, මේසයේ රහස දැනගැනීමට ඔවුන්ට බැරි විය. මේ මේසය වි. අයි. ලෙනින්ගේ මධ්‍යම කෞතුකාගාරයේ වැදගත් තැනෙක තබා ඇත්තේ මේ හේතුව නිසාය.

සහෝදරවරුන් සමග කරන ලියුම් ගනුදෙනු ආරක්ෂක දෙපාර්තමේන්තුව විවෘත කර බලන බැවින් රහස් සංඛ්‍යා හා අක්ෂර ක්‍රමයක් සොයා ගත යුතුය. එම සංඛ්‍යා හා අක්ෂර සහෝදරවරුන්ට ලෙහෙසියෙන් මතක තබා ගත හැකි ඒවා විය යුතුය. එමෙන්ම ඒ රහස් සංඛ්‍යා හා අක්ෂර ක්‍රමය ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පළපුරුදු නිළධාරීන්ට පවා සොයා නොගත හැකි විය යුතුය. ඒ රහස් සංඛ්‍යා හා අක්ෂර ක්‍රමය ව්ලදිමීර් ඉල්යීච් විසින් සොයා ගන්නා ලදී. ඒවා සොයා ගැනීම සඳහා ඔහු ගණිත විශාරදයෙකු මෙන් නිවැරදිවද, කවියෙකුගේ ආස්වාදයෙන් යුතුවද ක්‍රියා කළේය. සහෝදරවරුන් සිරභාරයට ගනු ලැබුවහොත් ඔවුන්ගේ ශරීර සෞඛ්‍යය සහ උනන්දුවද නැති නොවන පිණිස වැඩපිළිවෙළක් යෙදීමට ඔහුට උවමනා විය.

"මල්ලියෙ උඹ ඉක්මනින්ම දෙස්තර කෙනෙක් වෙනව නෙවද. මට ඕන නුඹෙන් වෛද්‍ය උපදෙස් ගන්ට. බරපතල වැඩ ඇතිව හිරගෙට නියම උණොත්

Scanned with CamScanner

කම්කරුවන් සමගි කළ යුතුය. අනාගත සටන්වලට ඔවුන් සූදනම් කළ යුතුය.



Scanned with CamScanner

ව්ලදිමීර් වයස 21 දී. දූන් ඔහු සරසවි
සිසුවෙකි.



Scanned with CamScanner

ලයිප්සිග්හි මේ නිවසෙහි ලෙනින් පළමුවැනි රුසියානු මාක්ස්වාදී පුවත්පත වන ඉස්ක්‍රාව මුද්‍රණය කිරීම සංවිධාන කළේය.

මේ කුඩා මුද්‍රණ යන්ත්‍රය විප්ලවවාදී ලිපි මුද්‍රණය කළේය.





Scanned with CamScanner

ලෙනින්ගේ සහකාරිය සහ කිට්ටු
මිතුරිය: නදේෂ්ද කෲප්ස්කයා.



Scanned with CamScanner

ලෙනින් අවුරුදු කීපයක් තිස්සේ රටින් පිටව සිටියෙන් ඔහු වෙත යැවීමට, ඔහුගේ මව සහ ආන්නා සොහොයුරිය මේ ඡායා රූපය ගත්හ.



Scanned with CamScanner

තාවකාලික ආණ්ඩුවේ ඔත්තු කරුවෝ ලෙනින් සොයති. සැඟවී සිටි ලෙනින් රජය හා විප්ලවය නැමති කෘතිය ලියයි.



Scanned with CamScanner

ඖරෝරා යුද්ධ නැව. අවිගත් කැරැල්ල පටන් ගැනීම සඳහා සංඥ වෙඩිමුර තැබුවේ මේ නැවේ කාලතුවක්කු වලිනි.



Scanned with CamScanner

ධනපති ආණ්ඩුවේ කාලය කෙටි විය. ඔක්තෝබරයේ අවිගත් නැගිටීම.



Scanned with CamScanner

හැසිරිය යුතු ආකාරය, උදහරණයක් හැටියට විස්තර කරන්න. නඩු තීන්දුවට ඉස්සෙල්ල පොලිස් හිරකූඩුවට නියම වෙලා හිටි කාලෙදී මම පොළොව පිස දැමීම සහ කොරිඩෝරය පිස දැමීම අත නොහැර කළා. හැමදම ව්‍යායාම් කළා. ඒ විතරක් මදි. ශරීර ශක්තියයි, අධිෂ්ඨාන ශක්තියයි ආරක්ෂා වන විදියේ වැඩ පිළිවෙලක් ඇති කරන්න ඕන.'' යැයි ව්ලදිමිර් ඉල්යිච් කීය.

දිමිත්‍රි ඉල්යිච් විස්මයෙන් යුතුව තම වැඩිමහල් සොහොයුරා දෙස බැලීය.

''අයියා, ඇයි හිරගෙදර ගැන හිතන්නෙ? පිටරට යාමට ලැහැස්ති වෙලා නෙවද?''



''ඕනම දේකට මුහුණ දෙන්ට ලෑස්ති වෙල ඉන්න ඕන. පිටරට යන්නෙ හැමදම එහෙ ඉන්ට නෙවි. හිරගෙදරදී හැසිරෙන්න ඕන ආකාරය ගැන කල් ඇතිව හැම සහෝදරයෙකුටම දන්වන්න ඕන''.

තම්බෝව් පෙදෙසේ සිට ෂෙස්ටෙර්නින් සහ ඔහුගේ බිරිඳද, ව්ලදිමිර් ඉල්යිච් සමග සයිබීරියාවේ පිටුවහල් ජීවිතය ගත කළ පැන්ටෙලෙමෝන් නිකොලායෙව්ච් ලෙපෙෂින්ස්කිද පැමිණියහ.

පහ්රා නදිය අසල පිහිටි ඒ කුඩා ගෘහය අණ දෙන කාර්යාලයකට සමාන විය. තරුණ උදවිය ගෙදර සාලයට වී පහත් හඬින් සාකච්ඡා කරන්ට පටන්ගත් විට, ප්‍රිද්කා ගෙට ඇතුළු වන තැන ලඟ මුර කරයි. සියළු දෙනාම ක්‍රොකට් ක්‍රීඩාව සඳහා වත්තට ගිය විට ඌ පන්දුවක් කටින් ගෙන දුවමින් සෙල්ලම් කරයි. ගෙදර උදවිය පහ්රා ගඟේ දිය නෑමට ගිය විට, ගඟ අසලට ගොස් මුරකරන ප්‍රිද්කා පීනන්නාන් දෙස බලා සිටින්නේ නොසන්සුන් ගතියකිනි. ප්‍රිද්කා වැඩියෙන්ම නොසන්සුන් වන්නේ ව්ලදිමිර් ඉල්යිච් නිසාය. ගඟට පැන පීනන ඔහු හිටිහැටියේම දිය යටින් යයි. කලබල වන ප්‍රිද්කා දිග ඇදී හොම්බ දිගු කොට වතුරට පනී. පීනමින් සිටි තැනැත්තා දියේ ගිලෙමින් සිටින්නේ යැයි ඉව අල්ලා දැනගන්නා ප්‍රිද්කා ඉක්මනින් පීනයි. ව්ලදිමිර් ඉල්යිච් එහා ඉවුර දක්වා දිය යටින් ගොස් මතුවී, වෙරළේ හිඳ ගනී. ප්‍රිද්කාද වෙරළට යයි.

''මොකද බය උණාද? උඹ හිතුවද මම දියේ ගිලුණයි කියල?'' මෙසේ අසන ව්ලදිමිර් ඉල්යිච් ප්‍රිද්කාගේ හිස අත ගායි.

හවස උල්යානොව්ලාගේ ගේ අසල පිහිටි කේද්රොව්ලාගේ ගෙදරට පොලිස් නිලධාරියෙක් ආවේය. උල්යානොව්ලාගේ වැඩ කටයුතු ගැන ඔහු කේද්රොව් මැතිනියගෙන් විස්තර ඉල්ලා සිටියේය. ඇවිත් ඉන්න අමුත්තන් කව්රුද? රහස් සාකච්ඡා කරනවාද? රුසියානු අධිරාජයාට විරුද්ධ කුමන්ත්‍රණය කරනවාද? ආදී ප්‍රශ්න ඔහු ඇගෙන් ඇසුවේය. මහළු පොලිස් නිලධාරියාගේ ප්‍රශ්න නොතේරෙන බව ඇඟවූ කාන්තාව, ඇය සමග ආලින්දයට ගොස් බලන

Scanned with CamScanner

ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියාය. අල්ලපු ගෙවත්තේ සිටින මිනිසුන් ප්‍රීතියෙන් හඩ නගන සැටිද, ක්‍රොකට් පන්දු එකි'නෙක හැප්පෙන ශබ්දයද ඇසේ. සමවාරයෙන් නගින නිල් පැහැති දුම් වළාවන්ද පෙනේ. ප්‍රිය උපදවන හඬකින් කෙනෙක් ගීයක් ගයයි:

කසාද බඳින්ට පල්ලි ගියේ නෑ
රන් මුදු ගන්නට සල්ලි අතේ නෑ
ගායන වාදන අපට නැතේ
පල්ලිය ගෞරව අපට නැතේ...



''කව්ද ඒ සිංදු කියන්නේ?'' පොලිස්කාරයා ඇසුවේය.

''උල්යානොව් පවුලේ වැඩිමහල් පුතා — ව්ලදිමිර් ඉල්යිච්'' යැයි කේද්රොවා කීවාය.

''සයිබීරියාවේ පිටුවහල් සිර දඬුවම ගෙවලා ආපු මිනිහද?'' යි පොලිස් නිලධාරියා ඇසීය.

''කොහෙ ඉඳල ආවද කියන එක ඔහෙ මට වැඩිය හොඳට දන්නව නෙව. ඒ උනාට ඒ හාදයා මහ හයියෙන් හිනාහ වෙනාව. හැමතිස්සෙම සින්දු කියනව, නැතිනම් උරුහන් බානවා. හැමදම උදේට ගමේ කොල්ලො කුරුට් ටොත් එක්ක ගඟේ පීනනවා. ඔහෙලට ඒ ඉලන්ද්‍රියා ගැන බොරු කේලාම් කියාවි. විප්ලවකාරයන්ට පුළුවන්ද ඔහොම හැසිරෙන්න? ඒ ගොල්ල හොඳ වැදගත් උදවිය'' යැයි කේද්රොවා ස්ථිර ලෙස කියා සිටියාය.

වැටට උඩින් ප්‍රිද්කාගේ ඔළුව පෙනේ. පොලිස් නිල ඇඳුම දුටු ප්‍රිද්කා දත් නියවමින් ගොරවන්නට විය. උගේ ඇස් රත් පැහැයෙන් දිලිසෙයි. මේ සියල්ල දුටු පොලිස් නිලධාරියා ඉක්මනින් ගෙදර ගියේය.

*

පිටර්බුර්ග් නගරයට ගිය මරියා ඇලෙක්සාන්ද්‍රව්නා දවස් තුනකින් ගෙදර ආවාය.

ළමයි සියළුදෙනාම ඇය හමුවීම පිණිස දුම්රිය පළට ඇවිත් සිටියහ. ගමන සාර්ථක වීද? යන ප්‍රශ්නය ඇසීමට කිසිවකු ඉදිරිපත් නොවිය. ඇයද කිසිවක් නොකීවාය. එහෙත් ගෙදර ආ පසු, ඇය අත් බෑගයෙන් රජයේ මුද්‍රාව සහිත ලියවිල්ලක් ගෙන, ව්ලදිමිර් ඉල්යිච් වෙත දිගු කළාය:

''මෙන්න පුතාට තෑග්ගක්.''

''අවසර දුන්නා?'' යැයි කී ව්ලදිමිර් ඉල්යිච් මවගේ අතක් ගෙන සිප ගත්

Scanned with CamScanner

තේය. ''මගෙ දයාබර අම්මේ! අම්මා ගෙනා අවසර පත්‍රය මට කොතරම් වටිනා තෑග්ගක්ද කියල දන්නවද!..''

උෆා නගරයට යාමට පෙර බෝට්ටු පැදීමෙන් අවසාන සවස් කාලය ගත කිරීමට තීරණය කළහ. විල්ලෝ පඳුරුවලින් ආවරණයවී ඇති තැනෙක රැස්වූ පිරිස ගී ගයමින් ගම්බද ක්‍රීඩා කරන්නට වූහ. මරියා ඇලෙක්සාන්ද්‍රව්නා කොටයක් මත වාඩි වී තරුණ තරුණියන්ගේ ගී අසමින්, ක්‍රීඩා දෙස බලා සිටියාය.

සෙල්ලම් ගමනින් පසු සැහැල්ලු සිතින් හා ප්‍රීතියෙන් ඔදවැඩී ගිය. පිරිස ආපසු ගෙදරවිත් ගං ඉවුර බලා ගියහ. පහ්රා ගඟට උඩින් නිල් පැහැති වලාපටලයකි. හිරු බැස යත්ම අඳුර පැතිර ගියේය. පලාගිරව් සමූහයක් ගයන්නට වූයේ සංගීතාචාර්ය වරයෙකුගේ අණ පිළිපදින්නාක් මෙනි. නිසලව ගලා බසින පහ්රාවේ මාළුවෝ වළිග ගසමින් දිය යටින් මතුවී, නැවත අතුරුදහන් වෙති. මැඩියෙක් බියගත් විලාසයකින් 'බක-බක' හඬක් නගයි. අවට පඳුරුවල සැඟවී ගත් රෑ කොවුලෙක් වරක්, දෙවරක් මිහිරි නාදයකින් ගයා නිහඬ වෙයි. සැදල රහිත අසුන් කීපදෙනෙකු දක්කාගෙන ගිය කොල්ලෝ කීපදෙනෙක්, දෙණිය හරහා ගොස් නොපෙනී ගියහ. නැවත නිහැඩියාවකි. ඉඳහිට හඬ නගන පලාගිරවෙක් ඒ නිහඬතාවය බිඳ හෙලයි. අහසේ තරුවල දීප්තිය කෙමෙන් වැඩි වෙයි.

නිවෙස් බලා යාමට කිසිවකුට සිත් නොදේ. පිදුරු ගොඩක් අසල හිඳගෙන නිහඬව උන්හ. ව්ලදිමීර් ඉල්යිච් පිදුරු ගොඩට පිටදී පිරිසුදු වාතය ආශ්වාස කළේය. දවල් කාලයේ හිරු රැස් නිසා උණුසුම් වූ බිම තවම සිසිල් නොවිය. හෙට මේ හැම දෙනෙක්ම නොයෙක් නොයෙක් තැන්වලට ගොස් වැඩ පටන් ගනු ඇත. ෂෙස්ටෙර්නින් යුවල තම්බෝව් පෙදෙසට යනු ඇත. ලෙපෙෂින්ස්කි ප්ස්කොව් බලා යනු ඇත. ව්ලදිමීර් ඉල්යිච් සහ අන්නා ඉල්යිනිච්නා අම්මාත් සමග වොල්ගාවට යනු ඇත. මේ කාලය තුළදී දෙස්තර ලෙව්ට්ස්කි ''ඉස්ක්‍රා'' පත්‍රයේ වාර්තාකරුවකු වශයෙන්ද ක්‍රියා කිරීමට ඉදිරිපත් විය. මරියා ඉල්යිනිච්නා සහ ද්මීත්‍රි ඉල්යිච් ''ඉස්ක්‍රා'' පත්‍රයේ නියෝජිතයින් ලෙස කටයුතු කරති. අවංක රුසියානුන් බොහෝ දෙනෙක් ගෙන ඇති මග, ඒ අමාරු අසීරු, එහෙත් ආලෝකමත් මග ගැන ඔවුහු සිතන්නට වූහ.

''අපි කවුරුත් කැමති ගීතය ගයමු'' යි ව්ලදිමීර් ඉල්යිච් නිහඬතාවය බිඳමින් පැවසීය.

සතුරු මාරුත අප වෙත හමයි
දුෂ්ට බලයෝ අප පාගති...



Scanned with CamScanner

අනෙක් සහෝදරවරු පසුව නිහඬව ගයති.

සතුරාට එදිරිව අවසාන මාරක සටනට වැදෙමු
අපේ අනාගත ඉරණම කිසිවෙක් නොදනී...

එහා ඉවුරේ ගිනි මැලයකින් අල පුළුස්සන සුවඳක් දැනේ. රෑ යාමය වන තුරු අසුන්ට තණ කවන කොල්ලෝ එක්වී ගිනි මැලයක් ගසා අල පුළුස්සමින් සිටිති. ඊට තරමක් ඈතින් තව ගිනි මැලයකි, ඉන් නගින ගිනි දැල් නිසා මහත් වූ ආලෝකයක් ඇති විය. කොල්ලන් ගිනි මැලය අවට ඇවිදින සැටි පෙනේ.



"ගිනිමැල! සහෝදරවරුනි, අපිත් එකතුව රුසියාව පුරා ගිනිමැල ඇති කරමු. ඒවායින් මහා ආලෝකයක් ඇති වේවි. ඒ ගිණිමැල අවුළුවන්නේ අපේ (ඉස්ක්‍රාව හෙවත්) 'ගිනි පුපුර'යැ" යි ව්ලදිමීර් ඉල්යිච් කීවේය.

"කවුද දන්නෙ, එහා ඉවුරේ ඉන්න ඒ කොල්ලො සමහර විට විප්ලවයට හවුල් වෙලා රුසියාව පුරා මහා ආලෝකයක් ඇති කිරීමට තරම් වාසනාවත් ඉරණමක් ඇති අය වෙන්ට පුළුවනි" යැයි ලෙපෙෂින්ස්කි කීවේය.

අඳුර පැතිර යත්ම ගිනිමැලවල සංඛ්‍යාවද වැඩි විය. වියලි අතු සොයා ගෙන'වුත් ගිනි මැලවලට විසි කරන කොල්ලෝ අළු පිසදමති. ඉවුර අසල ගිනි මැල තරු මෙනි. අඳුර මකා ආලෝකයක් ඇති කිරීමට ඒ ගිනිපුපුරු සමත්විය.

පලා ගිරව් නැවත ගයන්නට වූහ. යහපත් කාලගුණයක අනාවැකි කියන්නා සේ මඳුරුවෝ හඬ නැගූහ.

## අඳුරු රැය



එය 1907 දී පින්ලන්තයේ සිදු වූවකි.

දෙසැම්බර් මාසය වුවද හරි හැටි සීත සෘතුව නොතිබිණ. නිරිත දිගින් හමන සුළං බොට්නික් මුහුදු බොක්කේ ජලය වසා ඇති ලපටි හිම තට්ටු පුපුරවයි. හිමෙන් වැසී ඇති කුඩා හා සිහිති දූපත් දහස් ගණනක්, හදිසියෙන් දිය මිදී හිම බවට පත්වූ රැල්ලක් සිහි කරවයි.

අබෝ නගරයේ සිට මේ දූපත් හරහා වැටී ඇති පාරක් ඔස්සේ අශ්වයෙක් හිම යානයක් ඇද ගෙන දුවයි. අසු දක්කනු ලබන්නේ පින්ලන්ත ජාතික වික්ටර් කාර්ල්සන් විසිනි. ඔහු ලිල්මේලො දූපතට මිනිසකු ගෙනගියේය. ඒ මිනිසා රුසියානු සාර්ගේ සතුරකු බවත්, සාර්ගේ පොලිසියෙන් සැඟවී සිටින බවත් කාර්ල්සන් දැන සිටියේය. හිම යානයේ වාඩි වී සිටින ඒ පුද්ගලයා ගැන ඔහු දැන සිටියේ එපමණකි.

ඔහු අන් කිසිවකු නොව ව්ලදිමීර් ඉල්යිච් ලෙනින්ය.

ලෙනින් සොයා වහාම සිරභාරයට ගත යුතු යැයි පොලිසියට අණ කර තිබිණි. හදිසියෙන්ම රටින් පිටවීමට ලෙනින්ට සිදු වූයේ එබැවිනි.

මාර්ගයේ අවසානය දක්වා ගමන් කළ හිම යානය, කුඩා කන්දක් අසල රතු පාට ගෙයක් ළඟ නැවතිණ.

''උවමනා තැනට ආවා'' යැයි කාර්ල්සන් කීවේ වැදගත් ලීලාවකිනි.

කාර්ල්සන් හිම යානයෙන් බැස, අසු බැඳ තබා ගෙට ඇතුළු වන දොරට පා පහරක් ගසා දොර හැරියේය.

ඔවුන් ඇතුළු වූයේ කුඩා කාමරයකටය. එය පිරිසුදුය. බිම වසා ගත් ලනුපැදුරුද, බිත්ති අලංකාර කළ කාපට්ද එහි දක්නට තිබිණි. ලොකු උදුන ළඟ දිලිසෙන තඹ හැලිකිපයකි. උදුනේ සිට සිලිම දක්වා දිගැති රිටි කීපයකි. පාන් පිටිවලින් සාදන ලද දුඹුරු පැහැති රොටි කීපයක්ම මේ රිටිවල අමුණා ඇත.

එළිපත්ත උඩ සිටගත් කාර්ල්සන් ගෙහිමි බර්ග්මන් සමග පහත් හඬින් යමක් කතා කොට, මගියාට අත දී ආචාර කොට, ගෙහිමියාගේ බිරිඳ දෙස බලා හිස වනා ඉක්මනින් පිටව ගියේය.

Scanned with CamScanner

ගෙහිමියා වාඩි වී සිටි පළල් බංකුවේ වාඩි වූ ව්ලදිමිර් ඉල්යිච් ඔහුගේ උරහිස මත අතක් තබා මෙසේ කීය:

''යාළුවා, මට ඉක්මනින්ම ස්ටොක්හෝම්වලට යන්ට ඕන. කොහොමද ඒක කරන්නෙ?''

දුඹුරු පැහැති වියලි අතු මෙන් වූ තම ඇඟිලිවලින් දුම් පයිප්පයට දුම්කොළ පිරවූ මස් මරන්නා නිහඬව සිටී. දෙකක් එකවර — එනම් දුම්කොළ පිරවීමත් කතා කිරීමත්—නොකළ හැකි බැවිනි, ඔහු නිහඬ වූයේ. අවසානයේදී දුම්කොළ පුරවාගෙන පයිප්පය දල්වා ගෙන දුමක් ඇද පිට කළේය. ඇඟමැලි කඩා දිග ඇදුණු මස් මරන්නා අමුත්තා දෙස සෙමින් බැලීය. ඔහුගේ ශක්තිය තක්සේරු කිරීමට මෙන් බැලූ මස් මරන්නා කතා කළේය:

''දැන් යන්ට බැහැ. පාරවල් නැහැ. පයින් යන්ටත් බැහැ. ඔරුවෙන් යන්ටත් බැහැ. හිම මිදිල තද වෙන කල් ඉන්ට ඕන.''

''තමුසෙ කියනව පයින් යන්ටත් බැහැ. ඔරුවෙන් යන්ටත් බැහැ කියල. එහෙනම් පයින් යන්ට පුළුවන් තැන්වල පයින් යමු. ඔරුවෙන් යා හැකි තැන්වල ඔරුවෙන් යමු, හිම උඩ යන කොට ඔරුව ඇද ගෙන යමු, හොඳද?'' යි ව්ලදිමිර් ඉල්යිච් කීවේය.

''ඒක කරන්ට බැහැ. හිම තට්ටු තුනීය. මිනිහෙකුගෙ බර උහුලන්ට තුනී හිම තට්ටුවලට බැහැ. ඔරුව පදින්ටත් බැහැ වතුර හොඳටම කැටි ගැහිල'' යැයි මුරණ්ඩු ලෙස මස් මරන්නා කියා සිටියේය.

පසුද ව්ලිදිමිර් ඉල්යිච්, ගෙහිමි මස් මරන්නා අවදිවනවාත් හා සමගම අවදි වී මුහුණ සෝද ගෙන ජනේලය අසල මේසය ළඟ වාඩි වී, සටහන් පොතක් දිගහැර බලන්නට විය.

නොඋස් කඳුගැට පෙලක් ජනේලයෙන් එබී බලන විට පෙනේ. තනි ගල්වලින් සැදී ඇති කඳු ගැට දූපත් මෙනි. ගල් පලාගෙන මතුවී ඇත්තාක් මෙන් පස් රහිත ඒ කඳුගැට මත ගසක් හෝ දෙකක් දැකිය හැක. වැලි හෝ පස් හෝ නැති ගල් මත එවැනි ගස් හැදී වැඩුනේ කෙසේද? සුළඟට ගසාගෙන ගිය මල් ඇට පිපිරී හෝ ඉරිතැලී ඇති කඳුවල කුඩා කුහරයන්වලට සහ වලවල්වලට වැටී, කාලගුණය මැඩ ශක්තිමත් ව වැඩී ඇත. දැන් කිසිම කුණාටුවකට මේ ගස් උදුරා දැමීමට බැරිය.

කුස්සියේ සිටි බර්ග්මන් නිදන කාමරය දෙස එබී බලමින් කාර්ල්සන් තමාට කී දේ සිහියට නගා ගෙන මෙසේ සිතයි: ''සාර් රජුගේ ලොකුම හතුරා මේ මිනිහද? බැලූ බැල්මට සාමාන්‍ය මිනිහෙක්. මේසය ළඟ ඉඳගෙන වම් උරය පහත දමා ගෙන මොනවදෝ ඉක්මනින් ලියනව. ඔහුගේ විශාල හිස ඉස්සරහට නැමිල. කුණාටු හමන හඬවත්, රළ වේගයේ ගෝසාව වත් එයා ගණන් ගන්නේ

නැහැ. ලිවීම නවත්වල එයා සටහන් වගයක් දෙස බලනව. හීතල වුණු ඇඟිලි උණුසුම් කරගන්ට දැත් කිහිලි තුළ ඔබා ගන්නවා. ආයෙමත් ලියන්ට පටන් ගන්නවා.''

දෙමහල්ලෝ උදේ කෑමට සූදනම් වෙති. ගෙහිමි ගැහැණිය කෝපි බඳුනක් මේසය මත තැබුවාය. රිටිවල ගසා තිබුණු රොටී කීපයක් ගළවා ගත්තාය.

''එන්න, කෝපි ටිකක් බොමු'' යැයි ගෙහිමියා ලෙනින්ට ආරාධනා කරයි.



ලෙනින් කුස්සියට පැමිණ කරුණාවත් ලෙස මඳ සිනාවකින් ඔවුන් දෙස බලා වාඩි වෙයි. මස් මරන්නාගේ ජීවිතය ගැන මහත් ඕනෑකමකින් හා සැලකිල්ලකින් ඔහු තොරතුරු අසයි. ගල් කඳු මත වගා කිරීමට ඉගෙන ගත්තේ කොහොමද, එහි වැවෙන පැලෑටි වර්ග මොනවාද, සැහෙන්ට මාලු අල්ලන්ට පුළුවන්ද ආදී ප්‍රශ්න ලෙනින්, බර්ග්මන්ගෙන් ඇසීය. වැඩි කතා බහ නොකරන ගෙහිමි කාන්තාවද ඔහු සමග කතා කිරීමට කැමැත්තක් දැක්වූවාය.

*

ලෙනින් දවස් කීපයක්ම බර්ග්මන්ලාගේ ගෙදර නැවතී සිටියේය. මීට වඩා පමාවීමට බැහැ. හදිසියෙන්ම කළ යුතු වැඩ කටයුතු ගොඩකි. කෙසේ හෝ වහාම ස්ටොක්හෝම් නගරයටද ඉන්පසු ස්විට්සර්ලන්තයටද යා යුතුය. එහි සිට, අනාගත විප්ලවවාදී සටන් සඳහා සූදනම් වන රුසියානු කම්කරු පංතිය හා පක්ෂය සමග සබඳකම් ඇති කර ගත යුතුය.

විඩා පත්වූ ඔහු ඒ ගෙදර තවත් දෙදිනක් නැවතී සිටියේය.

සිරිත් පරිදි උදෑසන ''කොහොමද හිම?'' යන ප්‍රශ්නය අසන ලදී. ''හිම තට්ටුව තවම තුනීය. සුළං හමන දිසාවත් වෙනස් වෙලා නැහැ. අළුත් අවුරුද්ද පසු වන තුරු යන්ට ලැබෙන්නෙ නැහැ. තව සුමානෙකින් නත්තල් උත්සවය. ඉතින් ඔය උත්සව දවස්වලට ගමන්වලට පිටත් වෙන්නෙ නැහැ නෙවැ'' යි බර්ග්මන් කීය.

''බැහැ. නත්තලට ඉස්සෙල්ල මට ස්ටොක්හෝම්වලට යන්ට ඕන. අපි හෙට පිට විය යුතුමයි. ඔව්, හෙටම!'' යැයි ස්ථිරලෙස ලෙනින් කියා සිටියේය.

තම වැඩවල යෙදී සිටි මස් මරන්නා පිළිතුරු නොදී නිහඬ විය.

දවල් ආහාරයෙන් පසු හෙතෙම තම ගබඩාවෙන් පැතැලි ඔරුවක් ගෙන එයට උවමනා උපකරණ එකතු කළේය. අඩි එක හමාරක් පමණ උසැති රිටි දෙකක් ඔරු කඳේ දෙපස හබල් පාසවලට ඉදිරියෙන් සවි කොට හරස් පොල්ලක් ඒ රිටි දෙක අතර තබා බැන්දේය.

ගමනට සූදනම් බව හෙතෙම හවස ලෙනින්ට දන්වා සිටියේය. හිමිදිරි පාන්දර පිටත් වෙන්ට ඕන. හිර පායන්ට ඉස්සෙල්ලා ජනපද පසු කර යන්නට ඕන. අයිස් කඩන නැව නිසා සෑදෙන දිය පාර වෙත යාමට පමා නොවිය යුතුය. ලෙනින් හැඳ සිටි හම් සපත්තු දෙස උදසීන ලෙස ඔහු බැලුවේය. පසුව කොහේදෝ ගොස් මස් මරන්නකුගේ සපත්තු කුට්ටමක් ගෙනැවිත් ලෙනින්ට දුන්නේය.



... රාත්‍රිය ගෙවීයාමට ඇත්තේ දෙපැයකටත් වඩා අඩු කාලයකි. ගෙහිමි කාන්තාව මාළු, රොටී සහ කෝපි ඔවුන්ට දුන්නාය. කෝපි උගුරක් දෙකක් බී, නැගිට සිටි ලෙනින් ගෙහිමි කාන්තාව වෙත ගොස් ඇයට අත දී ආචාර කළේය:

''බොහොම ස්තුතියි, ඔහෙලගෙ උදව් උපකාරවලට බොහොම ස්තුතියි!''

සීත සමයේ උතුරු දිග හිරු එළියට සම කළ හැකි මඳ සිනාවක් පෑ ගෙහිමි කාන්තාවද ඔහුට ආචාර කළාය.

*

මුහුදේ යාත්‍රා කරන නැව් අනතුරු හඟවන සංඥ පිට කරති. මීදුම අතරින්, සඳ එළිය බොට්නික් මුහුදු බොක්කේ අඳුර මඳවශයෙන් නැති කරයි.

දෙපසින් හරස් පොල්ල අල්ලාගත් දෙදෙනා ඔරුව තල්ලු කරති. හිම දිගේ ඉදිරියට ඇදෙන ඔරුව හඬක් නගයි. පාවහන් විදගෙන සීත ඇඟට කාවැදෙයි. ලෙනින් දකුණ'තින් හරස් පොල්ල අල්ලා ගෙන, වම'තින් මස් මරන්නාගේ ලන්තෑරුම ගෙනයයි.

බර්ග්මන් තමා පමණක් දන්නා හොර පාරක් දිගේ ඔරුව තල්ලු කරමින් ගමන් කරයි. අඩි පනහක් හැටක් යන ඔහු නැවති උලක් ගෙන හිම තට්ටුවේ ඝනකම මැන බැලීමට මෙන් ඇන බලයි. හිම තට්ටුව කැඩෙන සේ අනින විට ඔහු ''යාහ්'' යන හඬක් නගමින් කෑගසයි. ඉන්පසු නැවත ඔරුව තල්ලු කරයි.

උතුරෙන් හමන සුළං පහර කෙමෙන් ප්‍රචණ්ඩ වෙයි, ඉදිමී ඇති මුහුණුවල වේදනාව තවත් උත්සන්න කරමින් එය පහර දෙයි. දැඩි හිම පතනයකි.

මෙතෙක් ගමන් කළ දුර ප්‍රමාණය හැතැප්ම එකහමාරක් පමණ වේ. එහෙත් දෙදෙනාම විඩාපත් වී සිටිති. නළලෙන් වැගිරෙන දහඩිය බිංදු නිසා දැස් වැසියයි.

අරුණෝදය අළු පැහැතිය, නොපැහැදිලිය. එතරම් දුබල එළියක් නිසා දවල් කාලය ආලෝකමත් වේයැයි සිතිය නොහැක.

දූපත් අතර හිමෙන් වැසීගත් පරතෙරය වඩාත් පළල් වෙයි. එක් දූපතක් ඉදිරිපිට හිම කැටි සහිත දිය පාරකි. දෙදෙනා පළමුවැනි වරට ඔරුවට නැග

Scanned with CamScanner

හබල් ගැසීමට පටන් ගත්හ. ඊළඟ දූපතේ හිම සීමාවට පැමිණි පසු නැවත ඔරුව තල්ලු කිරීමට පටන් ගත්හ.

''දැන් ඉතින් අනිත් වෙරළට යා යුතුයැ'' යි අතක් දිගු කරමින් බර්ග්මන් තමා ඉදිරියෙහි වූ වෙරළ පෙන්විය.

මිදුනු දිය අයිස් බවට පත්ව මාර්ගයක සේයාවක් ගෙන ඇත. ඒ මත හිම වැටිලාය.

හරස් පොල්ල නැවත අල්ලා ගෙන බර්ග්මන්ගේ ක්‍රියාවට අනුකූල වන සේ ගමන් කරන ලෙනින් ඈත බැලීය. 

''අපි හුඟාක් දුර ගියෙමුද?'' යි ඔහු ඇසීය.

''දුර ප්‍රමාණය අනුව බලන විට බොහෝ දුර ගියා. ඉදිරියට ඇති මහ පහු කළ මහට වඩා අමාරුයැ'' යි බර්ග්මන් පිළිතුරු දුන්නේය.

දැන් ඔහු පෙරටත් වඩා නැවති, නැවති ''යාහ්'' හඬ නගමින් උලකින් ඇන හිම තට්ටුවේ ඝනකම මණී. සමහර විට එම හඬ අනතුරු හැඟවීමක් පළ කරයි. තවත් විටෙක එය ප්‍රශ්නයක් අසනා පිළිතුරක් කියාපායි, තවත් සමහර විටෙක එය බැණ වැදීමක් වැන්න.

විශාල හිම තට්ටුවක් මත ඔරුව තල්ලු කරමින් සිටි ලෙනින් දෙපා බිම ගසා දැත් හිස වටා යවා ආශ්වාස — ප්‍රාශ්වාස කිරීමට පටන් ගත්තා පමණි. ඔහුගේ එක් පයක් හිම බිඳගෙන ගොස් දියට ඇතුළු විය.

ඔරුවේ හරස් පොල්ල තදින් අල්ලා ගත් ලෙනින් දකුණු කකුල දිගහැර, එයට වාරු වෙමින් වම් කකුල ඇද ගැනිමට උත්සාහ දරත්ම, දකුණු කකුලද හිම තට්ටුව බිඳ ගෙන වතුරට වැටිණ. සපත්තු වතුරෙන් පිරී ගියේය. රිට දෙදරුම් කැවේය...

හිම කැට විසිර යන්නට වූයෙන් පය ගැසීමට පවා තැනෙක් නොවිය. අවදනම අති විශාලය!

ලෙනින් තම සගයා දෙස බැලීය. ඔහුගේ මුහුණ අඳුරු වී ගොසිනි, දෑස් වටකුරු වෙලාය. ඉහටිය දක්වා දියට යටවී සිටි ඔහු හති දමන්නට විය.

''ඔරුවට නගිනව! ඉක්මනට ඔරුවට නගිනව.''

කවුද එහෙම කීවෙ? සමහර විට බර්ග්මන්ට නොඇසුනාද?

දෙදෙනාම රිට අල්ලා ගනිමින් ඔරුවට ළං වූහ. රිට නැමී 'ක්‍රික්' යන හඬක් නැගිය. එකවර ඔරුකඳ අල්ලා ගත් දෙදෙනා ඔරුවට නැග ගත්හ.

තමා වෙව්ලන සැටි ව්ලදිමීර් ඉල්යිච් ලෙනින්ට දැනේ. වේගයෙන් එක'ටෙක ගැහෙන දත්වලින් පිටවන ශබ්දය නවත්වා ගැනිමට තරම් ඔහුට ශක්තියක් නැත. එහෙත් බලාපොරොත්තු රහිතව හෙතෙම හඬ නගමින් සිනා සුනේය.

''වතුර හොඳටම සීතලයි නෙව...''

වෙව්ලන අත්වලින් බර්ග්මන් ලොම මිටියක් තුළ තිබූ හම් සපත්තු දෙකක් ගෙන ලෙනින්ට දුන්නේය. සපත්තු කුට්ටම ගිනි උදුනකින් ගත්තාක් මෙන් උණුසුම්ය. ඒවා තුළ උණුසුම් මේස් කුට්ටමක්ද විය. ලොමින් කළ ඒ මේස් කුට්ටම බර්ග්මන්ගේ බිරිඳ විසින් තෑගි කරන ලද්දකි. තම සගයාගේ කරුණාබර බැල්ම දුටු මස් මරන්නා හිස හරවා අනෙක් පැත්ත බැලීය.

මේස් කුට්ටම අතට ගත් ලෙනින්, බර්ග්මන්ගේ ඇඳුම් තෙමී ඇතිදැයි ඇසීය. නැත. ඔහු තෙමී නැත. ඔහු ඇඳ සිටි කබාය විදගෙන වතුර ඇතුළු නොවෙයි. එය 'ටර්පාවුලින්' කබායකි. සපත්තුද එසේමය. තෙත සපත්තු ගළවා දමා උණුසුම් මේස් හා සපත්තු හැඳ ගත් ලෙනින් උණුසුම් වීම පිණිස වේගයෙන් දෑත් වැනීය.

බර්ග්මන් ඒ අතරතුර, ලොම් මිටිය තුළ තිබූ කෝපි බෝතලය සෙමින් ගෙන, ප්‍රවේසමින් එහි පියන හැර, කෝප්පයකට කෝපි වත් කළේය. කෝපි කෝප්පයෙන් වාෂ්ප පිට විය.

උණු කෝපි උගුරක් බීව් ලෙනින් ''හරිම අනර්ඝයි!'' කියේ ප්‍රීතියෙනි.

මෙසේ උණුසුම් වී දෙදෙනා නැවත ඔරුව තල්ලු කරමින් ගමනට පිටත් වූහ. ඔහු දියට වැටිණ. නැවත හිම ගොඩකට නැග ඔරුව තල්ලු කරන්ට විය.

නාගු දූපත වෙත යාමට තව ඉතිරිව ඇත්තේ හැතැප්ම කාලක පමණ දුරකි. අබෝ නගරයේ සිට ස්ටොක්හෝම් බලා යන නැවක් එන තුරු එහි සිටිය යුතුය.

අන්තිම යාර සිය ගණන අතිශයින්ම අමාරුය. හිම කඩමින් ගිය නැව තැබූ මාර්ගය දීප්තිමත්ව පෙනෙන්නට විය. තවත් ධෛර්‍ය උපදවා ගෙන දුරගෙවා ගොස්, ඔරුවෙන් බැස ගත් සගයින් දෙදෙනා නැව එන තුරු බලා සිටියහ.

ඔරුවට සවිකොට තිබූ රිටි හා හරස් පොල්ල ගළවා දැමූ බර්ග්මන් ලෙනින්ට ආයුබෝවන් කී පසු ඔරුව තම මිත්‍ර මස්මරන්නෙකුගේ ගෙදර තබනු ඇත. ඔහු තම නිවසට පැමිණෙනු ඇත.

තුමාරය තුනී වී ගියේය. අළු පාටට පෙනුණු හිම තට්ටු දැන් කොළ පාටය. දහවල් විය.

ලෙනින් හා බර්ග්මන් නැව එන තුරු ඊසාන දෙස බලා සිටිති.

දූපතට උතුරු දෙසින් දුම් දමමින් එන නැව, පටු මුහුදු තීරය නිසා පෙනෙන්නේ මහා යෝධයෙකු මෙනි. දෙදෙනාම කර වටා ඔතා තිබුණු 'මප්ලර්' ගළවා වේගයෙන් වනන්නට වූහ. නැව ඔවුන් දිටිය...

නැවියන් සහිත සුලුප්පුවක් නැවේ සිට දියට බාන ලදී.

ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් මස් මරන්නාගේ දෑත අල්ලා ගෙන සිට, පසුව ඔහුගේ උරහිස වැරෙන් අල්ලා සිප ගත්තේය.

''සුබ ගමන්, සුබ ගමන්!'' යැයි බර්ග්මන් සෙමින් කීවේය.



Scanned with CamScanner

විප්ලවය ජය ගන්නේය.



Scanned with CamScanner

විප්ලවවාදී ආණ්ඩුවේ පළමුවැනි
කාර්යාලය.



Scanned with CamScanner

ගොවීන්ගේ අදහස් දැනගැනීම, ඔවුන්ගේ ජීවන තතු දැනගැනීම ඉතා වැදගත්ය.



Scanned with CamScanner

''ජීවිතය අනර්ඝය!'' විප්ලවය සිදුවී මාස කීපයකට පසු ගත් ඡායාරූපයකි වේ.



Scanned with CamScanner

දවස පටන්ගන්නේ පුවත්පත් වලිනි. ලෝකයේ හා රටේ පුවත් මොනවාද ? ක්‍රෙම්ලින්හි කර්යාල කාමරයේදී මේ ඡායාරූපය ගන්නාවිට ලෙනින් නොදැන සිටියේය.



Scanned with CamScanner

ලෙනින් මරා දැමීම සඳහා විෂකැවූ වෙඩි උණ්ඩ වලින් වෙඩිතබන ලදී. තුවාල වලින් සුවය ලබමින් සිටියදී ලෙනින් ක්‍රෙම්ලින් උයනේ ඇවිදියි. 1918 ඔක්තෝබර් මාසය.





Scanned with CamScanner

"හොඳයි, පින්තූර ගනිල්ලා!"



Scanned with CamScanner

ලෙනින්ගේ පොත්ගුල පොත් දහසකින් යුක්ත විය. ජර්මන්, ප්‍රංශ හා ඉංග්‍රීසි භාෂාවන් ඔහු ඉතා හොඳින් දැන සිටියේය.



Scanned with CamScanner

**එන්. හොඩ්සා**

## ලුහුබැඳීම



මා මේ කියන්ට යන්නේ එක්දස් නවසිය දහහතේදී සිද්ධ වුණ දෙයක් ගැනයි. එක් දහස් නවසිය දහහතේ ජූනි මාසයේදී මම යුද්ධ රථ අංශයක, රිය පදවන රක්ෂාවක් කෙළෙමි.

දවසක් ද රෑ අපේ යුද්ධ භටයින්ගේ නියෝජිතයින් රැස්වන තව්රිචෙස්කී මාළිගයට මම ගියෙමි. රථයේ ඇන්ජිම නවත්වා බලා සිටියේ, නියෝජිතයින් සෙබළ නිවාසවලට ගෙනයාමට මට නියම කර තිබුණු බැවිනි.

රැස්වීම අවසාන විය. ඇන්ජිම ක්‍රියා කරවූ මම සූදානම්ව සිටියෙමි.

මා හමුවීමට අපේ ඩිවිෂන් කමිටුවේ සභාපති දුවැ විත් මෙසේ කීය:

''පක්ෂයේ නියෝගයක් පිළිපැදීමට තමුසෙට භාර කරනව.''

''මොකක්ද නියෝගය?'' මම ප්‍රශ්න කෙළෙමි.

''මෙන්න මෙකයි. දැන් වෙලාව දෙළහයි, නෙවද?''

''ඔව්. දෙළහයි, ඊළඟට?''

''තව විනාඩි දහයකින් මම උඹේ රථයේ සහෝදරයෙකුව් වාඩි කරවනව. ඒ සහෝදරය කියන තැනට එයාව ගෙනියනව, තේරුණද?''

''තේරුණ. ඒ සහෝදරයාගෙ නම කොහොමද?'' යි මම ඇසුවෙමි.

එවිට අපේ සභාපති තැන කෝප වී උස් හඬින් කතා කරන්නට විය:

''කතා නවත්වනව. පක්ෂයේ නියෝගයක් ලැබුණානම් ඒක ඉටු කරනව. ඒ සහෝදරයට අනතුරක් උනොත් උඹට ඉසාකියෙව්ගෙ පල්ලියට යන්ට සිද්ද වේවි'' යැයි සභාපති කීවේය.

''මොන කාරණාවකටද මම පල්ලියට යන්නෙ?''

''තමුසෙගෙ මළගමට ඕඩරයක් දෙන්න. ඔව්, තමුසෙ විහින්ම. දැන් තේරෙනවද?''

සභාපති ආපසු ගියේය.

විස්මය පත්වූ මම සහෝදරයා එනතුරු බලා සිටියෙමි. ඇන්ජිම හඬ නගයි. අපේ සභාපති සමග සිවිල් ඇඳුමෙන් සැරසී ගත් කෙනෙක් මා වෙත එන සැටි දුටුවෙමි. ඔහු අත කැප් තොප්පියකි. ඔවුන් ළංවෙත්ම මට ඉබේටම 'ආහ්!' කියැවිණ. මා ළඟට ආවේ ව්ලදිමිර් ඉල්යිච් ලෙනින්ය. මීට පෙර මා ඔහු දැක

තිබේ. ඔහු කතා කරනවා අසා තිබේ. ක්ෂෙෂින්ස්කි මාළිගයේ සඳලුතලයේ සිට ලෙනින් කතා කළ සැටි මම දුටුවෙමි. එය අමතක කළ හැකිද?!

මා අසළින් වාඩි වූ ලෙනින් ආචාරශීලී ලෙස මෙසේ කීය:

''සහෝදරය, කරුණාකරල ඉස්සෙල්ල මොයිකාවලට, ඊට පස්සෙ ලිගෝව්කාවලට යන්න. පුළුවන්නම් ඉක්මනට.''

මහ සළකුණු කීමට උවමනාවක් නැත. මගේ රථය ඉතා හොඳ තත්ත්වයක තිබිණ. ඉක්මනින්ම අපි මොයිකාවලට ආවෙමු. බොල්ෂෙවික් පක්ෂයේ 'ප්‍රව්ද' පත්‍ර කාර්යාලය එහිය.

ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් පත්‍ර කාර්යාලයේ විනාඩි කීපයක් ගත කොට නැවත රථයට ඇතුළු වී වාඩි විය. නගරයේ අනිත් කෙළවරට — ලිගෝව්කා වලට — අපි යමින් සිටියෙමු.

ලෙනින් සහෝදරයා දෙස තව වරක් බැලීමට මට සිතුණි. හැරී ඔහු දෙස බලන විට අප පස්සේ එන රථයක් මගේ ඇසට ලක්විය.

මා රථය වමට හරවන විට, පස්සෙන් එන රථයද වමට හරවයි. දකුණට හරවන විට ඒ රථයද දකුණට හරවයි. එය මගේ සිතට නොරිසි විය. රථයට ළංවීමට මම ඉඩ දුන්නෙමි. ඒ යුද්ධ නිලධාරීන්ගේ රථයකි. රිය පදවමින් සිටියේ යුන්කරයෙකි!

වේගයෙන් රථය පදවන්නට වූ මම නිතර පිටුපස හැරී බලමින්, පස්සෙන් එන රිය පමා වන්නේද යන්න සොයා බැලුවෙමි.

මගේ හැසිරීම දුටු ලෙනින් සහෝදරයා කුතුහලයෙන් යුතුව ප්‍රශ්න කළේය:

''සහෝදරයට මගෙන් මොනව හරි අහන්ට තියෙනවද?''

''පිටිපස්ස හැරිල බලන්න, ලෙනින් සහෝදරය!'' යැයි මම පිළිතුරු දුන්නෙමි.

හැරී බැලූ ව්ලදිමීර් ඉල්යිච් මෙසේ කීය:

''කාර් එකක් එනව පේනව. වෙන දෙයක් පෙනෙන්ට නැහැ...''

''සහෝදරය, අපේ පස්සෙන් 'හොල්මන්' එනවා'' යැයි මම පැහැදිලි කළෙමි.

''මොන 'හොල්මන්'ද?''

''සාමාන්නිය හොල්මන්. කෙරෙන්ස්කිගෙ ආරක්ෂක හමුදාවෙ නිලධාරියො. අප පස්සේ ලුහු බඳිනව.''

''අපට උන්ගෙ ඇස්වලට වැලි ගහලා යන්ට පුළුවන් වෙනවට මම සැක කරන්නෙ නැහැ. සහෝදරය කෙරෙහි මම විශ්වාසය තබනව'' යැයි ලෙනින් කීවේය.

ඒ කතාවට පසු මා තුළ සිදුවූ වෙනස විස්තර කිරීමට උවමනා නැතැයි සිතමි.

මා කොතරම් වේගයකින් රථය පැදවීදයත්, රෝද මහ පාරට ඉහළින් ඉගිලෙන් නාක් මෙන් දැනිණ. රථය ඉගිලෙන්නට විය. ''බ්රේක් විතරක් හරියට වැඩ කරන්ට ඕන. නැතිනම් මීළඟ වංගුවෙදී...'' එවැනි හැඟීම් ඇතිවූ නිසා මා කැළඹීමට පත් විය. මන්ද, මා සමග ගමන් කරන්නේ ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් බැවිනි!

පිටුපස හැරී බැලීම නතර කළ මම වේගයෙන් රථය පැදවීමි. ලෙනින් සහෝදරයා කතා කරනවා මට ඇසිණ:

''උනුත් වේගයෙන් එනවා. සහෝදරය තව හයියෙන් පාගන්ට... උන්ගෙන් ඈත් වෙන්ට... කොහොමහරි ඈත් වෙන්ට ඕන!..''

දැන් මා රිය පදවන්නේ හැකිතරම් වේගයෙනි. නිළධාරීන්ට අපට ළංවීමට බැරි බව මගේ රියැදුරු ඉවෙන් මට දැනෙයි. ඔවුන්ට බැරිය. එහෙත් ඔවුන් අප லුහුබැඳීම නවත්වා නැත. නිළධාරීන්ගේ රථයේ හඬ ළං ළංව ඇසේ...

අපි ලිගෝව්කාවට පැමිණියෙමු. පටු මගකට රථය හැරවූ විට, එහි හරිමැද වලක් හාරා, වැටකින් කඩුල්ලක් සාද, කණමැදිරි එළියක් වැනි පහනක් එහි එල්ලා තිබෙන සැටි දුටුවෙමි.

සැණෙකින් මට අදහසක් ඇති විය. රථය නවත්වා, පිටතට පැන වැටට පයින් ගසා පහන නිවා දමා, රථය පැදවීමි. වේගය වහාම වැඩි කිරීමට නොහැකි වුවද, පටු මගෙන් පිටවන විට මහ ශබ්දයක් ඇසිණ. මා සිතූ සැටියෙන්ම සිදු විය. නිළධාරීන්ගේ රථය වලට වැටී ඇත. මම රථය පැදවීමි.

නිලධාරීහු කෑගසති, යටි උගුරෙන් කෑගසති, කුණුහරුපයෙන් බැණ වදිති. රියැදුරා නළාව හඬවයි. ගෙවතු අතුගාන්නෝ උරුහන් බාති. මුළු පීටර් බූර්ගයටම ඇසෙන සේ කෑගසති.

වැඩි වෙලා ඒ 'සංගීතයට' ඇහුම් කන් නොදුන් අපි, කිසි අමුත්තක් නොවූ ලෙස සාමාන්‍ය වේගයකින් රිය පදවා ගෙන ගියෙමු. ලිගෝව්කාවට ආ පසු මම තව වරක් ලෙනින් සහෝදරයා දෙස බැලුවෙමි. ඔහු මා දෙස බලා මහ හඬින් සිනාසෙන්නට විය. ලෙනින් කොතරම් හඬින් සිනාසුනේදයත් මටද සිනානොවී සිටිය නොහැකි විය.

මෙසේ සිනාසුණු අපි යා යුතු තැන බලා පමා නොවී කරදරවලට මූණ නොපා ගියෙමු.



Scanned with CamScanner

**පී. කාපිට්ස**



## අවිගත් නැගිටීම

(සංක්ෂේපයකි)

රුසියාවේ පැරණි දින දර්ශනය අනුව ඔක්තෝබර් 24 ද ආයුධගත් නැගිටීම ඇති විය. එදින උදෑසන සිටම ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් කැළඹීමට පත්ව සිටියේය. එක්රැස් කර ඇති විප්ලවකාරී හමුදුවල සංඛ්‍යාවද, ඒවා යැවිය යුතු තැන්ද ඔහු දැන සිටියේය. එසේවුවද ඔහු සන්සුන්ව නොසිටියේය. ''සහෝදර වරු තීරණාත්මක ලෙස කටයුතු කරාවිද?'' යන ප්‍රශ්නය ඔහු නිතර ඇසුවේය. ආයුධගත් නැගිටීම වර්ධනය වන සැටි විනාඩියක් පාසාම දැන ගැනීමට ඔහුට උවමනා විය.

උදෑසන ඔහු මර්ගරීතා වසීලෙව්නා පොපානවා වීබොර්ග් දිස්ත්‍රික්කයේ පක්ෂ කාර්යාලයට පිටත් කර හැරියේය. එහි ගොස් සියලු කටයුතු ගැන දැන ගන්නා ලෙසත්, මහ පාරේ සිදුවන දේ ගැන විමැසිල්ලෙන් බලන ලෙසත් ඇට කියා සිටියේය.

වාර්තා කිරීමට තරම් දෙයක් පොපානවා දුටුවාද? එද අඟහරුවාදය, සාමාන්‍ය දවසකි. සියලුම ආයතන හා ව්‍යාපාර තම කටයුතුවල යෙදී සිටි අතර කඩ සාප්පු සියල්ලද බාබර් සාප්පු සහ සිනමා ශාලාද විවෘත කර තිබිණි. වෙනදට වඩා අඩුවෙන් ට්‍රැම්රථ දුවන බව පෙනිණ. එහෙත් වෙනදට වඩා වැඩියෙන් යුදබටයින් යන — එන සැටිද දැකිය හැක.

නිකොලායෙව්ස්ක් යාන්ත්‍රික පාලම දෙබෑ කොට තිබෙන බව දවල් වන විට දැන ගන්නට ලැබිණි. පොපානවා රැකියාව කළේ වසීලෙව්ස්ක් දූපතේය. එහි සිට වීබොර්ග් පෙදෙසට පැමිණීම සඳහා ඇයට විශාල දුරක් ගෙවා ග්‍රෙනාදර් පාලම හරහා යාමට සිදු විය. අනිකුත් මාර්ග සියල්ල අසුරා, වසා දමා තිබිණි.

නෙවා ගඟ හරහා මගීන් ගෙනයාම ඔරුකාරයින් විසින් කරන ලදී.

කැළඹුණු සිත් ඇති ලෙනින් බොරු කොණ්ඩයද නොපැළඳ කොරිඩෝරය දිගේ ඇවිදින්නට විය.

''කොහොමද මහ පාරෙ තත්ත්වය? මොනවද වෙන්නේ?'' පොපානවා පැමිණි විගසම ඇගෙන් ඇසුවේය.

එහෙත් පැහැදිලි පිළිතුරක් දීමට ඇයට බැරි විය. ආයුධ ගත් සේනාංක ඈ දුටු බව ඇත්තය. එහෙත් ඒ සේනාංක විප්ලවවාදීන්ගේද නැතිනම් ආණ්ඩු

Scanned with CamScanner

පක්ෂයේදැයි කීමට ඇ නොදනී. ඒවා කාගේ නියෝගය පිට කොහේ යන්නේද? නේවා ගඟ හරහා ඇති යාන්ත්‍රික පාලම් දෙබෑ කොට ඇත්තේ කාගේ නියෝගය අනුවද, මොන පරමාර්ථයක් සඳහා දැයි ඇ නොදන්නීය.

''සහෝදරී ඇඳුම් ගලවන්ට එපා. මේ ලියුම් කැල්ල දිස්ත්‍රික් පක්ෂ කාර්යාලයට ගෙනගොස් බාර දෙන්නැ'' යි ලෙනින් කියා සිටියේය.

එය බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත ලියන ලද ලිපියකි. පොපානවා ඒ ලිපිය වීබොර්ග් දිස්ත්‍රික් කාර්යාලයට ගෙන ගියාය. ඒ කාර්යාලය ස්මෝල්නි ආයතනය සමග කෙළින්ම සම්බන්ධකම් තිබුණු බව පෙනේ. දිස්ත්‍රික් කාර්යාලය ඉක්මනින් පිළිතුරු දුන්නේය. සැඟවී සිටින තැනින් පිටවීමට ව්ලදිමීර් ඉල්යිච් ලෙනින්ට මධ්‍යම කාරක සභාව අවසර නොදෙයි.

''අවසර දෙන්නෙ නෑ'' යි කී ලෙනින් පුදුමයට පත් විය. ''මොකද ඒ ගොල්ල මා නිසා බයවෙන්නෙ? පුදුම උදවිය. මම ඒක ඔහොම අත හරින්නෙ නැහැ. ඒ ගොල්ලන්ගෙ තීරණය වෙනස් කරවන්ට ඕන.''

ලෙනින් කෙටි එහෙත් තද බසින් ලියුමක් ලිවා විය යුතුය. පොපානවා ඒ ලියුම විබොර්ග් දිස්ත්‍රික් කාරියාලයේ ලේකම් තැනට භාර දුන්නාය. රැස්වීම් කාමරයෙන් පිටවූ නදේෂ්ද කොන්ස්තන්තිනොව්නා කෲප්ස්කයා* මෙසේ ඇසුවාය:

''ව්ලදිමීර් ඉල්යිච්ට හොඳටම තරහ ගිහින්ද?''

''ඔව්, හොඳටම තරහ ගිහින්.''

''ඒ උනාට, එයාට කියන්න, පිට වෙන්ට එපයි කියල. එතැන නැවතී ඉන්ටයි කියන්න.''

තමාට කීදේ ඒ විදියටම පොපානවා ලෙනින්ට කිවාය. එහෙත් ඔහු අසතුටකින් පසුවන බවක් ඇයට දැනෙයි.

''ඔය සහෝදරී ආපහු යන්න!'' යැයි ලෙනින් ඉල්ලා සිටියේය. ''පමා උවොත් සියල්ලම විනාශ වේවි.''

''හොඳයි, මම නැවත යන්නම්. හැබැයි එක කොන්දේසියක් උඩ. ඔය සහෝදරය, දවල් කෑම ගන්න. මම බොහොම මහන්සි වෙලා කෑම පිළියෙල කළා. ඔය සහෝදරය නිකමටවත් කටේ තියන්නෙ නැහැ'' යැයි පොපානවා කිවාය.

ලෙනින් සිනාසුනේය.

''හොඳයි, මම කෑම කන්නම්. සහෝදරී තවත් පාරක් එහෙ යන්ට. මම දැන්ම මධ්‍යම කාරක සභාවට ලියන්නම්.''

ඔහු කාමරයට ගියේය. ඇ කුස්සියට ගොස් නැවත ආහාර රත් කළාය.

---

* ලෙනින්ගේ බිරිඳ





Scanned with CamScanner

''සහෝදරවරුනි!'' ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් ඉක්මනින් ලියන්නට විය. ''ඔක්තෝබර් 24 ද සවසය මා, මේ ලියුම ලියන්නේ. තත්ත්වය හොඳටම අවදානම්ය. ආයුධ ගත් නැගිටීම පමා කිරීම මරණයට සමාන බව දැන්නම් හොඳටම පැහැදිලිය.''

ලියුම ලියා අවසන් කළ හෙතෙම කුස්සියට ගොස් ගෙහිමි කාන්තාව වන පොපානවාට එය දුන්නේය.



''රෑ එකොළහට ඉස්සෙල්ලා නාවොත් මම හිතන විදියට ක්‍රියා කිරීමට මට නිදහස තියෙනව. දැන් ඔය ලියුම භාර දීල ඉක්මනින් ආපහු එන්ට'' යැයි ලෙනින් ඇයට කීවේය.

පොපානවා ලියුමත් රැගෙන ගෙදරින් පිට වූවාය. ඇය වෙනුවට ලෙනින් සිටි ගෙදරට පැමිණියේ එයිනො රාහියාය. ලෙනින් අමුත්තා දැක සතුටු විය. තමාත් සමග කෑම ගන්නා ලෙස රාහියාගෙන් ඉල්ලා සිටි ලෙනින්, නගරයේ සිදු වන්නේ මොනවාදැයි ඔහුගෙන් ඇසීය.

විස්තර කිරීමට තරම් දෙයක් රාහියා දන්නේද? ඔහු යුධ — විප්ලව කමිටුවේ සාමාජිකයෙකු නොවේ. සිදුවීම් ගැන විස්තර කළ හැක්කේ විප්ලවයේ ප්‍රධාන කාර්යාලය වන ස්මෝල්නියට පමණකි.

ස්මෝල්නියට ඇතුළු වීම සඳහා අවසර පත් දෙකක් රාහියා ළඟ ඇත. එහෙත් ස්මෝල්නිය දක්වා දැන් යන්නේ කොහොමද? ට්‍රෑම් සේවය ක්‍රියා විරහිත වී ඇත. පයින් යාම ලෙහෙසි නොවේ. හැතැප්ම හතක් පමණ දුර යා යුතුය.

''කොහොම හරි අපි යමු'' යි කී ලෙනින් ඔහු සැනසීය.

පොපානවාට ලියුම් කැල්ලක් ලියා තබා ඔහු ඇඳ ගන්නට විය. වෙස් මාරු නොකොට මහ පාරට බැසීම අන්තරාදායකය. බොරු කොන්ඩයක් පැළඳ, කණ්ණාඩි කුට්ටමක් දමා ගෙන කම්මුලක් වසා රෙදි පටියක්ද බැඳ ගත්තේය. දත් කැක්කුමෙන් පෙළෙනවුන් එවැනි රෙදි පටි කම්මුලක් වසා බැඳ ගනිති. කබල් කැප් තොප්පියක්ද හිස දමා ගත්තේය.

''වෙස් මාරු කළා මදෑ! යමු යන්ට'' යැයි කී ලෙනින්, පහන නිවා දමන ලෙසද කීය.

රාහියා පහන නිවා දැමුවේය. දෙදෙනාම තරප්පු පෙළ දිගේ පහළට බැස්සෝය.

මහ පාරවල් හිස්ය. අන්තිම ට්‍රෑම් රථය ඩිපෝව බලා දුවයි. ලෙනින් දුව ගොස් රථයේ පාපුවරුවට නැග ගත්තේය. රාහියාද අමාරුවෙන් ට්‍රෑම් රථයට ගොඩ විය.

ට්‍රෑම් රථයේ මගීහු නොසිටියහ. ලෙනින් කොන්දෙස්තරවරිය අසල වාඩි

Scanned with CamScanner

වි ඇය සමග කතා කරන්ට විය. රථය කොහෙ යන්නේ දැයි ඇසූ නමුදු, ඇය නිහඬව අඳුරු මාර්ගය දෙස බැලුවාය.

''නිහඬව ඉන්න. සහෝදරය,'' යැයි රාහියා කිය.'' කතා කරනව ඒ ගැහැණිය අහල තිබුණොත්, සහෝදරයව හඳුණා ගනීවි.''

ලෙනින් නිහඬ නොවිය.

''ඩිපෝ එකටද යන්නෙ?'' ඔහු කොන්දෙස්තරවරියගෙන් ඇසුවේය.

ප්‍රශ්න නිසා කිපුණු ගැහැණිය කෙටි පිළිතුරක් දුන්නාය:

''ඔව්, ඩිපෝවට.''

''ඇයි, මොකද?''

''තමුසෙ කව්ද? දැන ගන්ට ඕන ඇයි?''

''මම කම්කරුවෙක්.''

මගියා දෙස සැක සහිත බැල්මක් හෙළූ කොන්දෙස්තරවරිය මෙසේ කීවාය:

''හරිම කම්කරුවෙක්! 'කොහෙද යන්නෙ?', 'මොකද?''' කියල ප්‍රශ්න අහනවා.''මොනවද වෙන්නෙ කියල පේන්නෙ නැද්ද, ධනපතින්ට බැට දෙන්න යනව, ඔන්න යන දිහාව!''

*

දිගැති කෙළින් වීදිය සොහොනක් මෙන් හිස්ය. ගෙවතු අතු ගාන්නන් හා මගීන් නැත. ගෙවල්වලට ඇතුළු වන දොරටු වසා දමලාය. අන්තරාවකින් තොරව ස්මෝල්නිය දක්වා යා හැකි හැඩයි. එහෙත් හිටිහැටියේ එක් මුල්ලක සිට අසරු භටයින් දෙදෙනෙක් එන සැටි පෙනේ. මොනවදෝ කතා කරමින් ඔවුහු ලෙනින් හා රාහියා පසු කර ගියහ. කාලතුවක්කු යුද්ධායතනයක යුන්කර් වරුන් දෙදෙනෙකි.

''සහෝදරය, ඉක්මනින් යන්න. මම උන්ව නවත්වා ගන්ට බලන්නම්'' යැයි රාහියා ලෙනින්ගේ කනට කොඳුරා කීවේය.

අසරු යුන්කර්වරුන් දෙදෙන ආපසු රාහියා වෙත ආහ.

''බලපත්‍රය පෙන්වපන්'' යැයි එකෙක් රාහියාට කිය.

''මොන බලපත්‍රයක්ද?'' යි වෙරිකාරයෙකුගේ වේසයක් ගත් රාහියා ඇද-පැද ඇසුවේය.

මේ අතර ලෙනින් ඉක්මනින් ගමන් කරමින් සිටියේය.

''බලපත්‍රය පෙන්නාපිය නැත්නම්...'' යැයි කී අසරුවෙක් සබුක්කුව ඔසවා ගත්තේය.

''තමුසෙ ඔය තරම්ම ලොකු කෙරුමෙක් නම් ගහනව, ගහනව!'' යැයි





Scanned with CamScanner

කියමින් සාක්කුවට අත දමා රිවෝල්වරය අල්ලා ගත් රාහියා අශ්වයා වෙතට වඩාත් ළංවිය.

බියවූ අශ්වයා අඩියක් පස්සට තබා අයින් විය.

''ඔය බේබද්දව අත හැරල දනව!'' යැයි බියගුළු ලෙස අනෙකා කීවේය.

''ඌ බල්ලට ගියාවෙ... යමු!''

යුන්කර් අසරුවෝ දෙදෙන සබුක්කුවලින් හඬ පිටවන සේ හිසට උඩින් වැනූහ. අසුන් ආපසු හරවාගෙන ලිටේයිනි මහ මගට ගියහ.



ෂ්පලේර්නයා මග ඔස්සේ ගමන් ගත් යහළුවන්ට දුන් ස්මෝල්නි ආයතනය පෙනේ. ඉස්සර වැදගත් තරුණියන් උගත් මේ ආයතනයේ හැම ජනේලයකම දුන් පහන් දැල්වේ. ආයතන භූමියේ ගස් යට යුද්ධ රථ කිපයකි. ගිනි මැළ අසල සොල්දදුවෝ සිටිති. විප්ලවයේ ප්‍රධාන කාරියාලය ක්‍රියාකාරි වී ඇති බව පෙනේ.

දෙවැනි සමස්ත රුසියානු සෝවියට් සභා සම්මේලනයට සහභාගි වීම සඳහා දිස්ත්‍රික්ක වලින් පැමිණි නියෝජිතයෝ ප්‍රධාන දොරටුව අසල රැස්ව සිටිති. මැන්ඩේට් කොමිසමේ මෙන්ෂෙවික් නිලධාරීහු අවසාන මොහොතේදී ඇතුළුවීමේ බලපත්‍ර වෙනස් කළ නිසා පිට පළාත්වල නියෝජිතයින්ට මේ අකර තැබ්බයට මුණ පැමට සිදුවිය.මෙන්ෂෙවික්වරු තමන්ගේ අනුගාමිකයින්ට රතු පාට බලපත්‍ර දී අන් අයට සුදු පාට බලපත්‍ර දුන්හ. රතු බලපත්‍ර ඇති අය පමණක් ඇතුළු කර ගන්නා ලෙස මෙන්ෂෙවික් මැන්ඩේට් කොමිසම මුර භටයන්ට අණ කළේය.

දොරටුව අසල රැස්වූවෝ හඬ නැගූහ, බැණ වැදුණහ.

තමාගේ සුදු බලපත්‍රය වැනූ එක් කම්කරුවෙක් කෑ ගැසිය:

''අවසර නැත්තෙ කොහොමද... නියෝජිතයෙකුව නවත්වන්ට බැහැ?''

මුර භටයාගේ ඇඟේ හැප්පෙන සේ පපුව ඉස්සරහට දුගත් කම්කරුවාට අනිත් අය ධෛර්‍ය දුන්හ.

''මොකද මේ පිස්සුව! උන්ම වරද්ද ගන්නවා. ඊට පස්සෙ අවසර දෙන්නෙ නැහැ. අයින් වෙනව!..''

පිරිස කොරිඩෝරයට තල්ලු විය. ලෙනින්ද ඒ පිරිසෙහි විය.

තරප්පු පෙළ දිගේ ඉහළ ගිය ලෙනින් සිනාසුනේය:

''අපට හැමතැනම යන්ට පුළුවනි!''

තුන්වැනි තට්ටුවට නැග ගත් ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් යුද්ධ-විප්ලවවාදී කමිටුවේ කාමරයට ඇතුළු විය.

ලෙනින් ගේ සැළැස්ම අනුව විප්ලවවාදී කණ්ඩායම් හා සේනාංක ක්‍රියා කරන සැටි සහෝදරවරු ඔහුට දන්වා සිටියහ.

Scanned with CamScanner

එදා රෑ රතු සේනාංක නගරයේ වැදගත් ස්ථානයන් වන දුම්රිය පළවල්, බැංකු, පාලම් හා ටෙලිපෝන් — විදුලි පණිවුඩ ස්ථානද අල්ලා ගත්හ. නැවත අල්ලා ගත් පාලම් ගැනද, හොඳහැටි ක්‍රියා කරන ඔරු සේවයක් ගැනද, ධනපති තාවකාලික ආණ්ඩුවේ අවසාන ගුහාව වන හිම මාලිගය දෙසට සාර්ථක ලෙස ගමන් කරන සේනාංක ගැනද ප්‍රීතිමත් ආරංචි ලැබෙන්නට පටන් ගත්තේය.

උදේ එළිය වැටෙන විට මුළු නගරයම ආයුධ ගත් කම්කරුවන් අත විය. තාවකාලික ආණ්ඩුව සතුව තුබුණේ හිම මාලිගයත් අවට අතුරු පාරවල් කිපයකුත් පමණකි.

මුළු රැයම නොනිදා සිටි ව්ලදිමිර් ඉල්යිච් ලෙනින් උදයවන විට රුසියාවේ ජනතාව වෙත ආයාවනයක් ලිවේය.

පෙත්රොග්‍රාඩයේ ආයුධගත් නැගිටීම ජය ගත්තේය. රාජ්‍ය බලය යුද්ධ-විප්ලවවාදී කමිටුව අතට පත්විය.

ලෝක ඉතිහාසයේ පළමුවැනි වරට ආයුධ ගෙන නැගී සිටි විප්ලවවාදීහු ගුවන් විදුලිය මගින් සියළුම ජනතාව වෙත ආයවනයක් කර සිටියහ.

පැය විසි හතරක් තිස්සේ නොකඩවා පවත්වා ගෙන යන පෙත්රොග්‍රාඩ් සෝවියට් සභාවේ රැස්වීමට එදින උදැසන ලෙනින් පැමිණියේය.

කෙට්ටු වී සිටි ලෙනින්ගේ යටි රැවුලද නොවැඩී තිබිණි. එහෙත් ඔහු හඳුනා ගත් නැවියෝ, කම්කරුවෝ සහ සොල්දාදුවෝ ජය හඬ නගමින්, අත්පොලසන් දෙමින් තම ආදරණීය නායකයා පිළිගත්හ.

නිර්ධන පංති නායකයා කතා මණ්ඩපයට අවුත් සංසුන්වන තෙක් බලා සිට, පසුව පැහැදිලි උස් හඬින් ඇමතීය:

"සහෝදරවරුනි! 'බොල්ෂෙවික්වරුන් අවශ්‍යයැයි නිතර කියා සිටි කම්කරු ගොවිකරු විප්ලවය දැන් ජයගෙන ඇත!"

සමස්ත රුසියානු සෝවියට් සභා සම්මේලනය විසින් පසුදින ව්ලදිමිර් ඉල්යිච් ලෙනින් මහජන කොමසාරිස් මණ්ඩලයේ සභාපති හෙවත් අගමැති පදවියට තෝරා පත් කර ගන්නා ලදී.

Scanned with CamScanner

## සමාජවාදී විප්ලවයේ පළමුවැනි දවස

94

ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජය ගත් පළමු දවස් කීපය තුළදී පෙත්රොග්‍රාඩයේ නොසන්සුන්තාවයක් පැවතිණ. හැමදෙනෙක්ම කිසියම් දෙයක් බලාපොරොත්තුවෙන් උන්හ. ස්මෝල්නියට හැමතැනකින්ම ජනතාව ඇදී ආහ...

බොල්ෂෙවික්වරුන්ගේ ප්‍රධාන කාර්යාලය වන යුද්ධ-විප්ලවවාදී කමිටුව ස්මෝල්නිහි පිහිටා තුබුණි. ව්ලදිමීර් ඉල්යිච් ලෙනින්ද එහි සිටියේය. ස්මෝල්නියට එන හැම කෙනෙකුම සමග ඉතා හොඳින් කතා කරන ලෙනින්, අන් හැම දේකටම වඩා, හිම මාළිගය අල්ලා ගැනීම ගැන තොරතුරු ඇසුවේය.

ලෙනින් ස්මෝල්නියට පැමිණ සිටී යන ආරංචිය බොල්ෂෙවික්වරුන් අතර ලැව් ගින්නක් මෙන් පැතිර ගියේය. ලෙනින් සියැසින් දක ගැනීමට බොහෝදෙනා ආහ. පිට අයද ලෙනින් සිටි කාමරය දෙස එබී බලන්නට පටන් ගත්හ. නොයෙක් පුවත්පත්වල වාර්තාකරුවෝද, විශේෂයෙන් විදේශීය පුවත්පත් වාර්තාකරුවෝද ඔවුන'තර වූහ. ජනතාව විශාල වශයෙන් ස්මෝල්නි ආයතනයට එනු දුටු ඔව්හු ආයුධ ගත් නැගිටීමේ මධ්‍යස්ථානය ක්‍රියා කරන්නේ එහි සිට බැව් අවබෝධ කර ගත්හ.

විශ්වාසදායක ආරක්ෂක ක්‍රමයක් යෙදිය යුතුව තිබිණ.

ස්මෝල්නිහි එක කාමරයක ආයුධ සන්නද්ධ කම්කරුවෝ පන්සිය දෙනෙක් රැස්වූහ. ඔවුහු රතු මුර භටයෝ වූහ.

මුරකිරීම සඳහා මිනිසුන් හැත්තෑ පස් දෙනෙකු තෝරාගැනීමට තීරණය විය.

අවුරුදු තිහක් පමණ වයසැති කඩවසම් තරුණ කම්කරුවෙක් සන්සුන්ව පැහැදිලිව අණ දෙයි. ඔහුගේ හිස් වැස්මට යටින් මුදු මෙන් බොකුටු කෙස් කැරලි නළල මත වැටී ඇත.

"සීරුවෙන්!" යැයි හේ හඬ නගයි.

හැමදෙනම පෙළ ගැසී සීරුවෙන් සිටිති. නිහඬතාවයකි. හුස්ම ගන්නා හඬ පවා නොඇසේ. දෙරටු අසල මුර කරුවෝ ගල් රූ මෙන් සිටිත්. මරණයට පවා බියනැති භටයින් හැත්තෑ පස්දෙනෙකු උවමනා බව නායක කම්කරුවා පවසයි.

Scanned with CamScanner

සේනාංකයේ හැම හටයෙකුම එකාමෙන් කැමැත්ත පළ කරමින් අඩියක් ඉදිරියට තබති. සේනාංක නායකයා සුදුස්සන් තෝරා ගනී. ඒ මුර හට කණ්ඩායමට නායකයෙකු පත්කොට, ඔහු විවේක ගන්නා වේලාවේදී ඔහු වෙනුවට කටයුතු කිරීමට දෙදෙනෙකුද පත් කරන ලදී.

''හදිසි අවස්ථාවකට...'' යැයි පහත් හඬින් කී හෙතෙම නිහඬ විය.

ස්මෝල්නියට ඇතුළු වීම සඳහා ප්‍රවේශ පත්‍ර වහාම පිළියෙළ කරන ලදී. අංක 1 දරන ප්‍රවේශ පත්‍රය ව්ලදිමිර් ඉල්යිච් ලෙනින්ට භාර දුන්හ.

''මේ මොනවද? බලපත්‍ර? මොකටද මේව?'' ලෙනින් ප්‍රශ්න කළේය.

''අවශ්‍යයි. හදිසි අවස්ථාවකට... ස්මෝල්නිය ආරක්ෂා කිරීම සඳහා හට කණ්ඩායමක් හදල තියනව. සහෝදරය පරීක්ෂා කරල බලන්න.''

ලෙනින් දෙර සමීපයට ආවේය. එවිට සැනෙකින් මුර හට කණ්ඩායම ඍජුව පෙළ ගැසී සිරුවෙන් සිටියේය.

''හරි හපන්නු! බලන්නත් ලස්සනයි!'' ලෙනින් කීවේ ඉමහත් ප්‍රීතියකිනි.

මුර හටයෝ ස්මෝල්නියට ඇතුළු වන දෙරටු අසලද, කාමරවලට ඇතුළු වන තැන්වල මුර සේවයෙහි යෙදෙන්නට වූහ. සේනාංක නායකයා ප්‍රධාන සේවය සමග පණිවුඩ සබඳකම් ඇති කර ගත්තේය.

අතුරු සිදුරු නැතිව ජනතාව ස්මෝල්නියට ගලා එති.

*

හිම මාළිගය වට කිරීම පමාවීම නිසා ලෙනින් නොසන්සුන් විය. ධනපති තාවකාලික ආණ්ඩුවේ අවසාන නවාතැන වූ හිම මාළිගය යුද්ධ නිලධාරි-යුන්කර් සේනාංක විසින් ආරක්ෂා කරනු ලැබේ.

විප්ලවයේ පැත්ත ගත් පාව්ලොව්ස්ක් සේනාංකයට හිම මාළිගය අවට මාවත් ආදිය අල්ලා ගන්නා ලෙස අණ ලැබිණ.

සේනාංකය හිම මාළිගය අසලටම විත් සිටී.

නැවියෝද පැමිණියහ. ඔවුහු නොනැවතී හිම මාළිගය ඉදිරිපිට මාළිගා චතුරශ්‍රය අල්ලා ගත්හ. අතුරු පාරවල් සියල්ල ඔවු'නත විය. අන්තිම ප්‍රහාරය ඇරඹිණ. පැය කීපයක් තිස්සේ එය පැවතිණ.

නැවියෝ, පාව්ලොව්ස්ක් සේනාංකය සහ රතු හට සේනාංක සමග ඉදිරියට යන්නාහු, වේගවත් පහරක් ගසා, දෙරටු බිඳ මාළිගයට ඇතුළු වූහ.

''අව්රෝරා'' නමැති යුද්ධ නැව නේවා ගං ඉවුරට විත් නැංගුරම් දැම්මේය. හිම මාළිගයට කාල තුවක්කු එල්ල කොට සූදානම් වීමට ''අව්රෝරාව''ට අණ ලැබී ඇත. පෙත්රොපාව්ලව්ස්ක් බලකොටුවටද එසේම අණක් ලැබිණ.



Scanned with CamScanner

''අව්රෝරාවේ'' සහ පෙත්රොපාව්ලව්ස්ක් බලකොටුවේ කාලතුවක්කු අවසාන සටන දන්වමින් වෙඩි තැබීය. රතු භට සේනාංක, නැවියෝ සහ සෙබළෝ හිම මාළිගයේ ප්‍රධාන දෙරටු, තරප්පු පේළි ආදී තැන් අල්ලා ගත්හ. ඔක්තෝබර් 25 ද රැයෙහිදී හා 26 ද හිමිදිරියේදී හිම මාළිගය විප්ලවවාදී හමුද අතට පත් විය. තාවකාලික ආණ්ඩුව සිරභාරයට ගෙන රැකවල් සහිතව පෙත්රොපාව්ලව්ස්ක් බලකොටුවට ගෙනයන ලදී. ගැහැණු ඇඳුමකින් සැරසුණු තාවකාලික ආණ්ඩුවේ අගමැති කෙරෙන්ස්කි පස්සා දෙරකින් පිට වී, ඇමෙරිකානු තානාපති කාර්යාලයේ මොටෝ් රථයකට නැඟ පලා ගියේය.



*

කළු පැහැති සමෙන් කරන ලද කබායක් සහ පලල් කලිසමක් හැඳ ගත් යුද භටයෙක් ස්මෝල්නියේ කොරිඩෝරය දිගේ ඉක්මනින් ගමන් කරයි. ඔහුගේ එක් උරයක පණිවුඩ මල්ලකි. වම් අතින් ඔහු මල්ල අල්ලා ගෙන ගමන් කරයි.

''යුද්ධ-විප්ලවවාදී කමිටුවේ කාර්යාලය කොහිද?'' යි ඔහු රතු මුර භටයින් දෙදෙනෙකුගෙන් අසයි.

''කාව හම්බ වෙන්ටද?''

''ලෙනින් සහෝදරයාව! වාර්තාවක් භාර දෙන්ට!..''

මුර භටයා පණිවුඩකරු දෙස බලා තම සගයා ඇමතිය:

''කෝපරල්ට එන්ට කියනව... පණිවුඩ කාරයෙක් ඇවිල්ල... බලපත්‍ර යක් නැතුව... ප්‍රධාන කාර්යාලයට. ලෙනින්ව හම්බවෙන්ට ඕනලු...''

කෝපරල් තැන ඇවිත් කොහේ සිට පැමිණියේද පණිවුඩය කාගෙන්ද යන්න ඇසීය.

''හිම මාළිගාවෙ ඉඳල... ප්‍රධාන අණදෙන නිලධාරි පද්වොයිස්කිගෙන්.''

''යමු...''

''වාර්තාවක්. ලෙනින් සහෝදරයාට'' යැයි කාමරයට ඇතුළු වන දෙරටුව අසළ නවතින පණිවුඩ කරු කීය.

''සහෝදරය, මොකක්ද කාරණාව?''

''ඔය සහෝදරයද, ලෙනින්?''

පණිවුඩකරු කුතුහලයෙන් යුතුව ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් දෙස බලයි. ඔහුගේ නෙත් ප්‍රීතියෙනි. තම පණිවුඩ මල්ලේ යතුරු කට හැර ලියුමක් ගෙන ප්‍රවේසමින් එය ලෙනින් අතට දී සිරුවෙන් සිට වාර්තා කරයි:

''වාර්තාවක්!''

''බොහොම ස්තුතියැ'' යි කී ලෙනින් පණිවුඩකරුට අත දෙයි.

Scanned with CamScanner

පණිවුඩ කරුවා කුලැටි ගතියක් පෙන්වමින් දැතින්ම ලෙනින්ගේ අත ගෙන ආචාර කරයි. මඳ සිනාවක් පා පණිවුඩ මල්ල ගෙන යුද්ධාචාර ක්‍රමය අනුව ආපසු හැරී ගමන් කරයි.

ආපසු යන ගමන් ලියුම භාර ගත් බවට ලෙනින් අත්සන් කළ කඩදාසිය ප්‍රවේසමින් ඔහු තම මල්ලට දමා ගත්තේය.

''හිම මාළිගය අල්ලා ගත්තෙමු. තාවකාලික ධනපති ආණ්ඩුව හිරභාරයට ගතිමු. කෙරෙන්ස්කි පැන ගොසිණි!'' යැයි ලෙනින් හඬ නගා කියැවීය.

වාර්තාව කියවා අවසාන වනවාත් සමගම ''ජය වේවා!'' යැයි අල්ලපු කාමරයේ රතු මුර හටයෝ මහ හඬින් කෑගැසූහ.

''ජය වේවා!'' යන හඬ හැමතැනින්ම ඇසිණි.



*

දූන් වේලාව මැදියම් රැය පසු වී අළුයම හතරට පමණ ඇත. වෙහෙසට පත් නමුදු ප්‍රබෝධමත් වී සිටි අපි ස්මෝල්නියෙන් පිට වීමු. මා සමග විත් විවේක ගන්නා ලෙස ව්ලදිමිර් ඉල්යිච් ලෙනින්ට මම යෝජනාකෙළෙමි. වේලාසනින් රොෂ්දේස්ට්වෙන්ස්කි ප්‍රදේශයට ටැලිෆෝන් කළ මම, ආයුධ සන්නද්ධ කම්කරු මුර හටයන් යවා එහි මාර්ගයේ සතුරු සේනා ඇත්දැයි සොයා බලන ලෙස දන්වා සිටියෙමි.

අපි ස්මෝල්නියෙන් පිට වීමු. නගරය ඇදිරිය. මොටෝ රථයකට නැඟ ගත් අපි, මා පදිංචි ගෙය දක්වා ගියෙමු.

බොහොසෙයින් මහන්සි වී සිටි ලෙනින් මොටෝ රථයෙන් යද්දී නිදි කිරා වැටුණේය. ගෙදර ආ අපි තියෙන දෙයක් ආහාර වශයෙන් ගතිමු. ලෙනින්ගේ විවේකය ඉතා හොඳින් පිළියෙළ කිරීමට මම උත්සාහ ගත්තෙමි. මගේ නිදන කාමරයේ මගේ ඇඳෙහි නිදගන්නා ලෙස මා ඔහු කැමති කරවා ගත්තේ අමාරුවෙනි. ඒ කාමරයේ ලියන මෙසයක්ද, කඩදසි හා තීන්තද තිබිණි. එමෙන්ම එහි පුස්තකාලයක්ද විය. මගේ යෝජනාවට එකහවූ ලෙනින් විවේක ගැනීම සඳහා සූදනම් විය.

යාබද කාමරයේ සෝපාවෙක වැතිර ගත් මම ලෙනින්ට හොඳහැටි නින්ද ගිය පසු නිදගන්නට ඉටා ගතිමි.

ආරක්ෂාව සඳහා දොර අගුළු, යතුරු සහ දම්වැල් ආදිය දමා සියළු දොරවල් වැසුවෙමි. මගේ පිස්තෝලයට උණ්ඩ දමා පිළියෙළකෙළෙමි. ලෙනින් මරා දැමීමට හෝ හිරභාරයට ගැනීමට හෝ දොර කඩා ඇතුළු වීමට බැරි නැත. ඕනෑම දෙයක් බලාපොරොත්තු විය යුතුය!

හදිසි අවස්ථාවකදී ප්‍රයෝජන ගැනීම සඳහා සියළු සහෝදරවරුන්ගේ

15—2332

ටෙලිපෝන් නොම්මරද, ස්මෝල්නි ආයතනයේද, ප්‍රාදේශීය කම්කරු කමිටුවල සහ වෘත්තීය සමිතිවලද ටෙලිපෝන් නොම්මර ලියා තැබීමි. ''හදිසි අවස්ථාවෙකදී අමතක වේය'' යන බියෙනි මා එසේ කළේ.

ලෙනින් නිදන කාමරයේ විදුලි පහන නිවා දැම්මේය. ඔහු නිදිද? යන්න සොයා බැලුවෙමි. මම ද නින්දට ගියෙමි. මට නින්ද යාමට ඔන්න මෙන්න කියා තිබියදී ලෙනින් කාමරයේ විදුලි පහන දැල්වීය.

මම දැන් නොනිදා පරීක්ෂාකාරී වීමි. ලෙනින් ශබ්ද නොකොට ඇඳෙන් නැඟිට, දොර හැර මා සිටි කාමරයට විත් මා ''නිදිද'' යි සොයා, ප්‍රවේශමින් පා ඇඟිලි තුඩුවලින් යමින්, නැවත නිදන කාමරයට ඇතුළු විය. නිදා සිටි කිසිවකු අවදි නොකිරීමට හේ වග බලා ගත්තේය. මේසය ළඟ පුටුවක වාඩි වී, තීන්ත කුඩුව හැර ලියන්නට පටන් ගත්තේය. දැන් ඔහු ගැඹුරු කල්පනාවක යෙදෙමින් ලියයි. විවරව ඇති දොර ඉඩස්සෙන් මට ඒ සියල්ල පෙනේ.

ලෙනින් ලියයි, කටුගායි, කියවයි, නැවත යමක් එකතු කරයි, නැවත ලියයි, අන්තිමට කටු සටහන අනුව තවත් වරක් අමුතුවෙන් ලියයි.

දැන් එළිය වැටීමට පටන් ගෙන ඇත. හේමන්තයේදී පෙත්‍රොග්‍රාඩයට එළිය වැටෙන්නේ පමා වෙලාය. ලෙනින් පහන නිවා ඇඳෙහි හාන්සි විය. ඔහුට නින්ද ගියේය. මම ද නිදාගතිමි.

ගෙදර අය ශබ්ද නොකළ යුතුයැයි කියා සිටි මම ලෙනින් එළි වන තුරු වැඩ කළේ යැයි ඔවුන්ට උදෑසන දන්වා සිටියෙමි. ඇත්තෙන්ම ඔහු විඩාපත්ව සිටී.

හිටිහැටියේම දොර හැරගෙන ඔහු පිටතට ආවේය. හැඳ පැළඳ ගෙන සිටි ලෙනින් ප්‍රීතියෙනි, ප්‍රමෝදයෙනි. ඔහු කඩිසරය. විහිළු තහළු කරයි.

''සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයේ පළමුවැනි දවස නිමිත්තෙනි!'' යි කියමින් ඔහු අපට සුබ පැතීය.

විඩාපත් බව හඟවන එකද ලකුණක්වත් ඔහුගේ මුහුණේ නැත. ඔහු ඉතා හොඳින් විවේක ගත්තාක් මෙනි. එහෙත් ඇත්ත වශයෙන් එක හුස්මට පැය විස්සක් වැඩ කළ ඔහු නිදාගත්තේ පැය දෙකකි, නැතිනම් තුනකි.

අනිත් සහෝදරවරුද ආහ. ලෙනින්ගේ බිරිඳ නදේෂ්ද ක්‍රෲප්ස්කයාද ආවාය. සියළු දෙනාම තේ බීමට වාඩි වූහ. ලෙනින් තම සාක්කුවෙන් කඩදාසි කිපයක් ගෙන කියවන්නට විය. ඒ තීරණාත්මක දවස්වලදී ඔහු විසින් ලියන ලද ''ඉඩම් පණතය''* ඔහු කියැවූයේ.

---

* ''ඉඩම් පණත'' — ඉඩම් පිළිබඳ පෞද්ගලික අයිතිය සදහටම අහෝසි කර දමන පළමුවැනි සෝවියට් ආණ්ඩු පණතය. ඉඩම් ජනසතු කරන ලදී.

Scanned with CamScanner

අපි ස්මෝල්නිය වෙත පයින් ගමන් කෙළෙමු. පසුව ට්‍රෑම් රථයකින්ද ගියෙමු. වීදිවල සාමකාමී තත්ත්වය දුටු ලෙනින් අතිශයින්ම සතුටු විය.

හවස, සමස්ත රුසියානු සෝවියට් සභාවල දෙවැනි සම්මේලන වාරයේදී ''සාමය පිළිබඳ පණත''* සම්මත වීමෙන් පසු, ලෙනින් පැහැදිලි ලෙස ''ඉඩම් පණත'' කියවමින් යෝජනාව ඉදිරිපත් කෙළේය. සම්මේලනය ඒකච්ඡන්දයෙන් ඒ පණත සම්මත කළාය.



* ''සාමය පිළිබඳ පණත'' — යුද්ධ කිරීම නවත්වා සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් ඇති කිරීම සඳහා වහාම ක්‍රියාකරන ලෙස යුද්ධ කරන ජනතාවට සහ ආණ්ඩුවලට සෝවියට් ආණ්ඩුව මේ පණත මගින් යෝජනාකෙළේය.



Scanned with CamScanner

## රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියා



පිටර්බුර්ගයේ ලිටෙයිනි වීදියේ ගොඩනැගිල්ලක පොළොවෙන් යට තට්ටුවක දනිල්කා වාසය කළේය. එහිම උපන් ඔහු එහි පදිංචිකරුවන් සියළු දෙනා ඉතා හොඳින් දැන සිටියේය.

පළමුවැනි තට්ටුවේ සියළු කාමර ෂෙර්බාට්ස්කයා සිටුවරියට අයත්ය. දෙවැනි තට්ටුවේ පදිංචිව සිටියේ පිරගොව්-පිෂායෙව් කුමාරයාය. තුන්වැනි තට්ටුවේ පදිංචිකාරයා ආණ්ඩුවේ උපදේශක ගරෝහව්ය. හතරවැනි තට්ටුවේ රාජ්‍ය උපදේශක අර්දනව්ය. හැම පදිංචිකරුවෙකුම ප්‍රසිද්ධය. මොවුහු වැදගත් නිලතල දැරූහ. ඒ ගොඩනැගිල්ලේ සාමිකයා කෙනෙකුට සිටියේ දනිල්කාගේ පියාය. ඔහුගේ අම්මා, ඔහු සහ ඔහුගේ පියා පොළොවෙන් යට තට්ටුවේ වාසය කළහ.

විප්ලවය ජය ගැනීමෙන් පසු බොහෝ දේ වෙනස් විය. දනිල්කා කොතරම් පුදුමයට පත් වී ද යත් ඔහු ඒ නිසාම විඩාපත් විය. එහෙත් ඒ දවස...

දනිල්කාගේ තාත්තා පුවත්පතක් ගෙනැවිත් එය දිගහැර පුතා දෙස බලා මෙසේ කීවේය:

''උඹ කොල්ලො අද සිට රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියෙක්. ව්ලදිමීර් උල්යානොව්-ලෙනින් ඒ පණතට අත්සන් තබා තියෙනව.''

දනිල්කාට එය විශ්වාස කළ නොහැක. කොහොම වුණත් රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියෙකු යන්න කුමක්ද යනු දනිල්කාට හරිහැටි නොතේරේ.

''ඒක ආණ්ඩු උපදේශකයෙකුට වඩා උසස්ද?'' යි ඔහු ඇසිය.

''උසස්'' යැයි තාත්තා කීවේය.

''රාජ්‍ය උපදේශකයෙකුටත් වැඩිය උසස්ද?''

''ඔව්. ඊටත් වඩා උසස්.''

''සිටුකමටත් වැඩිය ලොකුද?''

''ඔව්.''

''කුමාර පදවියටත් වැඩිය ලොකුද?''

''ඔව්, ලොකුයැ'' යි තාත්තා සිනාසුනේය.

දනිල්කා වීදිය දිගේ දුව ගොස් තම යහළුවකු හමුවිය.

කාර්ල් මාක්ස් සහ ප්‍රෙඩ්රික් එංගල්ස් නමින් සිහිවටණයකට මුල් ගල තැබීම. අද මෙතැන විශාල සිහිවටණයකි.



Scanned with CamScanner

ලෙනින් ළමයින් සමග කතා කරයි.
1919 මැයි දිනය.



Scanned with CamScanner

විප්ලවයේ දෙවැනි සංවත්සරය. රතු චතුරශ්‍රයේ පෙළපාලිය නරඹයි. හැමදෙ මෙන්ම එදත් ලෙනින් වටා ළමයින්ය.



Scanned with CamScanner

''රුසියාව විදුලිය බලයෙන් පිරි රටක් වනු ඇත!'' සෝවියට් සභාවල 8 වැනි සම්මේලනවාරය වෙත ඉදිරිපත් කළ වාර්තාව.



Scanned with CamScanner

කෂිනෝෆි ගම්හු කුඩා විදුලි බල ස්ථානයක් යෑදූහ. වි. අයි. ලෙනින්ට සහ නදේෂ්ද ක්‍රෘප්ස්කයාට එය විවෘත කිරීමට ආරාධනා ලැබුණි. ළමා ළපැටියෝ ඡායාරූපයට මුහුණු දීමට උනන්දු වූහ.



Scanned with CamScanner

ජනතාව අතර මිත්‍රත්වය ඇතිකිරීම ලෙනින්ගේ ප්‍රධාන අරමුණක් විය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පළමු වැනි සම්මේලන වාරයේ සභාපති මඩුල්ලේ ලෙනින් අසුන් ගනී.



සම්මේලන ශාලාවේ පඩියක් මත වාඩිවූ ලෙනින් සටහන් පිළියෙළ කර ගනී.



Scanned with CamScanner

ලෙනින්ගේ ඡායාරූප අතුරෙන්
ඉතාම හොඳ එකකි මේ.



Scanned with CamScanner

ඔහු වාන්‍යුෂ්කා දසෝරොව්ය.

''මගේ පදවිය උසස්ම-උසස්ය. වැදගත්ම-වැදගත්ය. මගේ පදවිය ආණ්ඩු උපදේශක, රාජ්‍ය උපදේශක පදවිවලට වැඩිය උසස්. සිටුකමටත්, කුමාර පදවියටත් වැඩිය උසස්! මම සෝවියට් සමූහාණ්ඩුවේ පුරවැසියෙක්. ඒ ගැන පත්තරේ ලියල තියනව. ව්ලදිමීර් උල්යානොව්-ලෙනින් අත්සන් කරල තියෙනවා!'' යැයි කොලුවා තම යහළුවාට කීය.

ඉන්පසු ඔහු ලූබා කසූලිනා හමුවිය. ''මගේ පදවිය උසස්ම උසස්ය. වැදගත්ම වැදගත්...''



හමුවූ හැම කෙනෙකුටම ඔහු ඒ බව දන්වන්ට විය. අන්තිමේදී හති වැටුණු ඔහු ගේ අසල වාඩි විය.

හේ කල්පනා කරන්ට විය. උල්යානොව්-ලෙනින් ඔහු ගැන දැන ගත්තේ කොහොමද? තමා ගැන ලෙනින්ට කිව්වේ කව්ද? ඔහු මේ පුදුමය ගැන කල්පනා කරමින් සිටින විට එතැනට කිර්යූහා ආවේය. එක පිම්මට දුව ගෙන ආ කිර්යූහා හුස්ම පවා නොගෙන මෙසේ කීය:

''උඹ දන්නවද මම කව්ද කියල? මම රුසියන් සමූහාණ්ඩුවෙ පුරවැසියෙක්!''

බලාපොරොත්තු රහිත මේ සිද්ධිය නිසා දනිල්කාගේ හිස නැටවිණ.

''උඹද පුරවැසියා?'' යැයි උපහාසාත්මක ලෙස ඇසූ දනිල්කා ''මම යි පුරවැසියා. මා ගැන පත්තරේ හිටං ලියල තියනව,'' යැයි කීය.

''අපෝ උඹ ගැන! උඹ ගැන ලියල කඩදසි නාස්ති කරන්න ඕනද?''යි ඇසූ කිර්යූහා උරුහන් බැවේය.

නින්ද කළේය යන හැඟීම නිසා කෝපයට පත් දනිල්කා කිර්යූහාට පහර දෙන්ට විය. කිර්යූහාද පෙරළා ඔහුට පහර දුන්නේය.

දෙදෙනාම පොර කාගත්හ.

''පුරවැසියා මම!'' යි කියමින් දනිල්කා කිර්යූහාට වඩා හයියෙන් කෑගසන්ට විය.

''නැහැ. මම යි පුරවැසියා!..'' කී කිර්යූහා යටි උගුරෙන් කෑ ගැසීය.

මෙවෙලාවේ එතැනට පැමිණි කම්කරු තරුණයෙක් පොර කමින් සිටියවුන් ඈත් කළේය. කොල්ලන් දෙදෙනා පොර කෑමට හේතුව නොකියා නිහඬ වූහ. පසුව හෙමින් කියන්ට පටන් ගත්හ. සිනාසුණු තරුණයා සාක්කුවට අත දමා පුවත්පත ගෙන ඔවුන්ට දුන්නේය. ඔවුහු වචනයෙන් වචනය කියවා තේරුම් ගන්නට වූහ.

''පුරවැසියන් වර්ග කිරීම සහ පදවි අනුව වෙන් කිරීම අහෝසි කර දැමීම පිළිබඳ පණත'' යැයි ඔවුන් සිරස් තලය කියවන්නට විය. ''එතෙක් රුසියාවේ

Scanned with CamScanner

නිල වශයෙන් පැවැති වංශාධිපතියා, වෙළෙන්ද, මධ්‍යම පන්තිකයා ආදි වර්ග කිරීමද, සිටුවරයා, රාජ්‍ය උපදේශකයා, ආණ්ඩු උපදේශකයා ආදි පදවි පට්ටම්ද අහෝසි කර දමා ඒ වෙනුවට සියළුම රටවැසියන් එකම පොදු නිලයකින් හඳුන්වනු ඇත. එනම්, රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියා යනුවෙනි.''

පහත ලෙනින්ගේ අත්සන තිබිණි: ''මීට, මහජන කොමසාරිස් මණ්ඩලයේ සභාපති තැන්පත්, වී. උල්යානොව් (ලෙනින්).''

''දැන් පේනව නේද උඹලා දෙන්නම හරි'' යැයි කම්කරු තරුණයා කිය. ''උඹත් රුසියානු සමූහාණ්ඩුවේ පුරවැසියෙක්'' යැයි කියමින් ඔහු දනිල්කාට පුවත්පත පෙන්වීය.'' ''උඹත් ඒවගේම පුරවැසියෙක්'' යැයි කියමින් කිර්යුෂාටද පුවත්පත පෙන්වීය. ''මමත් ඒවගේම පුරවැසියෙක්, අපි සියළු දෙනාම පුරවැසියො. ව්ලදිමිර් ඉල්යිච් ලෙනින් අප සියළුදෙනාටම පුරවැසි පදවි දී තිබෙනවා'' යැයි ඔහු කීවේය.



තමාට පමණක් එම පදවිය නොදුන් නිසා පළමුව දනිල්කාගේ සිතෙහි ලොකු අමනාපයක් ඇති විය. එහෙත් සියළු දෙනාම පුරවැසියන් වීම වඩාත් හොඳයැයි පසුව ඔහුට අවබෝධ විය. ලෙනින් කිසිවකු අමතක කර නැත: දනිල්කාගේ තාත්තා, අම්මා, ඔහුගේ යහළුවන්, මිතුරන් හැම දෙනාටම පුරවැසි පදවි පිරිනමා ඇත. ලෙනින් හරිම දක්ෂයෙකි!

එහෙත් ෂෙර්බාට්ස්කයා සිටුවරියට, පිරගොව්-පිෂායෙව් කුමාරයාට,රාජ්‍ය උපදේශක ගරෝහව්ට, ආණ්ඩු උපදේශක අර්දතව්ට එම පුරවැසි පණත අප්‍රිය වී තිබේ. ඔවුහු පිටරටවලට පළා ගියහ. බොහොම හොඳයි. ඕන රටකට ගියාවෙ. එම ගොඩනැගිල්ලේ පදිංචියට ආවේ අළුත් මිනිසුන්ය. දනිල්කාගේ තාත්තා සහ අම්මා වැනි කම්කරු ස්ත්‍රී පුරුෂයින්ය. ඔවුන් පුරවැසියන් පමණක් නොවී. මුළු මහත් රුසියාවේ හිමිකාරයින් හා ස්වාමිවරුන් බවට ඔවුහු පත් වූහ.

Scanned with CamScanner

## සෝවියට් රාජ්‍ය ලාංඡනය

රට තුළ හැමදෙයක්ම අළුතින් සාදන ලදී. මිනිස් ඉතිහාසයේ මෙතෙක් කිසි කලෙක නොපැවති කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආණ්ඩුවේ පළමුවැනි රාජ්‍ය ලාංඡනයද අළුතින් සෑදීම අවශ්‍ය විය. 111

1918 මුල් භාගයේදී රාජ්‍ය ලාංඡනයක සටහනක් මා වෙත ගෙනඑන ලදී. ඒ සටහන මම ලෙනින් වෙත ගෙන ගියෙමි.

තම කාර්යාල කාමරයේ යාකොව් ස්වෙර්ඩ්ලොව්* සහ පිලික්ස් ජෙර්සින්ස්කි ඇතුළු සහෝදරවරුන් කීප දෙනෙකු සමග වි. අයි. ලෙනින් කතා කරමින් සිටියේය. ලාංඡනය සහිත සටහන මම ලෙනින් ඉදිරියේ තැබුවෙමි.

''මේ මොකක්ද? ලාංඡනය, බලමු. කොහොමද කියල!'' යැයි කියමින් ලෙනින් සටහන දෙස බැලීය.

ලෙනින් සමග අනිත් අයද සටහන දෙස බලන්නට වූහ.

පසුබිමේ නැග එන හිරු සහිත හිරු රැස්ය. දෙපැත්තෙන් තිරිඟු කරල් දෙකකි. මැද දෑකැත්ත සහ මිටියය. හිරු රැස්වලට උඩින් කඩුවකි.

''හොඳයි!..'' කී ලෙනින්, ''අදහස හරි, ඒ උනාට මොකටද මෙතනට කඩුවක්?'' යැයි අසමින් තම සගයින් දෙස බැලීය. ''හ්ම්'' නිර්ධන පංති ආඥාදායකත්වය පිහිටුවන තුරු, අපේ රටින් විදේශික ආක්‍රමණිකයින් පන්නා දමන තුරු, ප්‍රතිවිප්ලවවාදීන් පන්නා දමන තුරු, අපි සටන් කරමු. ඒ උණාට ප්‍රචණ්ඩත්වය අපේ ප්‍රධාන අවිය නොවේ. රටවල් අල්ලා ගැනීමේ ප්‍රතිපත්තියට අප විරුද්ධයි. අපි ආක්‍රමණය කරන්නේ නැහැ. අපි ආරක්ෂක යුද්ධයක් කරන්නේ, අපේ රට හතුරන්ගෙන් මුදා ගැනීමට. ඒ හින්ද කඩුව අපේ ලාංඡනය නොවේ. අපේ රටට කඩා පැන, හතුරා අපට පහර දෙන තාක් කල්, හතුරු තර්ජන තිබෙන තාක් කල්, අපේ ආරක්ෂාව සඳහා අපට කඩුව ගැනීමට සිදුවී තිබෙනවා. අප හැමදම කඩුව අරගෙන සිටිය යුතුයැයි එයින් තේරුම් ගැනීම

---

* යාකොව් ස්වෙර්ඩ්ලොව් (1885—1919), පිලික්ස් ජෙර්සින්ස්කි (1877—1926) — කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් රජයේ සම්භාවණීය නායකයින් දෙදෙනෙකි.

Scanned with CamScanner

වැරදියි... ලෝකයේ සියළු රටවල ජනතාව අතර සහෝදරත්වය ඇති වූ දට අපට කඩුවෙන් ඇති වැඩක් නැහැ... අපේ සමාජවාදී රාජ්‍ය ලාංඡනයෙන් කඩුව ගලවා දමන්ට ඕන...'' යයි කී ලෙනින් තම අත තිබුණු පැන්සලයෙන් කඩුව කටුගා කපා හැරියේය. ''රාජ්‍ය ලාංඡන සටහනේ අනිත් දේ නිවැරදි අදහසක් දෙනවා. කෙටුම්පත් සටහන අපි දැන් පිළිගනිමු. අවසාන තීරණය ඇමති මණ්ඩලයේ සාකච්ඡාවකින් පසුව ගනිමු. ලාංඡනය හැදීම ඉක්මන් කරන්න...''

සටහන අනුමත කරන බව පවසමින් ඔහු අත්සන් තැබීය.



ලෙනින්ගේ රූපය ඇඹීමෙහි යෙදී සිටි අන්ද්‍රෝයෙව් මූර්ති ශිල්පියා ඒ වේලාවෙහි එම කාමරය තුළ නිසලව වාඩි වී සිටියේය. මම ලාංඡනය ඔහු අත තැබුවෙමි. ඔහු ඉතා ඉක්මනින් කටු සටහනක් ඇන්දේය. එම සටහනෙහි කඩුව නොතිබිණි.

රුසියානු සෝවියට් පෙඩරල් සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡන කෙටුම්පත මේ විධියට වි. අයි. ලෙනින් විසින් පෙන්වා දෙන ලද නිවැරදි කිරීමෙන් පසුව, 1918 ජූලි 19 ද සම්මත කරන ලදී.

සෝවියට් සංගමයේ රාජ්‍ය ලාංඡනය නැග එන හිරු රැස් සහිත පසුබිමක දැකැත්ත සහ මිටියකි. දෙපැත්තෙන් තිරිඟු කරල් මිටි දෙකකි. සාමයේ ශ්‍රමයේ ඒ වාසනාවත් ලාංඡනය යටතේ සෝවියට් ජනතාව වැඩ කරති, උත්තරීතර කොමියුනිස්ට් සමාජයක් ගොඩ නගමින් සිටිති.

Scanned with CamScanner

ඒ. කෝනනව්

# සතුරු වෙඩිපහර

කම්හලේ ප්‍රධාන වැඩ ශාලාවේ රැස්වීම ආරම්භ විය. කම්හල් භූමිය ජනයාගෙන් පිරී පවතී. ඔවුහු ව්ලදිමීර් ඉල්යීච් ලෙනින් එනතුරු බලා සිටිති. 113

කම්හල් ගේට්ටුව අසලට මෝටෝ රථයක් පැමිණියේය. එය වැඩශාලාවට ඇතුළු වන තැන නවත්වනු ලදී. ලෙනින් රථයෙන් බැස සුපුරුදු ඉක්මන් ගමනින් ගියේය.

ලෙනින් පිළිගැනීමට කම්කරුවන් විශාල පිරිසක් ආවෝය. ලෙනින් සමග කම්කරු පිරිස රැස්වීම් ශාලාවට ගියෙන්, කම්හල් භූමිය හිස්විය.

රථය ආපසු හරවා නැවැත්වූ රියැදුරා රැස්වීම් බිමෙන් අඩි පහළොවක් පමණ දුරින් සිටියේය.

විනාඩි කීපයකට පසු රියැදුරා වෙත පැමිණි කළු ගවොමක් හැඳගත් ගැහැණියක්, ඔහුගෙන් මෙසේ ඇසුවාය:

''ලෙනින් සහෝදරය රැස්වීමට ඇවිල්ල වගේ?''

''ආවෙ කවුද කියල කියල මා දන්නේ නැහැ'' යැයි රියැදුරා පිළිතුරු දුන්නේය.

ගැහැණිය උපහාසාත්මක ලෙස සිනාසුණාය:

''ඒ කොහොමද? තමුසෙ ඩ්‍රයිවර් උන්නැහේ. රැස්වීමට කාව ගෙනාවද කියල දන්නේ නැහැ?''

කුතුහලයෙන් යුත් ගැහැණිය දෙස රියැදුරා ඕනෑකමින් බැලුවේය.

''මා දන්නේ නැහැ'' යැයි කී හෙතෙම ඇස්බැම් හකුළුවා නැවත බැලිය.

ගැහැණිය රැස්වීම් භූමිය දෙසට පා නැඟුවාය.

පැය බාගයකින් රැස්වීම අවසන් විය. වැඩ ශාලාවේ දොරවල් හරින ලදී. ව්ලදිමීර් ඉල්යීච් ලෙනින් එළියට ආවේය.

ඔහු පිටුපසින් කම්කරු ස්ත්‍රීන් කීපදෙනෙක් ගමන් ගත්හ. ඉතිරි අය වැඩශාලාව තුළ රැඳුණාහ. නැවියෙකුගේ ඇඳුමකින් සැරසී සිටි මිනිහෙක් වැඩ ශාලාවේ දොරටුව අසල සිටගෙන දෑත් දිගහැර ගෙන කෑගසන්ට විය.

''තෙරපෙන්ට එපා! තෙරපෙන්ට එපා!'' යැයි ඔහු බැරෑඩි හඬින් කීය.

නැවියාගේ මුහුණ ඉදිමිලාය. ඇස් කලබල ගතියක් පෙන්විය. ඔහු නැවියෙකු නොව, නාවික ඇඳුමකින් සැරසුණු මිනිහෙකි.

දෙරටුවේ උළුවස්ස දැතින් අල්ලා ගත් හෙතෙම, කම්හල් බිම දෙස බැලීය.

මේ නැවියා ලෙනින් ආරක්ෂා කරන්නෙකියි කම්කරුවෝ සිතූහ. වැඩ ශාලාවෙන් පිටතට නොගිය කම්කරුවෝ එහිම රැඳුනාහ.

ඒ අතර ලෙනින් මොටෝ රිය දෙසට ගියේය.

ඔහු මොටෝ රියේ දෙර හැරීමට යන විට, ඔහු සමග ආ කම්කරු ස්ත්‍රීන් ගෙන් එකියක් ප්‍රශ්නයක් ඇසුවාය. පිළිතුරු දීමට ලෙනින් ආපසු හැරුණේය.



එවිටම වෙඩි හඬක් ඇසිණ. මොහොතක් ගතවීමට පෙර තවත් වෙඩිල්ලක් ඇසිණ. ලෙනින් බිම ඇද වැටුණි.

නැවියා පසකට තල්ලු කර දැමූ කම්කරුවෝ ලෙනින් වෙත දිව ආහ.

රියැදුරා පිස්තෝලයක් රැගෙන මොටෝ රියෙන් එළියට පැන්නේය. තමාගෙන් ප්‍රශ්න ඇසූ ගැහැණිය දුටු රියැදුරා ඇය අල්ලා ගැනීමට පැන්නේය. ගැහැණිය පිරිස අතරට වැදී නොපෙනී ගියාය. රියැදුරා ඇයලුහුබැඳීමට යාමට සූදානම් වූ නමුදු, වෙඩි පහර කා බිම වැතිර සිටින ලෙනින් දුටුවේය.

රියැදුරා වහාම ලෙනින් වෙත ගොස් ඔහු වත්තම් කරගන්ට විය.

''ඉක්මනින් ඉස්පිරිතාලෙට ගෙනයන්ට ඕන'' යැයි පිරිසේ සිටි එකෙකු කියනවා ඇසුණි.

හිස ඔසවා බැලූ ලෙනින්, දුබල හඬින් මෙසේ කීය:

''නැහැ, ගෙදරට... ගෙදරට. ..''

රියැදුරා කම්කරුවන්ට මෙසේ කීය:

ගෙදර ගෙනියනවා. ඉස්පිරිතාලෙට නෙවෙයි!''

කම්කරුවෝ තුවාල ලැබූ ලෙනින් ඔසවා මොටෝ රියෙහි තැබීමට ඉදිරිපත් වූහ. නැගිට සිටි ලෙනින් දුබල හඬින් මෙසේ කීය:

''මම තනියම...''

ලෙනින්ගේ මුහුණ සුදුමැලිවැ ගොසිණි. අමාරුවෙන් නැගී සිටි ඔහු රියට නැග ගත්තේය. වාඩි වීමට තරම් ශක්තියක් නොතිබුණෙන් ඔහුට වැතිර ගැනීමට සිදුවිය.

වෙඩිතැබූ ගැහැණිය අල්ලා ගන්නා ලදී. පිරිස මැදට වී නොපෙනී යාමට ඇ තැත් කළද, ළමයින් රංචුවක් විසින් ඇ සොයා ගන්නා ලදී.

''මෙන්න. මෙන්න. වෙඩි තියපු ගෑණි!'' යැයි කියමින් ඔවුහු හඬ දුන්හ.

එය සිදු වූයේ 1918 අගෝස්තු 30 දය.

සෝවියට් රුසියාවේ ගොවියෝ සහ කම්කරුවෝද, ලෝකයේ වැඩකරන

Scanned with CamScanner

ජනතාවද ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන මහත්වූ කනස්සල්ලකින් හා බලාපොරොත්තුවකින් යුතුව, දිනපතා පුවත්පත් කියැවූහ.

ලෙනින්ට වෙඩි තැබූ ගැහැණිය ජනතා හතුරන් විසින් එවා තිබෙන බව පුවත්පත්වල පළ විය. වෙඩි උණ්ඩවලට විස කවා තිබුණු බව හෙළි විය.

තුවාල බරපතළ ඒවා නිසා. වි. අයි. ලෙනින් ජීවත් වනු ඇතැයි දොස්තරවරු විශ්වාස නොකළහ.

පසුව පුවත්පත් ප්‍රීතිමත් ආරංචිය පතුරුවා හැරියේය: ලෙනින්ට සුවය ලැබෙයි.



කම්හලේ නැවත රැස්වීමකි. ලෙනින්ගේ සෞඛ්‍ය තත්වය ගැන දැන්වෙන ප්‍රවෘත්තිය කම්කරුවෝ පිරිසට කියවති. අවසානයේදී එක් කතිකයෙක් නැගිට මෙසේ කියන්නට විය:

''අපි ලෙනින්ව ආරක්ෂා කළා මදි! අපි එයාව වෙඩි උණ්ඩවලින් බේරා ගත්තේ නැහැ. ලෙනින් ලොකු වේදනාවක් විඳ්දා!'' ඔහුගේ නෙත් කඳුලෙන් පිරී ගොසිනි. ඉන්පසු වේදිකාවට නැග ගත් මහලු කම්කරු කාන්තාව කතා කළාය. ඇගේ නෙත් කඳුලෙන් පිරිලාය.

පසුව නිහඬව සිටි ඇ, තම සගයින් දෙස බලා, එවෙලෙහි හැම දෙනාම සිතමින් සිටි දෙය මහ හඬින් කීවාය:

''ලෙනින් ජීවත්ව සිටීම කොතරම් ලොකු වාසනාවක්ද!''

## සක්මන

තුවාල ලැබ සිටි ලෙනින්ට සුවය පතමින් කම්කරුවන් ලක්ෂ ගණනක් විසින් ලියුම් එවන ලදී. කම්කරු නියෝජිත පිරිස් ඔහු බැලීමට ආහ. හැම කෙනෙක්ම ඔහුගේ සෞඛ්‍යය ගැන සැලකිලිමත් වූහ. වී. අයි. ලෙනින්ට සුවය ලැබීමට පටන් ගත් විට පළමුව කාමරය තුළද, පසුව එළිමහනේද ඇවිදීමට සළස්වන ලදී. ලෙනින්ට සුවය ලැබී ගෙන එන බව දැන්වීමට පටන් ගතිමු. එය ප්‍රීතිමත් ආරංචියකි. සුවය ලැබීම ඉතාම හොඳය, නමුත් ලෙනින් මුණ ගැසී කතා කිරීමට ඉඩ ලැබෙන්නේ කවදද? යි කම්කරුවෝ අසන්නට වූහ.

ප්‍රසිද්ධ රැස්වීමක කතා කිරීමට වී. අයි. ලෙනින්ට අවසර ලැබෙන්නේ තව කොපමණ කලකින්දැයි දෙස්තරවරුන්ගෙන් අපි ඇසුවෙමු. මාස තුනකට පසුව මිස ඊට කලින් නොවන බව දෙස්තරවරු කීහ. වී. අයි. ලෙනින් චිත්‍රපටි ගත කළයුතු යැයි තීරණය විය. චිත්‍රපටි කැමරා ශිල්පී බොල්ට්යාන්ස්කිට එම කටයුත්ත භාර කරන ලදී. ලෙනින්ට නොදැනෙන ලෙස, ඔහුට හොරෙන්, ඔහු චිත්‍රපටි ගත කළ යුතුය. යම් හෙයකින් ඔහු දැනගතහොත් චිත්‍රපටි ගතකිරීමට ඉඩ නොදෙනු ඇත. හොඳහැටි ඉර පායන දවසක බොල්ට්යාන්ස්කි සහ ඔහුගේ කණ්ඩායම ක්‍රෙම්ලිනය තුළ, මාර්ගයේ නොපෙනෙන තැන්වල චිත්‍ර පට කැමරා තබා සූදානම් කරගත යුතු යැයි තීරණය විය. තම කාරියාල කාමරයෙන් පිට වන වී. අයි. ලෙනින් තාර පාර දිගේ ''සාර්-කාල තුවක්කුව''* දක්වා ගමන් කොට ආපසු යයි-ලෙනින්ගේ සක්මන් මඟ මෙයයි.

හැකිතරම් ඉක්මනින් එම කාරිය ඉටු කිරීමට අවශ්‍ය වූයේ, කල් ඇතිව එම චිත්‍රපටියේ කොපි කීපයක් පිටපත් කොට කම්කරුවන්ට හා ජනතාවට පෙන්වීම පිණිස සූදනම් කළ යුතු බැවිනි.

1918 සැප්තැම්බර් මාසය. එදා කාලගුණය යහපත් විය. වහාම සූදනම් වන ලෙස බොල්ට්යාන්පකිට ටෙලිපෝන් මගින් දන්වන ලදී. එදින දහවල් එකට

---

* යෝධ කාලතුවක්කුවකි. 16 වැනි සියවසේ වාත්තු ශිල්පයේ නිර්මාණයකි.

පමණ එළිමහනේ ඇවිදිමින් විවේක ගත යුතු යැයි දෙස්තරවරුන් ඉල්ලා සිටින බව ලෙනින්ට දන්වා සිටියෙමු.

ලෙනින් ඊට එකඟ විය.

''එළිමහනේ ඇවිදීමට යමු'' යි දහවල් එකට පමණ මම වි. අයි. ලෙනින්ට යෝජනා කළෙමි. ඔහු නැගිට සිටිමින් හිස්වැස්ම අතට ගත්තේය:

''උඩ කබාය නැතුව යමු. අද කාලගුණය හරි අගෙයි''.

වි. අයි. ලෙනින් කාර්යාල කාමරයෙන් පිටවූ බව බොල්ටින්ස්කිට දන්වන ලදී. එදින කළයුතු වැඩ ගැන කතා කරමින් අපි තාර පාර දිගේ ගමන් ගතිමු.

ලෙනින් එදින ගමන් කළ මහ මුල සිට අග දක්වාම චිත්‍රපටි ගත කරන ලදී.

කතා කරමින් අපි ගමන් කළෙමු. ඒ අතර චිත්‍රපටි කැමරාකරුවෝ හැම අතින්ම ලෙනින්ගේ හැම අඩියක් පාසාම චිත්‍රපටි ගත කළහ. ඔවුන් එය කළේ සැඟවී සිට ගෙනය. ලෙනින් දුටුවොත් චිත්‍රපටි ගත කිරීම නැවැත්වීමට සිදු වන අතර, ඔහු සක්මන් කිරීම නවත්වා ගෙදර යාමටද ඉඩ ඇත.

ලෙනින් තනිවම චිත්‍රපටි ගත කිරීමට ඉඩහැර මම ඔහුගෙන් ඈත් වෙමින්, වරින් වර නැවතුණෙමි. එය දුටු ලෙනින් මට මෙසේ කීවේය:

''මොකද සහෝදරය අයින් වෙන්නෙ?.. ඇවිදිනව නම් එකට ඇවිදිමු.''

මම නැවත ඔහුට ළංවෙමින් කතා කිරීමට පටන් ගත්තෙමි. මෙසේ ගමන් කළ අපි ''සාර්-කාල තුවක්කුව'' ළඟට ආවෙමු. තවත් දුර ගමන් කිරීමට මා කළ යෝජනාව ගැන ලෙනින් මෙසේ කීය:

''ඇවිදින්ට හිතෙනව. ඒ උනාට බැහැ. හවස හතර වෙන්ට ඉස්සෙල්ල සටහන් කීපයක් ලියන්ට ඕන. සහෝදරවරු දෙදෙනෙකුට එන්නත් කියල තියෙනව.''

අපි ආපසු හැරුණෙමු. තරමක් දුර ගමන් කළ ලෙනින් හිටි හැටියේ මෙසේ කීවේය:

''අන්න, බලන්න කවුදෝ දුවනව. කරේ මොකක්ද එල්ලා ගෙන, මිනිහ චිත්‍රපටි කැමරා කාරයෙක් වගෙ!''

''ඔව්, ඒ චිත්‍රපටි කැමරා කාරයෙක්. මෙතන ඒ අය කීපදෙනෙක් ඉන්නව. සහෝදරයව චිත්‍රපටියට ගත්තා'' යැයි මම කරුණු පැහැදිලි කරමින් කීවෙමි.

''එහෙම කරන්ට සහෝදරයට අවසර දුන්නෙ කව්ද?'' යි ඔහු ඇසීය. ''ඇයි මට කලින් ඒ බව දැනුම් නොදුන්නෙ?''

''සහෝදරයව චිත්‍රපටි ගත කරනවට කිසිම දක සහෝදරය කැමති වන්නේ නැති හන්ද. නමුත් චිත්‍රපටි ගත කිරීම බොහොම අවශ්‍ය දෙයක්.''



Scanned with CamScanner

''සහෝදරය මාව රැවටුවා... ව්ලදිමීර් ද්මීත්‍රියෙවිච් කොහොමද තමුසෙ ඒ වගෙ දෙයක් කළේ?'' යැයි ඔහු මගෙන් ඇසුවේ දෙස් නගමිණි.

''ජීවිතයේ පළමුවැනි වරට සහ අවසාන වරට මම සහෝදරයව රැවටුවා. ඒ උනාට සහෝදරයව චිත්‍රපටියට අරගෙන කම්කරුවන්ට පෙන්වන්ට ඕන. සහෝදරයාට සනීපය ලැබීම නිසා හැමදෙනාම සන්තෝස වෙනව. බොහෝ දෙනෙක් සහෝදරයව බලන්න ඕන කියල ඉල්ලනව. චිත්‍රපටි මගින් හරි සහෝදරයව පෙන්වන්ට තීරණය කළේ ඒ හන්ද. තව මාස තුනක් යනතුරු සහෝදරයට රැස්වීම්වල කතා කිරීමට අවසර දීල නැහැ නෙව...''



''ඒක එහෙම වෙනවයි කියමු!..'' ලෙනින් කීවේය.

''එහෙම තීරණය කළේ දෙස්තරල. හැමතැනම කම්කරුවො නොසන් සුන්ව ඉන්නව.අපි තීරණය කළා සහෝදරයව චිත්‍රපටියට අරගෙන, ඔක්කොටම ඉස්සෙල්ල කම්කරු සමාජ ශාලාවල පෙන්වන්ට. කම්කරු පංතියට ඒක බොහොම වැදගත්.''

''අවශ්‍ය දෙයක් නම්, ඒක වෙනින් කාරණාවක්. තමුසෙගෙ පව්වලට සමාව ලැබෙනව,'' යැයි ලෙනින් කීවේය.

සැඟවී සිටි කැමරා කරුවන් චිත්‍රපටි ගැනීමද, එය සංවිධාන කිරීමද ආදිය ගැන කතා කළ අපි එය උපහාසයට ලක් කළෙමු. සිනහ වෙමින් හා විහිළු තහළු කරමින් අපි ගමන් කළෙමු.

''මේක හරි චිත්‍රපටි කුමන්ත්‍රණයක්!.. තමුසෙල බොහොම දක්ෂ විධියට මාව රැවටුවා!'' යැයි ලෙනින් සන්සුන් ලෙස කීවේය.

''කුමන්ත්‍රණය'' හෙළි වී ඇති බව දැනගත් කැමරා ශිල්පීහු සැඟවී සිටි තැන්වලින් එළියට විත් අපේ කතාව සම්පූර්ණයෙන්ම චිත්‍රපටි ගත කළහ. ඒ දර්ශන ඉතා හොඳ ඒවා විය. විශේෂයෙන්ම වි. අයි. ලෙනින් සිනහ වෙමින් ප්‍රීති වන සැටි පෙන්වන චිත්‍රපටි ජනප්‍රිය විය. අනිකුත් දර්ශනද සිත් ඇද ගැනීමෙහි සමත් විය.

පසුව කැමරා ශිල්පි බොල්ට්යාන්ස්කි එම චිත්‍රපටිය ලෙනින්ට පෙන්වීය. ''සාර්කාල තුවක්කුව'' අසල ජවනිකා ලෙනින්ගේ සිත් ගත්තේය.

චිත්‍රපටි බැලීමෙන් පසු, ''වී. අයි. ලෙනින් ක්‍රෙම්ලිනය තුළ සක්මන් කරයි'' යන මැයෙන් චිත්‍රපටි කතාවක් පිළියෙල කළෙමු. මේ කෙටි වාර්තා කතාව සිනමා ශාලාවල ප්‍රදර්ශන කරන ලදී. පළමුව මොස්කව්හි කම්කරු සමාජ ශාලාවලද, පසුව රටපුරාමද මේ චිත්‍රපටි වාර්තා-කතාව ප්‍රදර්ශනය විය. නරඹන්නෝ බොහොසෙයින්ම ප්‍රීති වූහ. වි. අයි. ලෙනින් දකිනවාත් සමගම නැඟී සිටින කම්කරුවෝ අත් පොළසන් දෙමින් ප්‍රීති ඝෝෂා කළහ.

''ලෙනින් සහෝදරයාට ජය වේවා!'' යි කෑගැසූහ.

Scanned with CamScanner

ඒ. කෝනනව්

## කෂිනෝවට ගිය ගමන

1920 කෂිනෝ ගමේ ගොවිහු කුඩා විදුලි බල ස්ථානයක් සෑදූහ. 119

ඒ කාලයේදී විදුලි බල ස්ථානයක් සෑදීම අමාරු කාර්යයක් විය. අවශ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ නොතිබිණ.

එවැනි අමාරු අසීරු කාලයක කෂිනෝ ගම්හු තමන්ගේ ශක්තිය පමණක් යොදා විදුලි බල ස්ථානයක් සෑදූහ. දුඹුරු ගැසුණු ටෙලිපෝන් කම්බි රෝල් කිපයක් සොයා ගත් ගම්හු අඬුවලින් හා අත්වලින් ඒ කම්බි දිගහැර ගත්හ. මෙසේ දිගහැර ගැනීම නිසා සෑහෙන ප්‍රමාණයක් කම්බි ලබා ගැනීමට හැකි විය.

කැලෑවේ සිට කඳන් ගෙනවුත් ඒවායේ අතු කපා කනු සාද ගත්හ. දැන් අවශ්‍ය විදුලි යන්ත්‍රයක් හෙවත් ඩයිනමෝවක් සොයා ගැනීමය.

ඒ කාලයේදී කම්බි ඇණයක් මිළදී ගැනීම පවා ලෙහෙසි කාරියක් නොවිය. විදුලි යන්ත්‍රයක් සොයා ගැනීම කොතරම් අමාරුද යන්න කිවයුතු නොවේ.

කෂිනෝ ගමේ ගොවිහු මොස්කව් ආහ. ඔවුන් ආ ගිය හැම තැනකම ඔවුන් ඇසුවේ ලෙනින්ගේ සැළැස්මක් ගැනය. ඒ සැළැස්මය අනුව රට පුරා විදුලි ස්ථාන සාදනු ඇත. තමන්ද ලෙනින්ගේ ඒ සැළැස්ම අනුව ක්‍රියා කරන බව ගොවිහු කතා කළහ.

එකවරම නොවූවද, කෂිනෝ ගම්මුන්ට විදුලි යන්ත්‍රයක් ලබා ගැනීමට හැකි විය.

එය කෂිනෝවට ගෙනවුත් මඩුවක තබන ලදී. ලී කනු මග දිගට සිටවා කම්බි ඇද හැම ගෙපැලකටම විදුලි ලාම්පුවක් බැගින් දෙන ලදී.

මේ සියල්ල සූදනම් කළ පසු, ලෙනින්ට ලියුමක් යවා විදුලි ස්ථානය විවෘත කිරීමට පැමිණෙන ලෙස ආරාධනා කළෝය.

ලියුම යැව්වද, ලෙනින් පැමිණේය යන්න ගැන විශ්වාස නොකළහ. රාජ්‍ය කටයුතු අතපසු කොට ඔහුට එන්නට තරම් කාල වේලාවක් තිබේද...

කෙසේවුවද, උත්සවයට සූදනම් වූහ. ලොකුම ගොවි ගෙදරට දිග මේසයක් ගෙනැවිත්, දෙපසින් බංකු හා පෙට්ටි තැබූහ. ඇඳන් ආදිය එළියට දැමූහ. සොයා ගැනීමට හැකි තරම් පිටි ආදිය සොයා ගෙන හැකි තරම් කැවිලි පිසූහ.

විදුලි බල ස්ථානය විවෘත කිරීමේ දිනය-නොවැම්බර් 14 ද එළඹිණ.ලෙනින් පැමිණෙන තුරු, බලා සිටිය යුතුද නැද්ද යන්න ගැන ගොවිහු නොදත්හ.

හිටිහැටියේම මොටෝ රියක් එනු පෙනිණ.

ගමේ කොලු රංචුව මොටෝ රිය පිළිගැනීමට ඉදිරියට දුව ආහ. රිය නවත්වන ලදී. වී. අයි. ලෙනින් සහ නදේෂ්ද ක්‍රෘප්ස්කයාද එහි වූහ.

''විදුලි ස්ථානය විවෘත කරන්නේ කොතැනද?'' යි ලෙනින් ළමයින්ගෙන් ඇසුවේය.

''අපිව කාර් එකෙන් ගෙනියන්න, එතකොට අපි තැන පෙන්වන්නම්'' යැයි ළමයි කීහ.

ලෙනින් ළමයින් රියට නංවාගෙන ගියේය.

ලොකු ගොවි ගෙදර අසළ මොටෝ රිය නවත්වන ලදී. ගොවියෝ ලෙනින් පිළිගත්හ.

ගෙ තුළට වී මේසය වටා වාඩි වූ ලෙනින් සහ පිරිස කතා කරන්ට වූහ.

ප්‍රතිවිප්ලවවාදීන් පරදවා රතු හමුදුව ජය ගත් යැටි විස්තර කළ ලෙනින්, එම ජයග්‍රහණය නිමිත්තෙන් ගොවීන්ට සුබ පැතීය.

ගොවියෝ තම ප්‍රශ්න ගැන ලෙනින්ට කීහ.

ලෙනින් මහත් ඕනෑ කමින් ඔවුන්ට කන් දුන්නේය. කිසිවක් විස්තර කළ කෙනෙක් හිටිහැටියේ තම කතාව නැවැත්වූවොත්, ලෙනින් ඔහු දිරි ගන්වයි:

''ඉතින් ඊට පස්සෙ?''

ඕනෑම දෙයක් එකවරක් ඇසූ පමණින්, මතක තබා ගැනීමට තරම් ධාරණ ශක්තියක් ලෙනින්ට ඇත. වැඩිමහළු ගොවීන්ගේ නම්, වාසගම් ආදිය ඔහු එකවරම මතක තබා ගත්තේය. පසුව ගොවීන් හා ගෙවිලියන් ඇලෙක්සේයි අන්ද්‍රෙයෙවිච්, වසිලිසා පාව්ලව්නා යන නම්වලින් ඇමතිය. මේ නිසා වැඩිමහල්ලෝ බොහෝසෙයින්ම සතුටට පත් වූහ.

ලෙනින් හා ගොවීන් අතර ඇතිවූ සාකච්ඡාව බොහෝ වැදගත් විය. වරෙක ලෙනින් ගොවීන්ගෙන් ප්‍රශ්න කරයි. තවත් වරෙක ගොවියෝ ලෙනින්ගෙන් ප්‍රශ්න අසති. ඔයින් මෙයින් හවස් වී ඇඳිරි වැටීමට ඔන්න මෙන්න කියා තිබිණි. ලෙනින් සහ ගොවීන්ගේ ඡායාරූප ගැනීමට ආ ඡායාරූප ශිල්පියා පමණක් කලබල විය. ඇඳිරි වැටුණහොත්, එළිය මදි නිසා ඡායාරූප ගැනීමට බැරි වෙයි.

අවසානයේදී ඔහු මෙසේ කීය:

''ව්ලදිමීර් ඉල්යිච්, ගොවීයෝ සහෝදරය සමග පොටෝ ගැනීමට ආශා කරනවා.''

''ආ... එහෙමද, බොහොම හොඳයි'' කී ලෙනින් නොනවත්වා ගොවීන් සමග කතා කරන්ට විය.

Scanned with CamScanner

ලෙනින් සතුන්ට ඇලුම් කළේය.



Scanned with CamScanner

ගෝර්කිහි ලෙනින්ගේ කාමරය. මේ විශාල වත්කු විප්ලවයට පෙර ඉඩම් හිමියකු සතුව පැවතිණ.



මොස්කව් නගරයට කතා කිරීම සඳහා ලෙනින් මේ ටෙලිපෝනය පාවිච්චි කළේය.



Scanned with CamScanner

ලෙනින්ගේ ලියන මේසය.



Scanned with CamScanner

ගෝර්කිහි ලෙනින් වුසූ ගෙය දැන් ජනප්‍රිය කෞතුකාගාරයකි.



Scanned with CamScanner

1922 හේමන්තය.



ගෝර්කිහි විවේක ගැනීමට ලෙනින් ආශා කළේය. ගෝර්කිය සුන්දර තැනෙකි.



Scanned with CamScanner

සක්මන් කිරීම ඉතාම හොඳ විවේකයකි.



Scanned with CamScanner

වි.අයි.ලෙනින්, කෲප්ස්කයා. ලෙනින්ගේ ඥාති පුත්‍ර වික්ටර් සහ රජයේ ගොවියෙකුගේ දුවක් වන වේරා.



තවත් විනාඩි දහයක් ගත විය. දැන් නම් ඇඳිරි වැටීමට පටන් ගෙන ඇත. ඡායාරූප ශිල්පියා බලාපොරොත්තු රහිතව මෙසේ කීය:

''තව විනාඩි කීපයකින් කොහෙත්ම පොටෝ ගැනීමට බැරුව යාවි!''

ලෙනින් ඔහු දෙස බැලීය. ඡායාරූප ගැනීමට ඉඩ දීමට තරම් ඔහු කැමති නැත. එහෙත් තවත් මිනිහෙකුගේ ශ්‍රමය අපතේ යැවීමට ඔහු අකමැති විය. ඡායාරූප ශිල්පියා නගරයේ සිට ඇවිත් සිටී. ඔහු ඒ සඳහා කාලය ගෙවා ඇත.

''හොඳයි එළියට ගිහිල්ලා සූදනම් වෙන්න. මායි නදේෂ්ද ක්‍රෘප්ස්කයා සහෝදරියි එනවා,'' යැයි ලෙනින් කීය.



ඡායාරූප ශිල්පියා එළියට දුවගොස් කැමරාව සූදනම් කළේය. කොල්ලන් ගෙන් ඔහුට බේරුමක් නැති විය. කොල්ලෝ ඔහු වටකර ගෙන, කැමරාවට ඉස්ස ර වී සිට ගත්හ.

ලෙනින් සහ ක්‍රෘප්ස්කයා ගොවි ගෙදරින් පිට වී ඡායාරූපයට මුහුණ දීමට ආහ. ලෙනින්ට සහ ක්‍රෘප්ස්කයාට මැදින් වාඩි වෙන්නට සලස්වා ගොවීන් දෙපසින් වාඩි කරවන ලදී. කොල්ලන්ගෙන් බේරිල්ලක් නැත. ලෙනින් ළඟට වී ඡායාරූපයට මූණ දීමට කොල්ලෝ දඟලති. ඡායාරූප ශිල්පියාට කේන්ති ආවේය. කලබල කළොත් ඡායාරූපය නරක් වන බව ඔහු කීවේය.

ලෙනින් කොලු පිරිසට කතා කොට කැමරාව පෙන්වමින් මෙසේ කීය:

''ළමයිනේ, අන්න අර පුංචි කට දිහා බලාගෙන ඉඳපල්ලා!''

කොල්ලෝ නිහඬ වූහ. ඡායාරූප ශිල්පියා කළු රෙද්දකින් කැමරාව වසා ඔහුද එයට සැඟවී බොහෝ වේලාවක් නිහඬව සිටියේය.

''තමුසෙ නිසා ළමයින්ට ශීතල හැදේවී'' යැයි ලෙනින් කීය.

හැමදෙනම සිනාසුනහ:

''අපේ ළමයින්ට හීතල හොඳට පුරුදුයි.''

කොල්ලෝ නැවතත් දඟලන්නට වූහ. ගොවියෝ සහ ලෙනින් දැන් ගොවි ළමයින් ගැන කතා කරති. හිටිහැටියේම ඡායාරූප ශිල්පියා කෑගසමින් මෙසේ කීය: ''සීරුවෙන්! ගන්ටයි යන්නේ!''

ලෙනින් සිනාසුණි. ඒ සිනහ මුහුණින් යුත් ලෙනින් ඡායාරූප ගතවිය...

ඉන්පසු රැස්වීම පටන් ගැනිණි. මැද උස කණුවකි, එහි අළුත් විදුලි පහනකි. එය මෙතෙක් දල්වා නැත. ඒ කණුව නත්තල් ගස්වල අතුවලින් සහ රතු පටිවලින් සරසා තිබිණි. අළුත් විදුලි පහන යට මේසයකි.

කෂිනෝ ගමේ ගොවීන් පමණක් නොව, අවට ගම්වලින් සහ ජනපදවලින්ද ගම්මු රැස්වීමට ඇත පෙදෙස්වල බොහෝදෙනා පැමිණියහ.

ලෙනින් මේසය ළඟට විත් කතාව පටන් ගත්තේය:



Scanned with CamScanner

"තමුන්නාන්සේලාගේ ගම-කෂිනෝව අද විදුලි ස්ථානයක් විවෘත කරනවා. ඉතාම අනර්ඝ දෙයක්! මෙය පටන් ගැනීම පමණයි. අපේ අරමුණ අපේ රට-රුසියානු සමූහාණ්ඩුව පුරාම විදුලි ස්ථාන ඇති කිරීමයි."

ලෙනින්ගේ කතාව අවසාන වූ විගස ගම්බද වාදක කණ්ඩායමක් විසින් 'ජාත්‍යන්තර ගීතය' වයන ලදි. එවිටම විදුලි යන්ත්‍රය ක්‍රියා කරවිය.

රුස්වීම් බිම විදුලි බුබුලු වලින් ආලෝක විය. හැම ගොවි ගෙදරකම විදුලි පහන් බැබලිණ.



මීට පෙර කෂිනෝහි ගෙවල් ආලෝක කළේ කණාමැදිරි එළියට සමාන කුප්පි ලාම්පුවලිනි.

පැහැදිලි ආලෝකය දුටු ගොවියෙක් මෙසේ කීය:

"ලෙනින්ගෙ පහනින් අපට එළිය ලැබෙනවා..."

ලෙනින් ගොවීන්ගෙන් සමු ගන්නට විය.

මොටෝ රථයට නැඟ වාඩි විය. දැන් හොඳටම ඇඳිරි වැටිලාය. නොවැම්බරයේ ශීත සුළං හමායයි.

බොහෝ දුර ගිය ලෙනින් හැරී බැලුවේය. අඳුර බිඳ කෂිනෝ ගමේ ගෙවල්වල ආලෝකය පැතිර යන සැටි ඔහු දුටුවේය.

Scanned with CamScanner

## ක්‍රෙම්ලින් හමුව



ලෙනින් සිය කාර්යාල කාමරයේ ජනේලය අසල සිට ගෙන, කලිසම් සාක්කු තුළට දැත් ඔබා ගෙන, කල්පනාවෙක යෙදී සිටියි. තෙතමනය සහිත සීත සුළඟින් පිරී ඇති කාමරයේ සීලිම උසය, එහි ලොකු ජනේල දෙකකි. සීත සෘතුවේ අවසාන සති කීපය තුළදී හිම තුෂාරය වැඩි වී ඇත.

වෙඩි උණ්ඩ නිසා ඉරිතැලී ඇති අර්සනාලයද, අළු පැහැති ඇඳිරි අහසේ රාජාලියෙකු සහිත මුදුනක් ඇති ත්‍රොයිට්ස්කි කුළුණද ලෙනින්ට පෙනේ. මන්යෙෂ්හි සිට බලන විට එය වඩාත් උසය. ක්‍රෙම්ලින් තාප්පයේ කොටසක්ද සෙබල නිවාසද ලෙනින්ට පෙනේ. ගල්කැටවලින් වැසී ඇති චතුරශ්‍රය වලවල් වලින් යුක්තය. අර්සනාලයේ සිට නිකොල්ස්කි කුළුණ දක්වා, සිහින් ලාම්පු කීපයකි. ඒවා කොකුවලට අමුනා ඇත.

ත්‍රොයිට්ස්කි කුළුනේ සිට අර්සනාලය දක්වා ඇති මාර්ගයද, චතුරශ්‍රයද හිමවලින් පිරිලාය. තැනින් තැන කහල ගොඩවල්ය. වහලවල්වල සහ ක්‍රෙම්ලින් තාප්පය මත වැටී ඇති හිම සුදෝසුදු කිරි කැටි මෙනි.

ක්‍රෙම්ලිනයට එහා ගෙවල් තද සීතට අසුව ගල් ගැසුනාක් මෙනි. කෞතුකාගාරයට සහ රුම්යාන්ට්සෙව් පොත්ගුලට එහා ඇති ගෙවල්වල දුම් කුළුණු පෙනේ. කොතරම් ඕනෑකමින් බැලුවත්, ඒවායින් දුම් නගින සැටි නොපෙනේ: මන්දයත්, උණුහුම් වීම සඳහා ගිනි තපින්ට දර නැති බැවිනි.

සීත සෘතුව නමැති යක්ෂයා මොස්කව් නගරයේ ගෙල මිරිකන්නාක් මෙනි. සිවිල් යුද්ධය නිසා විඩාවටද, අමාරු, අසිරු තත්ත්වයකටද වැටී ඇති රට දුර්භික්ෂයට හා විනාශයට මුහුණ පා ඇත. දැන් තවත් අසහනයකි. එය දැඩි සීතය.

උණ සන්නිපාතය දස'ත පැතිර යයි.

ලෙනින් සුසුම් ලෑවේය. සාක්කුවෙන් දකුණ'ත එළියට ඇද ගනිමින් ලියන මේසය අසලට ගිය ලෙනින් වාඩි විය.

දැන් ඔහු ඉක්මනින් ලියයි. ඔහුගේ පෑන බාලාංශ සිසුවකුගේ මෙනි. කෙටි වචන ඔහු වේගයෙන් ලියයි. අදහස් වේගයෙන් ගලා යයි. ඔහුගේ අධිෂ්ඨානය තවත් දැඩි වෙයි: ළමා නිවාසවලට ගිනි තැපීම සඳහා දර යවා ඇත්දැයි සොයා බලන්න. නැතිනම් වහාම සහතික කරන්න... ලෝහ කර්මාන්ත කම්කරුවන්ට



Scanned with CamScanner

දෙන සීනි සලාකය වැඩි කළ යුතුය... ගම්වලට යවන පොත් අධ්‍යාපන ඇමති අංශය විසින් නවතා ඇත... පණ්‍ඩිත සහෝදර වරුන්ට පෙන්වා ස්ථිර කරගත යුතුය... කාම්නෙව්ට සටහනක්... විදේශීය රටවල් ආධාර දීමට ඉදිරිපත් වෙයි.

හිටිහැටියේම ලිවීම නැවතිණි.

කාමරයේ දොර සෙමින් විවර විය. ලේකම් ඇතුළු විය.

''ව්ලදිමීර් ඉල්යීච්'' යැයි හේ සෙමින් ඇමතීය.

...අපට තනිවම ප්‍රශ්න නිරාකරණ කරගන්ට පුළුවන්ද, බැරිද?..



ගැඹුරු කල්පනාවක ගැලී සිටි ලෙනින් පිළිතුරු නොදුන්නේය.

''ව්ලදිමීර් ඉල්යීච්!..''

ලෙනින් හිස ඔසවා බැලීය.

''ඔව්, ඔව්'' යැයි කී හෙතෙම කඩදසියක් ගෙන නැවත ලියන්ට විය.

''සහෝදරයව හම්බවෙන්ට කෝර්ෂුනොව් ඇවිල්ල.''

''හොඳයි,'' ලෙනින් කීය.

ලේකම් තැන හඬ පිට නොවන සේ දොර වසා නොපෙනී ගියේය. සෙර්ගේයි කාම්නෙව්ට ලියුම ලියා අවසාන කිරීමට ලෙනින් යුහුසුළු විය. එහෙත් ලියා අවසාන වීමට පෙර දොර යළිත් හැරිණ. නොඋස් සිහින් සිරුරකින් හෙබි තම පැරණි යහළුවා කාමරයට ඇතුළු විය. හේ පෙනුමෙන් විද්‍යාඥයෙකුට සමානය. ඔතැනි ගතියකින් හෙබි ඔහු ලජ්ජාවෙන් තැවන බව පෙනේ. ලෙනින් නැගී සිටිමින් අමුත්තා පිළිගැනීමට ඉදිරියට ගියේය.

''ලියනීඩ් ඇලෙක්සේයෙවිච්, එන්න එන්න'' යැයි කී ලෙනින්, පුටුවක් පෙන්වමින් ''වාඩි වෙන්න, වාඩි වෙන්න'' යැයි කීය.

ලියනීඩ් ඇලෙක්සේයෙවිච් කෝර්ෂුනොව් කුලැටි ගතියක් පාමින්, ඉක්මන් ගමනින් පුටුව වෙත ගොස් වාඩි විය. දන් ඔහු ලෙනින්ගේ මේසය ළඟම ඇති පුටුවේ වාඩි වී සිටී. කොතරම් ඉක්මනින් කෝර්ෂුනොව් වාඩි වූයේදයත්, ඔහුගේ නොපුරුදු නුහුරු ගමන නිසා ඔහු තුළ තිබූ කුලැටි ගතිය තවත් වැඩි විය. වාඩි වී සිටින ලෙනින් දෙස බැලූ හෙතෙම සන්සුන් විය.

''සැප සනීප කොහොමද ලියනීඩ් ඇලෙක්සේයෙවිච්!'' යැයි කී ලෙනින් සුවදුක් විචාළේය.

''ස්තුතියි, ව්ලදිමීර් ඉල්යීච්, වරදක් නැහැ'' යැයි කෝර්ෂුනොව් පිළිතුරු දුන්නේය.

''ලියනීඩ් ඇලෙක්සේයෙවිච්, අප මූණ පා සිටින්නේ අමාරු කාලයකටයි. කොහොම හරි මේ කාලය මැඩ ජය ගන්න ඕන.''

ලෙනින් නිහඬ වූ පසු කෝර්ෂුනොව් මෙසේ කීය:

''මම ආවෙ සයිබීරියාවට විද්‍යා සේවක පිරිසක් යැවීම ගැන කතා කර

Scanned with CamScanner

ගන්ටයි. විද්‍යාඥයින් ඉතාම අගේ කොට සළකන සිද්ධියක් 1908 ජූනි 30 ද සිදු වූ බව ව්ලදිමීර් ඉල්යිච් දන්නව ඇති. පරිමාණය හා වැදගත්කම අනුව බලන විට ඒක බොහොම විරල සිද්ධියක්. සයිබීරියාවේ තයිගා වනාන්තරයට විශාල උල්කාපාතයක් වැටුනා.'' කෝර්ෂුනොව් ලෙනින් දෙස බැලීය. ඔහු ඉතා ඕනෑකමකින් සවන් දෙන බව කෝර්ෂුනොව්ට අවබෝධ විය.

එ උල්කාපාතය ගැන තොරතුරු ඉතා හොඳින් ලෙනින් දන්නා බව ඔහුට හැඟෙයි. ඔහුගේ අදහස් හා බලාපොරොත්තු ලෙනින් දනී. තමන්ගේ පැමිණීම නිසා වැඩ අධික ලෙනින්ට කරදරයක් වී යැයි සිතූ විද්‍යාඥයා නිහඬ විය.



''ඉතින් ඔය උල්කාපාතය ගැන ඔහෙල හැම දෙයක්ම දන්නව නෙව...''

''ලියනිඩ් ඇලෙක්සේයෙවිච් ඔහොම කතාකරන්න එපා. උල්කාපාතයක් කොහාටද වැටුනු බව විතරයි මා දන්නේ. වෙන කිසි දෙයක් ඒ ගැන දන්නේ නැහැ'' යි ලෙනින් කිය.

විද්‍යාඥයා දෙසට හිස නමා පහත් ස්වරයෙන් කතා කළ ලෙනින් මඳ සිනාවක් පෑවේය.

''වැටිච්ච අවුරුද්දවත් මතක නැහැ.''

කෝර්ෂුනොව්ද සිනාසුණි.

''හරි පුදුම වැඩක් නෙව. හැම දෙනෙක්ම හිතනව අගමැතිවරයයි, ඇමතිවරුයි රටේ සිදු වන, සිදු වූ හැම දෙයක්ම දන්නවයි කියල. ඒක වැරදි හැඟීමක්! අපි ඒ ගැන බොහොම ටිකයි දන්නෙ. කියන්න පවා ලජ්ජයි! එතරම් ටිකයි දන්නෙ! අපි වැඩි වැඩියෙන් හමුවෙලා කතා කරන්ට ඕන. ලියනිඩ් ඇලෙක්සේයෙවිච් දිගටම විස්තර කරන්න. ඉක්මන් වෙන්න එපා,'' යැයි ලෙනින් බැරෑරුම් ලෙස කීය.

ලෙනින්ගේ කතාව නිසා ප්‍රීතියට හා ධෛර්යයට පත් කෝර්ෂුනොව් කලින් සිතා ගත් සැළැස්ම අනුව තම අදහස් ඉදිරිපත් කරන්නට විය. කලකට පෙර සිටම මේ අදහස් ලෙනින්ට දැන්විය යුතු යැයි ඔහු සිතා සිටියේය.

''මෙතෙක් සොයා ගෙන ඇති ලොකුම උල්කාපාතය ටොන් තිස්හය හමාරකි. ඊළඟට ලොකුම උල්කාපාතය ටොන් විසි හතක් බර මෙක්සිකෝ උල්කාපාතයයි. එහෙත් දැන් අපට ලැබී තිබෙන කරුණු අනුව සයිබීරියානු උල්කාපාතය යෝධයෙක් බව කියන්ට ඕන. ඒ උනාට තවම ඒ උල්කාපාතය වැටී තිබෙන තැන හරිහැටි අපට සොයා ගන්ට බැරිව තිබෙනවා.''

''ඔහෙ කැමතිද උල්කාපාතය තියෙන තැනට යන්ට?'' කෝර්ෂුනොව්ගේ කතාව හමාර කරන්නටත් පෙර ලෙනින් ප්‍රශ්න කළේය.

''ඔව්. සත්තකින්ම ඔව්. ඒ උල්කාපාතය බලන්ට ඕන. මට අවබෝධ වෙනවා දැන් ඒ වගෙ දේවල් ගැන සළකා බලන්ට තරම් කාලයක් නැති බව...

Scanned with CamScanner

මා ඉල්ලා හිටින්නේ සුළු දෙයක් පිට රටවල සංවිධාන හදල තියනව සයිබීරියානු උල්කාපාතය ගැන සොයා බලන්න. එහෙත් අපට...''

''නැහැ, නැහැ, නැහැ, විදේශීය සංවිධානවලට කොහොත්ම ඉඩ දෙන්නෙ නැහැ. ඒ ගොල්ල හීන දකපුවාවෙ. ඔහෙගෙ ගමනට ඕන දේ මොනවාද?'' යි ලෙනින් ඇසුවේය.

''මම පොඩි ලැයිස්තුවක් හැදුවා'' යැයි කෝර්ෂුනොව් ඇතුළු සාක්කුවෙන් කඩදාසියක් ගෙන මේසය මත තැබීය. ''බොහොම අඩුවෙන් මම මේ ලැයිස්තුව හැදුවෙ, ව්ලදිමීර් ඉල්යිච්...''

ලෙනින් විද්‍යාඥයාගේ ලැයිස්තුව ඕනෑකමකින් කියවයි. දිගටම කියවන ඔහුගේ ඇස් බැම් හැකිළෙන සැටිද, මුහුණෙන් අප්‍රසන්නතාවයක් පළ වන සැටිද කෝර්ෂුනොව්ට පෙනේ. ලැයිස්තුව මේසය මත තබා එහි ලියා ඇති අකුරු හා ඉලක්කම් අත ගාන්නට වූ ලෙනින් කෝර්ෂුනොව් දෙස බැලිය. ඔහුගේ මුහුණ සෝකී බවක්ද ඇස් දැඩි බවක්ද කියා පෑය.

ලෙනින් දෙස බැලූ කෝර්ෂුනොව් අවිශ්වාසයකින් යුතුව කතා කළේය:

''පුළුවනි... තවත් කෙටි කරන්න. පාන් අඩු කරන්න. උපකරණ අඩු කරන්න. මිණින්දෝරු උපකරණ වලින් එකක් අඩු කරන්නම්. ඒ විතරක් නෙවි...''

ලෙනින් කාර්යාල කාමරයේ මුල්ලක් දෙස බලයි, විද්‍යාඥයා ඉන්නා බවක් හෝ කතා කරන සැටියක් හෝ ඔහුට නොදැනේ.

''මිණින්දෝරු උපකරණයක් වීසි කරනව'' යැයි තමාටම කියා ගත් ලෙනින් ඇස් හකුළුවා ගෙන කෝර්ෂුනොව් දෙස බැලිය. අසතුටට හා පුදුමයට පත්වූ කලෙක මෙන් ඇඟිලි තුඩුවලින් මේසයට ගැසූ ලෙනින් පුටුව පස්සට ඇද නැගී සිටියේය.

විද්‍යාඥයා දෙස නොබැලීමට තැත් කරමින් හෙතෙම මිට මෙළවූ අත් සාක්කුවලට ඔබා ගෙන ජනේලය දෙස බලමින් කාර්යාල කාමරය තුළ ඔබ මොබ ඇවිදින්නට විය.

''එහෙ තයිගා මහ වනාන්තරය'' යැයි ලෙනින් දැඩිව හා ස්ථිරව කීවේ විද්‍යාඥයාට ආධාර කිරීමට සහ තත්ත්වය පැහැදිලි කර දීමටය. ''හැතැප්ම දහස් ගණනක්ම පාරවල් නැහැ. වංකගිරිය වගේ. විශාල ගංගාවල්. නපුරු වන සත්තු. හැම තැනම ඝන කැලෑව. හැතැප්ම සියයක් ගියත් මනුස්ස ප්‍රාණයක් හොයා ගන්ට නැහැ... ඔහෙට මේක තේරෙනවද?''

ඔහු නැවතිණ.

''ඔහෙට මේක තේරෙනවද?'' යි නැවතත් ප්‍රශ්න කළ ලෙනින්, විද්‍යාඥය

Scanned with CamScanner

ඉදිරිපත් කළ ලැයිස්තුව දෙස බැලීය. "දවසකට පාන් රාත්තලයි. මුළු කණ්ඩායමටම සීනි රාත්තල් පහයි. දුම්කොළ..." ලෙනින් කියවන්නට විය. ඔහුගේ කට හඬ දැඩිය, වරෙක ඔහු පුදුමයටද තවත් වරෙක කණගාටුවටද පත් වෙයි.

"සීනි එපා. දුම්කොළ අඩු කරන්ට එපා. මදුරුවන්ගෙන් බේරෙන්නට දුම්කොළ ඕන," යැයි ස්ථිරලෙස විද්‍යාඥයා කීය.

ඔහු කියන දේ නැසුනාක් මෙන් ලෙනින් කතා කරන්ට විය:

"උපකරණ ආරක්ෂා කරන්ට කවරවලට ලොම් ඕන. උපකරණවලට!" යැයි ලෙනින් නැවත කීය.

කෝර්ෂුනොව් ඇස් කණ්ණාඩි කුට්ටම ගලවා පිස දමන්ට විය. ජනේලයෙන් වැටෙන එළිය ඇස් කණ්ණාඩිවලට වැටී ආලෝකධාරාවක් ඇති කළේය. අවසාන සටනට සැරසෙන යුද්ධ භටයෙකුගේ අධිෂ්ඨානයකින් යුතුව කෝර්ෂුනොව් කතා කළේය:

"ව්ලදිමීර් ඉල්යිච්! ලෙනින් සහෝදරය! යන්ට ඕනමයි! මේක අපට ලැබුණු වාසනාවක්, තේරුම් ගන්න. අජටාකාශයෙන් ආ ඒ අමුත්තා අපේ රටට වැටීම ලොකු වාසනාවක්. අපි මොනවද කරන්නේ?.. මේ උල්කාපාතය ප්‍රංශයෙ හරි අමෙරිකාවෙ හරි වැටුනානම් මෙලහකට කොච්චර විද්‍යාඥ කණ්ඩායම් යවලද! ඇත්ත තමයි, අපි අද බඩගින්නෙ. අපේ රට විදේශීය ආක්‍රමණයට අහු වෙලා. ඒ උණාට අපට පමණක් ලැබී ඇති මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට ඕන නොවෙද? අප හිහන්නො වුණ පළියට ලෝක විද්‍යාව වැරදිකාරයෙක් නෙවෙයි නෙව. මේ ගමන යන්ට ඕන, ව්ලදිමීර් ඉල්යිච්!"

කෝර්ෂුනොව් නැවත වාඩි විය.

"සත්තකින්ම!" යැයි කී ලෙනින් විද්‍යාඥයා වෙත ළං විය. "ඇත්තටම, යන්න. ලියනීඩ් ඇලෙක්සේයෙවිච් තමුසෙ පුදුම මිනිහෙක්. ඔහෙ ඉල්ලන දේ දෙන්නම්. හැබැයි ඒක බොහොම මදි. ඔතරම් පොඩියක් කෑම බීම අරගෙන සයිබීරියාව වගෙ දුර රටකට යන්න බැහැ. මොස්කව් ළඟ පෙදෙසකට නම් ඔය කෑම ටික ඇති වේවි. ඔහෙගෙ ලැයිස්තුවෙන් ඉල්ලා තියෙන්නෙ බොහොම ටිකයි. බොහොමත්ම ටිකයි!" ලෙනින් නැවත වරක් කීය. ලෙනින් අසතුටට පත් කළ හේතුව දත් කෝර්ෂුනොව්ට පැහැදිලිය. "ඔහෙල වගේ අයට ඕන කරන දේ අපට දීමට ශක්තියක් නැති වීම ගැන අප කණගාටු වෙනවා. කමක් නැහැ. අපට කල් දෙන්න!"

"ආ..." යැයි කෝර්ෂුනොව් ලෙනින් දෙස බලමින් කීය. ඔහු යමක් කීමට තැත් කළද, සිත සැහැල්ලු වීම නිසා එය කියා ගත නොහැකි විය. නළලෙන් වැගිරෙන් දහඩිය බිඳු ඔහු පිසද ගත්තේය.

135

Scanned with CamScanner

ලෙනින් විද්‍යාඥයා වෙත පැමිණ දයාන්විත ලෙස නැවත මෙසේ ඇසීය:

''ලියනිඩ් ඇලෙක්සේයෙවිච්, මේ ලැයිස්තුවෙ තියෙන දේවල් දෙනවනම් ඔහෙ යනවද?'' මේසය උඩ තිබෙන කඩදසිය පෙන්වමින්, ''ඇත්තටම යනවද?'' යි ඔහු නැවතත් ඇසීය.

''ව්ලදිමිර් ඉල්යිච්, ඔයිට වඩා දේ මම හීනෙන් වත් හිතන්නෙ නැහැ. හිම අඩු වුණ හැටියම ගමන් අරඹනව. අනේ දෙවියනේ, ඔයිට වැඩිය ඕන නැහැ. ඔහෙගෙන් හැමදෙනාම ඉල්ලනව නෙව. කොහෙන් දෙන්ටද?''

''යනවාමද?'' යි ලෙනින් ප්‍රශ්න කළේය.

''ඔව්, සත්තකින්ම.''

''මෙයට වැඩිය යමක් ඉල්ලන්නෙ නැතිද?''

''නැහැ. ඇත්තටම නැහැ.''

''වෙන අඩුපාඩු තියනවද?'' තෙවැනි වරටත් ලෙනින් ඇසීය.

''නැහැ.''

ලෙනින් අසතුටකින් මෙන් 'හ්ම්' කීය. පසුව ඔහු මේසයට යටින් බලා මඳ සිනාවක් පෑවේය.

''ආ උන්නැහෙ කරුණා කරල අර ජනේලය ළඟට යන්නැ'' යි මිත්‍ර ලීලාවකින් කෝර්ෂුනොව්ට කීය.

''ව්ලදිමිර් ඉල්යිච්, ඒ මොකටද?''

''ලියනිඩ් ඇලෙක්සේයෙවිච්, කරුණා කරල යන්න, මම ඉල්ලා හිටිනව,'' යැයි කී ලෙනින් දබරඟිල්ල දිඟු කරමින් ''මම තමුසෙව හඳුණනවා!'' යැයි කීවේ දඟකාර කොල්ලෙකු මෙනි.

''ව්ලදිමිර් ඉල්යිච්, ඔහෙ මගේ ලැයිස්තු අනුව ඕන බඩු දිමට එකඟ නම්, මම ඔහෙගෙ වේලාව නාස්ති කිරීමට කැමති නැහැ. මම යන්නම්.''

''එහෙම බැහැ. ඒව හරි යන්නෙ නැහැ. කරුණා කරල ජනේලය ළඟට යන්න. මම ඉල්ලා හිටිනව.''

කෝර්ෂුනොව් අකමැත්තෙන් නැගී සිට යමක් බලාපොරොත්තු වෙමින් ලෙනින් දෙස බැලීය.

ලෙනින්ද ඔහු දෙස බලා ගත්වනම සිටී.

''කරුණා කරල ජනේලය ළඟට.''

''හොඳයි'' කී කෝර්ෂුනොව් මේසය අසලින් ඉවත් විය.

ලෙනින් විද්‍යාඥයා දෙස බැලීය:

''හරියට හරි. මා හිතූ විදියටම තමා. කොහොමද උන්නැහෙ තමුසෙ තයිගාවට යන්නෙ ඔය කැඩිච්ච සපත්තු ඇඳ ගෙන? මොස්කව්වල ඉඳල

හැතැප්ම පහක් යනකොට ඔය සපත්තු වීසි කරන්ට සිද්ද වේවි,'' යැයි ලෙනින් කීය.

''යන්ට පුළුවනි. ලනුවකින් බඳිනව, ඇතුළු කොටස රෙදි කෑල්ලකින් ඔතනව.''

''පුළුවනි'' යි තරමක් කල්පනා කළ ලෙනින් කීය. ''ඒ උනාට ඔහෙට තවත් සපත්තු කුට්ටමක් නැහැ නෙව?''

''කොහෙන් හොයන්ටද? තිබුණ ඒව ගෙවිල ගිහින්. මේ සපත්තු දෙක බොහොම ප්‍රවේසමින් අඳිනව...''

''ඔය සපත්තු කුට්ටමෙනුත් පුළුවනි'' යි කී ලෙනින්, ''සමා වෙන්න, ලියනිඩ් ඇලෙක්සේයෙවිච්, සමා වෙන්න'' යැයි කීවේය.

ලෙනින් කෝර්ෂුර්නොව්ගේ උරහිසෙන් අල්ලා ඔහු වාඩි කරවා ''තරහ ගොසින්ද?'' යි බැලුවේය. විද්‍යාඥයා කේන්තියෙන් නොවන බව දුටු ලෙනින් සංසුන්ව කාමරය තුළ සක්මන් කරන්ට විය.

''අප ළඟ ඉතාම දක්ෂ මිනිස්සු ඉන්නව. ට්සියොල්කෝව්ස්කි ගැන බලමු. ඈත පළාතක රුසියානු නගරයක, පරණ ලැලි ගෙදරක, තණකොළයි, තාරාවොයි, ඌරොයි එක්ක ඒ මහළු ගණිතාචාර්යවරයා ජීවත් වෙනවා. සමහරවිට මහ පාරෙද දන්නෙ නැහැ. පාන් සහ මාළු විතරයි එයාට ලැබෙන්නෙ. උදේ සිට රෑ වනතුරු එයා අජටාකාශ තරණය පිළිබඳ ප්‍රශ්න ගැන ලියනව. එයාගෙ කාමරය සීත කාලෙදිවත් උණුසුම් නොකර ඇති. ඔහෙත්, උන්නැහෙ ඒ මගම ගමන් කරනව. හැතැප්ම දහස් ගණනක් දුර තායිගාවට යන්න හදන්නෙ ඔය කැඩිච්ච, පරණ සපත්තු හැඳ ගෙන'' යැයි ලෙනින් කීය.

''හොඳා ඔහෙ මොනවද කරන්නෙ ව්ලදිමිර් ඉල්යිච්, 'සමාජවාදය' කියන වචනය කියවීමට පවා අකුරු නොදන්නා අය වැඩිහරියක් ඉන්න රටක සමාජ වාදය ගොඩනගනවා,'' යැයි කෝර්ෂුනොව් කල්පනා කළේය.

ලෙනින් සහ තමාත් අතර කිසියම් සමානතාවයක් ඇති සැටි පළමුවැනි වරට කෝර්ෂුනොව් පැහැදිලි ලෙස දුටුවේය. ලෙනින් සහ ඔහු එකම දෙයක් සඳහා ක්‍රියා කරතියි ඔහුට සිතේ. කලූගාහි පදිංචි ට්සියොල්කෝව්ස්කි අජටාකාශය තරණය කිරීම පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීම තම ප්‍රධාන කාරිය හැටියට සළකා ක්‍රියා කරයි. කුසගින්නෙන් පෙළෙන කම්කරුවෝ කම්හල් නැවත ගොඩ නගති, ගොවියෝ බිම් සකස් කොට ගොවිතැන් කරති...

ප්‍රීතියට හා ප්‍රමෝදයට පත් විද්‍යාඥයා පිටව ගියේය. ක්‍රෙම්ලිනය ඔස්සේ දිවගිය ඔහු රතු චතුරශ්‍රයට පැමිණියේය. අනාගතය ගැන ඔහු කල්පනා කරයි. ඔහුගේ සිතැඟියාවන් ඉටු වන බව ඔහුට සහතිකය.

''රටේ කම්හල් ක්‍රියා කරන දවසක් එනු ඇත. අද නැති මොටෝ රථ





Scanned with CamScanner

කම්හල් හා ට්‍රැක්ටර් කම්හල් පවා එදට වැඩ කරනු ඇත. ක්‍රෙම්ලිනයේ කුඩා කාමරයක හිඳ වැඩ කරන පුද්ගලයාගේ සිතෙහි පමණක් මැවී ඇති අදහස් රට පුරාම ක්‍රියාකාරී වනු ඇත... එදට හැමදෙනම පුෂ්කින්ගේ හා තොල්ස්-තෝයිගේ කෘතීන් කියවනු ඇත. අඩක් වනචාරීත්වයේ ගැලී සිටින රුසියාව එදට උගතුන්ගෙන් පිරී යනු ඇත... සත්තකින්ම එදට විද්‍යාඥයින්ගේ කණ්ඩායම් උත්තර ද්‍රැවයට ගොස් පරීක්ෂණ පවත්වනු ඇත. කිසිවෙක් මහා සාගරයේ පතුලට යනු ඇත. තවෙ'කෙක් අජටාකාශයට යනු ඇත. විශාල නව රජයේ සංවිධායකයාට කරදර කිරීමට විද්‍යාඥයින්ට සිදු නොවනු ඇත. දවසකට පාන් රාත්තල් කාලක් සහ දුම්කොළ ටිකකට පමණක් එදට සීමා නොවනු ඇත. මිනිසා ගැන අළුත් හැඟීමක් ඇති නව පරම්පරාවක් හැදී වැඩෙනු ඇත. මේවා සියල්ලම අනාගතයේදී සිදු වනු ඇත.

එහෙත් අද පාරවල් හිමවලින් පිරිලාය. සීතලෙන් බේරීම සඳහා පයින් යන්නෝ වේගයෙන් යති. වැහැරී ගිය අශ්වයෝ සෙමින් යයි.ගොවි කබායක් හැඳ සිටින මිනිහෙක් ඌ දෙස බලා ''ඒයි, කම්මැලියා!'' කියා කෑ ගසයි. විශාල නාම පුවරු ඇති කුඩා කඩ — ''මර්ටයානොව්'', ''ගුරින් සහ පුත්‍රයෝ'', ඉ. වි. කෝෂ්කින්'', ''යකඩ බඩු වෙළෙන්ද'' — වසා දමා ඇත. අද තත්වය එසේය.

... සෙබල හිස් වැසුම් හැඳ ගත් රතු හට පිරිසක් ගමන් කරති. පාර පුරා හඬ නගමින් යකඩ නළ ගොඩක් හිම යානා මත තබා ඇද ගෙන යති. කිසියම් කම්හලක් ගොඩ නැඟීමට විය හැකිය, නැතිනම් ප්‍රති සංවර්ධනය සඳහා විය යුතුය. ජනේලයක් තුළින් කාල් මාක්ස්ගේ පින්තූරය පෙනේ. ආදර්ශ පාඨයක මුල නොපෙනෙතත් අග කොටස කියැවිය හැකිය: ''... ජයවේවා!''. රතු පටියකින් කෙස් කරල බැඳ ගත් ගැහැණියක් දෙරින් දෙරයයි.

පළල් උරහිස් ඇති මිටි පුද්ගලයා ක්‍රෙම්ලිනයේ කාර්යාල කාමරය තුළ සක්මන් කරයි. ඒ විශාල රට මැද ඔහු කල්පනා කරමින්, වේගයෙන් යමක් ලියයි, සටහන් කරයි. රුසියාව සම්පූර්ණයෙන්ම වෙනස් කළ හැකි ඒ අනාගත වැඩ පිළිවෙළ ඔහු දකී.

Scanned with CamScanner

## රහස් ආයචනය

කම්කරුවෝ සහ ගොවියෝ දහස් ගණනින් ව්. අයි. ලෙනින්ට ආහාර ආදිය එවන්නට පටන් ගත්හ: පාන්, ධාන්‍ය, සීනි (ඒ දවස්වල රුසියාවේ ආහාර තත්ත්වය අයහපත් විය). හම් පදම් කරන කම්කරුවෝ ලෙනින්ට, බැටළු හමින් කළ කබායක් එවූහ, වෝලොග්දාහි ගෙත්කම්කරුවෝ ගෙත්තම් සහිත ඇඳ-පොරෝනයක් එවූහ, පෙත්රොග්‍රාඩයේ රෙදි කම්කරුවෝ සිනිඳු ලොමින් යුත් පොරෝනයක් තෑගි කළහ. 139

එවැනි තෑගි නිසා ලෙනින් අසතුටු විය.

''ව්ලදිමීර් ඉල්යිච්, ඔය තෑගි ඒවන්නේ මුළු හිතින්, හදවතින් පැන නගින ආදරය හින්ද'' යැයි ලෙනින්ගේ සගයෝ ඔහු සන්සුන් කළහ.

''ඒක තමා කාරණය, ඒ කොහොම උණත් ඒව පිළිගන්න හිත දෙන්නෙ නැහැ. ආදිකාලෙ සිට එන පුරුද්දක් අනුව කරන වැඩක් ඔක. රදළ හාම්පුතාට තෑගි බෝග ගෙනගියා. පල්ලියෙ පූජකයාට ඒ වගේම තෑගි ගෙනගියා... ඔය වැඩේ නවත්වන්න ඕන. නවත්වන්න ඕන! '' යැයි දැඩි ස්වරයකින් ලෙනින් පැවසීය.

දවසක් ද ලෙනින්ට ලිපියක් ලැබිණි. ගෝමෙල් පෙදෙසේ ක්ලින්ට්සි නගරයේ ස්ටොඩෝල්ස්ක් රෙදි කම්හලේ කම්කරුවන් විසින් එවන ලද ලිපියකි, ඒ.

ලෙනින් ලිපිය කියවයි, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ පස්වැනි ජයන්තිය නිමිත්තෙන් කම්කරුවෝ ලෙනින්ට සුබ පතති, නිරෝගී වේවායි පතති. එම ලිපියේ අග කොටසෙහි මෙසේ ලියා තිබිණ: ''... උත්සවය නිමිත්තෙන් සහෝදරයා වෙත තෑග්ගක් එවමු. එය අප විසින්ම සාදන ලද්දකි.'' ඒ තෑග්ග රෙදි කෑල්ලකි.

ලිපියේ අත්සන් රාශියකි. සුළු පටු ගණනක් නොවේ, අත්සන් හාර සියයකි.

ලෙනින් කෝපයට පත් වුවද එය මැඩ ගත්තේය. උත්සවය ළංව ඇති බැවින් කම්කරුවන්ගේ බලාපොරොත්තු කඩ කිරීමට ඔහු අකමැති විය.

ලෙනින් පෑන අතට ගෙන කම්කරුවන්ට පිළිතුරු ලීවේය:



Scanned with CamScanner

ආදරණීය සහෝදරවරුනි!

ඔබ එවූ සුබපැතුම හා තෑග්ග ස්තුති පූර්වකව මම භාර ගතිමි. මා රහසක් කියන්ට කැමතියි, මට තෑගි එවන්න එපා. මේ රහස සියලුම කම්කරුවන් අතර හැකි තරම් පළල් ලෙස පතුරුවා හරින්න.

ඔබගේ සහෝදර

වි. උල්‍යානොව් (ලෙනින්)



ලෙනින්ගේ ලිපිය ලැබූ කම්කරුවෝ එය කියවා බලා ප්‍රීති වූහ. ලියුම අගනේය, උණුසුම්ය, කෘතඥතාවය පළ කරන්නකි.

ලෙනින්ගේ ඉල්ලීම ගැන කම්කරුවෝ කල්පනා කරන්ට වූහ. ලෙනින් තෑගිවලට අකැමති බව ඔවුන්ට අවබෝධ විය. රහසක් වුවද එම ඉල්ලීම ඇත්තක් බව ඔවුහු වටහා ගත්හ. ලෙනින්ගේ ඉල්ලීම සටන්කාමී නියමයක් ලෙස ඔවුහු පිළිගත්හ. ක්ලින්ට්සී නගරයේ කම්කරුවන් අතර පමණක් නොව වඩාත් පුළුල් ලෙස මුළු මහත් ප්‍රදේශය පුරාම එම රහස පතුරුවා හරින ලදී.

## මල් පැළ

නොදනුවත්වම ඔර්ලෝසුව දෙස බැලූ නදේෂ්ද ක්‍රෑප්ස්කයා, අවසාන වැකිය කියවා පොත වැසුවාය.

''අදට ඔය ඇති, මට මහන්සියැ'' යි දිග සුසුමක් හෙලුවාය.

කියවීම සඳහා වෛද්‍යන් වෙන් කර ඇති කාලය ඉවර වී ඇති බැව් වි. අයි. ලෙනින් තේරුම් ගත්තේය. ඔහු කවුළුව අසලට ආවේය. නොවැම්බරයේ සීත වැස්ස නිසා ඇඟ හිරි වැටේ. කළු පැහැති අතු මත වැටෙන වැහි බින්දු විදුරු කැට මෙන් විනිවිද පෙනේ. වැස්ස නිසා තෙත බරි වී සිටින ගේකුරුල්ලෝ පැන පැන යති. සුළං පහරකට හසු වූ කලෙක මෙන් කුරුළු රැන එකවර පියාඹා ගොස්, හිස් කුරුළු පෙට්ටියක් මත ලැග්ගාහ.

අඩිපාර ඔස්සේ මිනිස්සු පා නගති. හිස වැසෙන කොට්ටඋර වැනි වැස්මක් හැඳගත් ගැහැණුන් දෙදෙනෙක් පෙරටුව ගමන් කරති. දණහිස දක්වා දිගැති සපත්තුවලින් ඔවුන්ගේ පාද වැසී ඇත. කැප් තොප්පි හිස ලා ගත් පිරිමි දෙදෙනෙක් පසුපස ගමන් කරති. රළු ලොමින් කළ කබා ඔවුහු ඇඟ ලා සිටිති. මේ හතරදෙනා මෙහි ආ පළමුවැනි වතාව මෙය බව දැනගත හැකිය. ලොකු මල් පාත්තිය ළඟට ආ ඔවුහු ගෙදර දක්වා වැටී ඇති පාර සොයා ගැනීම පිණිස මොහොතක් නැවතුණාහ.

''අප හමුවන්ට කවුදෝ ඇවිල්ලා'' යැයි ලෙනින් කිය.

නදේෂ්ද ක්‍රෑප්ස්කයා උඩු මහලේ සිට පහතට බැස්සාය. ඇය හමුවීමට මරියා උල්යානොවාද ආවාය.

''ග්ලූහොව් කම්කරුවො ඇවිල්ල ව්ලදිමිර් ඉල්යිච් හමුවෙන්න'' යැයි ඈ කීවාය.

ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වයට හානි කර බැවින් අමුත්තන් පිළිගැනීම වෛද්‍යන් විසින් තහනම් කරන ලදී. ක්‍රෑප්ස්කයා මේ අමුත්තන් නිසා නොසන්සුන් වූවාය.

ලෙනින් තරප්පු පෙළදිගේ ඇති වැටට උඩින් පැන, ''කවුද ආවේ? කවුද?'' යි ඇසීය.

''ග්ලූහොව් කම්කරුවන්ගෙ නියෝජිත පිරිසක් අයියව හමුවන්ට ඇවිල්ලා.

ලියුමක් ගෙනත් තියෙනව. මෙන්න මම ලියුම ගෙනෙනවා,'' යැයි මරියා උල්යානොවා කීවාය.

ලෙනින් කබායේ කර පියවමින් බොත්තම දැමුවේය.

''ඒ අයට මා ළඟට එන්න කියන්න.''

''දෙස්තරලා...'' යැයි කෘප්ස්කයා ගත් කටටම කීවාය.

දෙස්තරවරුන්ගේ නිගමනය හරිද? මිනිස්සු නොදැක සිටීම ඉතාම හොඳ බෙහෙත යැයි ඔවුන් නිගමනය කරන්නේ ඇයි? මේ හමුවීම නිසා ලෙනින් ප්‍රීතිවනු ඇත. ප්‍රීතිය සෞඛ්‍යයට හානි නොකරයි.

142

නදේෂ්ද කෘප්ස්කයා මරියා උල්යානොවා දෙස බලා තීරණාත්මක ලෙස මෙසේ කීවාය:

''හොඳා. ඒ ගොල්ලන්ට එන්ට කියන්නම්''

ග්ලුහොව් කම්කරුවන් සමග ලෙනින් බොහෝ කලක සිටම මිත්‍ර සම්බන්ධකම් පවත්වා ගෙන විත් ඇත. එම නියෝජිත පිරිස හමු නොවී සිටීමට ඔහුට බැරිය. ඔව්හු තරප්පු පෙළ නගිති. ලෙනින් ඔවුන් හමුවීමට ඉදිරියට ආවේය. නියෝජිතයින් දෙස ඔහු ඕනෑකමින් බලයි.

ඉදිරියට ආවේ මහළු කම්කරු කාන්තාවකි. පැසුණු හිසකෙසින් පිරි ඇගේ හිස රතු ලේන්සුවකින් වසා ඇත. ඇගේ එක අතක පයිල් කවරයකි. අනිත් අත ලෙනින් වෙත දිගු කරයි.

''මම ගෙත්තම් වැඩ කරන්නියක්. මගේ නම පෙලගේයා හොලදෝවා'' යැයි කී ඇ ආචාර කරයි.

''මතකයි, මතකයි'' ලෙනින් මඳ සිනා පාමින් කියයි.

ඇය පිටුපසින් තරුණියකි. ඇය තරමක් කුලෑටි ගතියක් පාමින් සිනාසෙයි. ඇගේ දුඹුරු පැහැති හිසකේ ගොතා ඇත.

''මගේ නම ක්ලාව්දියා ගුසෙවා, මම රෙදි වියන යන්ත්‍රයක වැඩකරනවා,'' යැයි ඇ ලෙනින්ට අත දී ආචාර කරමින් පැවසුවාය.

උස මහත ශක්තිමත් මහල්ලෙක් ප්‍රවේසමින් පලස මත අඩි තබයි. ඔහු රළු සපත්තු දෙකක් හැඳ සිටී. දක්ෂ ශිල්පියෙකු බව ඔහුගේ විලාසය කියා පායි.

''යකඩ වැඩ කරන්නෙක් වන ද්මිත්‍රි වසිල්යෙවිච් කුස්නෙට්සෝව්.''

නිල්පැහැති කමිසයක් හැඳි තරුණයා දෙස ලෙනින් මහත් ඕනෑකමකින් බලයි.

''ගෙරාසිම් කස්ලොව්, ගෙත්තම් වැඩ කරනව.''

හැම කෙනෙකුටම අත දී ආචාර කරන ලෙනින්, වාඩි වන ලෙස ඔවුන්ට කියයි.

Scanned with CamScanner

ලෙනින්ට සුබ පතමින් කතා කිරීම සඳහා පෙලගේයා හොලදෝවා කලින් පිළියෙළ කරගත් වචන මතක් කිරීමට මහන්සි ගත්තාය.

''ව්ලදිමීර් ඉල්යිච්, කොහොමද සැපසනීප, කොහොමද සුවදුක්?'' යැයි ඈ හිටිහැටියේම ඇසුවේ කලින් පිළයෙළ කරගත් කතාව අමතක කරමිනි.

''හොඳයි, බොහොම හොඳයි.''

එය ඇත්තය. දැන් ඔහු රෝගියෙක් නොවේ. ඔවුන්ගෙන් බොහෝ ප්‍රශ්න ඇසීමට ඔහුට උවමනාය. අදහස් ගොඩකි. ඔවුන් සමග සාකච්ඡා කිරීමට ඔහු නොඉවසිල්ලෙන් බලා සිටී.



''සහෝදරය සනීපය ආරක්ෂා කර ගෙන, මහන්සි නොවී වැඩකටයුතු කළ යුතුයැයි අපි යෝජනාවක් කම්හලේ මහ සභා රැස්වීමේදී ඉදිරිපත් කළා. දෙළොස් දහක් කම්කරුවෝ ඒකච්ඡන්දයෙන් යෝජනාව සම්මත කළා. කම්කරුවෝ වන අප උදෙසා සහෝදරයා ආරක්ෂා වෙන්ට ඕන'' යැයි පෙලගේයා කීවාය.

''මම මහන්සි ගන්නම්'' යැයි සුහද සිනාවක් පෑ ලෙනින් පිළිතුරු දුන්නේය.

මරියා උල්යානොවා සහ නදේෂ්ද ක්‍රෲප්ස්කයා යාබද කාමරයේ දෙර අසල සිට ගෙන, ප්‍රීතියෙන් සිනාසෙන ලෙනින් දෙස බලා සිටිති.

පයිල් කවරය ලෙනින් වෙත දිගු කළ පෙලගේයා, ''අපේ කම්කරුවො සහෝදරයට ලියුමක් එව්වා'' යැයි කීවාය.

ලෙනින් කවරය අතට ගෙන, එහි වූ ලියුම කියවන්නට විය. එය රතු හා කළු අකුරුවලින් ලියන ලද්දකි. ඔහු මහත් ඕනෑකමකින් ලියුම කියවයි. සමහර වචන ඔහු දෙවරක් කියවන්නාසේය.

''... වැඩ කරන දවස්වලදීත්, දුක් කරදර සහිත කාලයේදීත්, ප්‍රීතිමත් දවස්වලදීත් ඔබ අපට අවශ්‍ය වූවාක් මෙන්ම, ජර්මන් විප්ලවය වැඩී එන මේ කාලයේදීත් ඔබ අපට අවශ්‍ය වී ඇත...''

''ස්තුතියි! මා කෙරෙහි විශ්වාසය තැබුවාට බොහොම ස්තුතියි.''

''අපි සහෝදරයට තෑගි ගෙනාවා!'' යැයි පෙලගේයා කීවාය.

ලෙනින් ඇස් බැම් හකුළුවා ගත්තේය.

''තරහ වෙන්ට එපා! අපි චෙරි පැල කිපයක් ගෙනාවා'' යැයි මහලු කුස්නෙට්සෝව් පැහැදිලි කළේය. ''සහෝදරයාගෙ ජනේලෙ ඉදිරිපිට ගෙවත්තෙ අපි ඒවා හිටවන්නම්. වසන්ත කාලෙදී මල් පිපේවි. සහෝදරය ඒව දිහා බලා ප්‍රීති වේවි. චෙරි මල් බොහොම පිරිසිදුයි, සුදුපාටයි, ප්‍රණීත සුවඳක් ලැබෙනවා, ශරීර සනීපෙට බොහොම හොඳයි. ජනේලෙන් එපිට බලන්න...''

ලෙනින් ගෙවත්ත දෙස බැලීය. ලොකු මල් පාත්තිය අසල, බාල දක්සයින් මෙන් චෙරි පැල දහඅටක් පෙළට තබා ඇත. පැළවල මුල් ප්‍රවේසමින් ගෝනි වැනි ඝන රෙදිවගයකින් බැඳ රතු රෙදිපටිවලින් ගැට ගසා ඇත. සුළං පහරට නැවෙන කොළ රහිත අතු ඇති චෙරි පැළ දෙස බලාසිටින ලෙනින් ඒ ගස් වැඩී මල්පල හටගෙන තිබෙන සැටි සිතින් මවා ගනී…

රෝගය නිසා හෝ කැළඹීම නිසා හෝ සුදුමැලි වී සිටින ලෙනින් දෙස බලන මහළු කුස්නෙට්සෝව් මෙසේ සිතයි: ''සහෝදරය අපට බොහොම වටිනව. අප වෙනුවෙන් සහෝදරය හිර ගෙවල්වල, පිටුවහලෙ දුක් වින්ද. පිට රටවලට ගිහින් දුක් කරදර ඉවසා ගෙන අප වෙනුවෙන් වැඩ කළා.අපේ සැපත සඳහා ක්‍රියා කරන විට සහෝදරයට විෂ කැවූ වෙඩි උණ්ඩවලින් වෙඩි තැබුවා. අප නිසා වෙහෙස මහන්සි වූ හන්ද සහෝදරය අසනීප වුණා.''

''පිරිසුදු සුදු පැහැති මල්'' යැයි තමාටම කියාගත් ලෙනින්, ''ස්තුතියි, බොහොම වටිනා තෑග්ගක්'' යැයි කීවේය.

මෙහිදී මහළු කුස්නෙට්සෝව් ඉදිරියට ගොස් ලෙනින් වැළඳ ගත්තේය.

''මම යකඩ වැඩ කාරයෙක්. යකඩය තලා අපට ඕන විදියට හද ගන්නව වගේ, සහෝදරය පෙන්වූ මග අපි හද ගනිමින් ඉන්නවා'' යැයි කීය.

ලෙනින්ද කම්කරුවා වැළඳ ගත්තේය. දෙදෙනාම එකිනෙකා බද වැළඳ ගෙන ගල්ගැසුණාක් මෙන් සිටිති. පෙලගේයා ඇසින් වැගිරෙන සතුටු කඳුළු පිස දමා ගත්තාය.

පහත මාලයේ ලොකු කාමරයේ තේ මේසය පිළියෙළ කොට ඇත. එහි ජනේල අසල මල් පැළද, පාම් ගස්ද කීපයකි. සමවාරය හඬ නගයි.

නියෝජිතවරුන්ට රෑ කෑම සඳහා පැමිණෙන ලෙස මරියා උල්යානොවා ආරාධනා කළාය. එහෙත් කිසිවකු ආහාර ගැනීමට ආශාවක් නොදැක්විය. හැමදෙනම උඩුමහලේ සිටි ලෙනින් හමුවී කළ කතාබහ ගැන සිතති.

''කන්න සහෝදරවරුනි, කන්න'' යැයි කී මරියා උල්යානොවා කෑම බෙදන්නට වූවාය. ඇයද කැළඹී ගත් සිතිනි. ''ලෙනින් සහෝදරය විසින් එකතු කළ මේ හතු බොහොම රසයි, කා බලන්ට'' යැයි කීවාය.

මරියා උල්යානොවාගේ මේසය ඉදිරිපිට පත්තර මිටියකි. එහි ''ප්‍රව්දා'' පත්‍රයක සිරස් තළ මෙසේය: ''ජර්මන් ධනපතියෝ ප්‍රතිප්‍රහාර ගසති'', ''ජර්මනියේ දුර්භික්ෂයකි'', ''බල්ගේරියාවේ ධනපතිහු ත්‍රස්තවාදී ක්‍රියා කරති'', ''පෝලන්තයේ ලොඩ්ස් නගරයේ කම්කරුවෝ වැඩ නවත්වති.''

''ලෝක ධනපති පංතියට යකා වැහිල'' යැයි පුවත්පත දෙස බැලූ කුස්නෙට්සෝව් කීය: ''ඔව්, උන්ට යකා වැහිල. ජර්මන්, බල්ගේරියානු, පෝලන්ත කම්කරුවන්ට උත්සව පැවැත්විය හැකි දවසක් ඒවි.''

Scanned with CamScanner

''ලෙනින් සහෝදරය ඒ ගැන විශ්වාස කරනවා,'' යැයි මරියා උල්යා නොවා කීවාය.

''ඔය ගොල්ලන්ට වැඩ තියෙනව නෙව. අපි යන්නම,'' යැයි පෙලගේයා කියත්ම,

මරියා උල්යානොවා එයට විරුද්ධ වූවාය:

''කොහෙ යන්නද මෙ රෑ. හරි සීතල. ඔහෙලට යන්ට ඉඩ දෙන්නෙ නැහැ. අද රෑ මෙහෙ නවතින්න. උදේට වෙරි පැළ ඉන්දවන්ට ඇහැකි'' යැයි ඇ කීවාය.

කම්කරු නියෝජිත පිරිස සතුටු විය. ලෙනින් අසල නැවති සිටීමට අවස්ථාවක් ලැබීම ඔවුන්ගේ සතුටට හේතු විය.

''ඔය ගොල්ලන්ට මොනවහරි උදව් ඕනද? ග්ලුහොව් කම්කරුවො කොහොමද ජීවත් වෙන්නේ?'' ආදී ප්‍රශ්න මරියා උල්යානොවා ඔවුන්ගෙන් ඇසුවාය.

ඒ කාලයේදී කම්කරුවන්ගේ තත්ත්වය අතිශයින්ම අයහපත් විය. යුද්ධය නිසා ඇති වූ විනාශය කම්කරු දුක වැඩි කළේය.

එහෙත් නියෝජිතවරු තමන්ගේ දුක් කරදර කිසිවක් නොකීහ.

''අපේ ඉල්ලීමත්, උවමනාවත් එකයි. ලෙනින් සහෝදරයට ඉක්මනින් සුවය ලැබෙන්ට ඕන.''

නියෝජිතයෝ රෑ නොනිද උන්හ. ඔවුහු පහත් හඬින් කතා කරන්නට වූහ. කන් දී අසා සිටියහ. ගෙය නිසලය.

උදෑසන මරියා උල්යානොවා ආවාය.

''ලෙනින් සහෝදරය හොඳට නිදා ගත්තද? අසනීප වුණෙ නැතිද?'' මෙ වැනි ප්‍රශ්න නියෝජිතවරු ඇසූහ.

''හොඳට නිදා ගත්තා. උදේ නැගිට සතුටින් ඉන්නව පෙනුණා. ආයෙමත් ඔහෙලගෙ ලියුම කියවල බොහොම සන්තෝස වුණා,'' යැයි මරියා උල්යා නොවා පැවසුවාය.

උදෑසන හිරුගේ ආලෝකය පැහැදිලිය. කුඩා හිම වීදුරු කැට මෙන් දිලිසෙයි. රෑ හිම වැටිණ. වෙරි පැළ හිමෙන් වැසී, වසන්තයේ මල් පිපුණු කලෙක මෙන් සිරියාවක් ඇති කරයි. ගේ කුරුල්ලෝ අත්තෙන් අත්තට පනින විට, කුඩා හිම වැටේ. වසන්තය උදාවත්ම දවසින් දෙකෙන් ගස් හා අතු ලාපැහැති දළු හා කොළවලින් පිරියයි. වි. අයි. ලෙනින් සිය ජීවිතයේ අවසාන කාලය ගත කළ නිවෙස වටා ඇති ගස් හා වැල්ද වසන්තයේදී කොළ හා මල් වලින් පිරී යයි. 'ගෝර්කි ලෙනින්ස්කියෙ' නම්වූ මේ තැන් සිට අවට බලනවිට සුදු පැහැති වෙරි මල්වලින් පිරි වත්ත සුදෝසුදු කමිස හැඳගත් පයිනියර් ළමා හමුවක් මෙනි.





Scanned with CamScanner

ඇස්. ඇලෙක්සේයෙව්

## හිම කුරුල්ලා



ගෝර්කිහි විවේක ගනිමින් සිටි ලෙනින් උයනේ ඇවිදිමින් සිටියේය. ඔහු වඩාත් ප්‍රිය කළ තැන උසට වැඩුණු දේවදර ගසක්ද, බර්ච් ගසක්ද, ඒ වටා පඳුරු කීපයක්ද ඇත.

බර්ච් ගස යටට එන ලෙනින් බොහෝ වේලාවක් යනතුරු ඒ දෙස බලයි.

මොනවද එතැන තියෙන්නෙ? කවුද එතැන ඉන්නෙ?

හිම කුරුල්ලො.

සීත සෘතුව. පාරවල් හිමෙන් වැසිලාය. නත්තල් ගස් සුදෝසුදු හිම කබා හැඳ ගත්තාක් මෙනි. කුරුල්ලෝ පියාඹා යති. උයනෙහි ඉතිරිවැ සිටියේ එකම එක හිම කුරුල්ලෙක් පමණකි. ශීත සෘතුව නිසා ඔවුන් ප්‍රීති වන්නාක් මෙනි.

ලෙනින් ඒ හුරතල් ලස්සන කුරුල්ලන් දෙස බලයි. එකෙකුගේ බෙල්ල සහ පපුව රතු පාටය. අනිකාගේ බෙල්ල ලා රත් පැහැයෙන් දිලිසෙයි. පියාඹා යන කුරුල්ලෙකුගේ බෙල්ල හා පපුව රතු ධජයක් මෙනි. එක් හිම කුරුල්ලෙක් ලෙනින්ගේ සිත් ගත්තේය. ඌ මුරණ්ඩු, සන්ඩුකාරයෙකි.තවත් කුරුල්ලෙක් සමග පොර කාගත් බව උගේ හිසේ කුඩා පිහාටු කියා පායි. උගේ හිසේ එක් පිහාටුවක් කෙළින් වී ඇති හෙයින් ඌ ලෙහෙසියෙන් හඳුනා ගත හැකිය. ඌ එසේ මෙසේ එකෙක් නොව කාරණා තේරෙන එකෙකි. අන් කුරුල්ලන්ට වඩා තමාට ලෙනින් කැමති බැව් ඌ දනී.

ලෙනින් පැමිණෙන වෙලාව කුරුල්ලෝ දනිති. පාන් පොතුද, කුඩා ඇට හා ධාන්‍යද ගෙනැවිත් ඔහු කුරුල්ලන්ට දෙයි.

අරුණෝදය වෙත්ම බර්ච් ගහට වහන කුරුල්ලෝ ලෙනින් එන තුරු බලා සිටිති.

හිම කුරුල්ලෝ එක තැන හිඳ බලා සිටීමට අකැමතියහ. එහෙත් ඔවුන්ට මෙය පුරුද්දක් විය.

රතු ධජයක් වැනි බෙල්ලක් හා පපුවක් ඇති හිම කුරුල්ලා දෙස බලන ලෙනින් ප්‍රීති වෙයි. ගස් අත්තක වහන හිම කුරුල්ලෙක් හිස ඔසවා බෙල්ල

Scanned with CamScanner

දිගු කොට, ''බලන්න! මම නෙවිද ලස්සනම කුරුල්ලා?'' යන්න අසන්නාක් මෙන් තටු ගසයි.

''ඇත්තටම ලස්සන'' යි ලෙනින් කියයි.

දේවදාර ගසේ අත්තක සිට බර්ච් ගසේ අත්තකට පනින කුරුල්ලෙක් නැවත අසල පඳුරකට පැන වටයක් පියාඹයි. නැවත අත්තෙන් අත්තට පනියි. ලෙනින්ගේ හිසට උඩින් පියාඹා ගොස් හිම කැටි ගොඩකට හොටෙන් අනී. මෙන්න මගේ හපන්කම්! ''මම තමයි හොඳටම ලස්සන කුරුල්ලා එහෙම නෙවද?''



එහෙත් එක් දවසක් උයනට ආ ලෙනින් ඒ දඟකාර කුරුල්ලා නොදුටුවේය. උයනේ ඒ මේ අත ඇවිද නැවත දේවදාර ගහ ළඟට විත් කුරුල්ලා සෙව්වේය. ඌ නැත.

ලෙනින් තරමක් නොසන්සුන් විය.

''කුරුළු පැටියට මක් වෙලාද?''

ඒ කුරුල්ලා උගුලකට අසු වී ඇත. යෙගෝර් ඉසායෙව් නමැති කොල්ලා ඌ අල්ලා ගෙන කූඩුවක දමා ඇති කරන්ට විය. කුරුල්ලාට ඒ කූඩුව තුළ ජීවිතය ප්‍රිය නොවීය.

කුරුල්ලා සොයා ගත නොහැකිවූ නමුදු ලෙනින්ට යෙගෝර් හමුවිය. කොල්ලා නැවත උයනට විත් කුරුල්ලන් ඇල්ලීම සඳහා උගුල් ඇටවිය.

තාත්තාගේ හිම තොප්පිය ලා ගෙන, සීයාගේ හිම සපත්තු හැඳ ගෙන සිටින යෙගෝර් දෙස ලෙනින් බැලීය.

''රතු බෙල්ලක් ඇති අර හිම කුරුල්ලව උඹ දැක්කෙ නැතිද පැංචො?'' යැයි ලෙනින් ඇසීය.

''ඔව්'' යැයි පිළිතුරු දීමට යෙගෝර්ට සිත් වුණද ''ඌ කොහේද?'' යි ප්‍රශ්න කළොත් යන බිය නිසා ඔහු, ''නැහැ, දැක්කේ නැහැ'' යි කීවේය.

''ශීත උහුලගන්ට බැරුව මළාද?'' යි ලෙනින් නැවත ප්‍රශ්න කළේය.

''නැහැ, ඌ උණුහුමට ඉන්නවා'' යැයි පිළිතුරුදීමට යෙගෝර්ටසිත්විණ. එහෙත් ඔහු ගොළු විය.

කොළුවාගේ ඇස් පහත බැලිණ. ලෙනින් තරහයෙන් සිටින බව යෙගෝර්ට පැහැදිලිය.

''හීතලට අහු වෙලා මළා! මළා!'' යැයි කියමින් දුක්වන ලෙනින්, ''නැති නම් පූසෙක් වත් ඌව අල්ලා ගන්නට ඇති'' යි කීය.

''නැහැ. ඌ හොඳ සනීපෙන්. ඌ ආයෙමත් මෙහෙට ඒවි.'' යැයි යෙගෝර් කීය.



Scanned with CamScanner

''ආයෙමත් ඒවිද?!''

''ආයෙමත් ඒවි! ආයෙමත්!'' යැයි යෙගෝර් හඬ නගා කීවේය.

පසුදින ලෙනින් බර්ච් ගස අසලට ආවේය. යෙගෝර් කීවේ ඇත්තකි. රතු බෙල්ලා පඳුරක සිටී. බර්ච් ගස යට යෙගෝර් සිට ගෙන සිටී.

කුරුල්ලා දෙසද, කොළුවා දෙසද බැලූ ලෙනින්, ''ආයුබෝවන්'' යැයි යෙගෝර්ට කීය. ''ආයුබෝවන් කුරුල්ලො උඹ කොහෙද ගියෙ?'' යැයි කුරුල්ලාගෙන් ඇසීය.

148 කුරුල්ලා හොට දිගු කරමින් යෙගෝර් දෙස බැලුවේය.

යෙගෝර්ට හීන් දඩිය දැම්මේය. සිදුවුණු දෙය කුරුල්ලා හෙළි කරාවි යන බියක් යෙගෝර් තුළ හට ගත්තේය.

එහෙත් කුරුල්ලා නිහඬ විය. යෙගෝර් එතරම් නපුරු හතුරෙකු නොවන බව ඌට වැටහුනාක් මෙනි. යෙගෝර් කළදේ හෙළි කරන්නේ කුමටද?!

Scanned with CamScanner

## ලෙනින් ළමයිනට ඇළුම් කළේය



ලෙනින් විවේක ගත් ගෝර්කි අසල 'යාම්' නමැති ගමගෙ පාසල් ගුරුවරියකි ඇලෙක්සාන්ද්‍රා නිකොලායෙව්නා කෝලසොවා. ඒ කාලයේදී, එනම් 1918 දී රටේ තත්ත්වය අයහපත් විය.

වසන්ත සමයේදී කෝලසොවා හමුවීමට ලෙනින්ගේ බිරිඳ වන නදේෂ්ද ක්‍රෘප්ස්කයා සහ නැඟණිය වන මරියා උල්යානොවාද ආහ.

දෙදෙනාම කෝලසවාට 'ආයුබෝවන්' කීහ.

''සහෝදරිය!'' යැයි මරියා උල්යානවා ඇය ඇමතුවාය. ඒ දවස්වල 'සහෝදර' යන වචනයෙන් අමතන්නේ විශ්වාසවත් අයට පමණකි. එම වචනය සම්පූර්ණ විශ්වාසය අවධාරණය කරයි. ''සහෝදරිය, අප ආ කාරණය මේකයි. අපේ රජයේ ගොවිපළට අයත් ගොවි ළමයි සඳහා ළමාගාරයක් පටන් ගැනීමට අපි තීරණය කළා. ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් කියනවා, ළමයින්ට කන්ට බොන්ට දෙන්ට ඕනැය කියල. ළමයින්ගෙ තත්ත්වය නරකයි, ඒ ගොල්ල කෙට්ටු වෙලා. මේ සහෝදරියට පුළුවන්ද ළමයින් භාරව වැඩ කරන්ට ?''

''ලෙනින් සහෝදරයම තීරණය කළා නම් ළමාගාරයක් පටන් ගන්ට, ඇයි මට බැරි එහි වැඩ කරන්න ?'' යැයි කෝලසොවා සිතුවාය.

''මම කැමතියි'' ඈ පැවසුවාය.

ගෝර්කිහි මහ ගෙදර අසල කුඩා ගෙයක් විය. මේ ගෙයි ගිම්හානයේදී ළමාගාරය විවෘත කරන ලදී. එහෙත් මේ ළමාගාරය මුලින් අත දරුවන් සඳහා විවෘත කළද, අවුරුදු දෙකේ සිට අවුරුදු දහ හතර දක්වා වයසැති ළමයින් මෙහි ආ නිසා, එයින් මුල් අදහස ඉටු නොවීය.

### ළමා නිවස

ළමා නිවස විවෘත කිරීම නිමිත්තෙන් මරියා උල්යානොවා උත්සවයක් පැවැත්වූවාය.

ළමා නිවසට උවමනා මේස හා ඇඳන් අප විසින්ම සාද ගන්නා ලදී. කණු සිටවා, ඒවාට අමතර හරස් ලෑලි සවි කොට, උඩින් දිග ලෑලි දමා මේස සාද

ගත්හ. ඇඳුන්ද ඒ විධියටම සාදු ගන්නා ලදී. ඒ අතර අපට රෙදි තොගයක්ද ලැබිණ. ගැණු ළමයින් සඳහා බාලම වර්ගයේ කපු රෙදිද, පිරිමි ළමයින් සඳහා අළු පැහැති රෙදි වගයක්ද විය. ඇඳුම් මැසීමද අපිම කළෙමු. ඒ දවස්වල අපට ඇතිවූ ප්‍රීතිය කොපමණදැයි කිව නොහැක.

මේ අන්දමට ළමා නිවස ආරම්භ විය. වැඩි වයස් ළමයි පාසල් ගියහ. හවස පාඩම් කළහ. ඒ දවස්වල කොපි පොත් හිඟයක් තිබිණ. හැම කඩදසියක්ම ප්‍රවේසම් කරන ලදී. ලියන තීන්ත නොතිබුණු බැවින්, කළු ලැල්ලේ හුණුවලින් ලියන ලදී. කොළ පැහැති ගෙඩි වගයක් කඩා ලියන ඒවායේ කහට තීන්ත වෙනුවට පාවිච්චි කරන ලදී.



ළමා නිවස බැලීමට ලෙනින් නිතර ආවේය.

ළමයින් සමග එක පෙළට වාඩි වන ලෙනින්, ''කොහොමද, හොඳට ඉගෙන ගන්නවද?'' යි අසයි. ඔවුන්ගේ පොත් පෙරළා බලයි: ''ඉගෙන ගන්ට ඕන, ඉගෙන ගන්න, ඉගෙන ගන්න! නූගත් මිනිහා අන්ධයෙකු වගේ'' යැයි නිතර නිතර කීය.

## කඩදාසි ගෙම්බා

ගිම්හාන කාලයේදී වැඩි වයස් ළමයි 'ගරද්කි' ක්‍රීඩාව සඳහා පොලු කෑලි කපා පිළියෙළ කර ගෙන සුදුසු ස්ථානයක්ද තෝරා ගත්හ. පාසල් කාලයෙන් පසු ඔව්හු එකතු වී ක්‍රීඩා කරති. ලෙනින් දිනපතාම තම නිවසේ සිට නත්තල් ගස් සහිත අඩි පාර ඔස්සේ පහ්රා නදිය දක්වා ගමන් කරයි. ළමයි සෙල්ලම් කරන සැටි දකින ලෙනින් ඔවුන් වෙත විත් බලා ගෙන සිටී. පසුව ඔහුද ක්‍රීඩා කරයි. ළමයිද ඔහු සමග හරි හරියට සෙල්ලම් කරති. එකි'නෙකාට වාසි නොදී දෙපැත්තම හරි හරියට සෙල්ලම් කරන්නට විය.

පොඩිත්තන් සඳහා ළමයින් බලා ගන්නා කාන්තාවෝ කෙළි බඩු සෑදූහ. කෝල්සොවාද බොහෝ විට මෙලෙස නොයෙකුත් කෙළි බඩු සෑදුවාය. රෙදි බෝනික්කන් සෑදීම සහ පරණ රෙදි කෑලි ඔබා බෝල සෑදීම ආදිය ඇ විසින් කරන ලදී.

පොඩිත්තන් බැලීමට එන ලෙනින්ද සමහර විට කෙළි බඩු හදයි. ඔහු කෙළි බඩු සෑදුවේ කඩදසිවලිනි. ලෙනින් තරම් හොඳින් කඩදසි නැව්, කුරුල් ලන් සහ බෝට්ටු සෑදීමට අන් අයට බැරිය.

දවසක් ද ලෙනින් කඩදසිවලින් ගෙම්බෙකු හැදුවේය. ඌ සැබෑ ගෙම්බෙකු වගේය. ඔළුවත් කකුල් හතරත් ඉතා හොඳින් නිමවී තිබිණ. ගෙම්බාගේ පිටට ඇඟිල්ලක් තැබූ විට ඌ පනියි. පොඩිත්තෝ මේ ගෙම්බා නිසා සතුටු වූහ.

Scanned with CamScanner

එකෙක් ගෙම්බාට ඇඟිල්ලකින් අනී, එවිට ඌ පනී. පොඩිත්තෝ හඬ නගමින් සිනාසෙති. ළමයින් භාරව සිටින කෝලසවාද, ලෙනින්ද පොඩිත්තන් සමග එකතුව සිනාසෙති.

## හිම ගුලි

ඒ දවස්වලදී ගෝර්කියේ ගෙවල් වටා වැටවල් නොතිබිණි. ගම්මානය වටා කැලයකි. එය දේවදර, නත්තල් ගස්, බර්ච් ආදී ගස්වලින් පිරිලාය. උසට වැඩී ඇති ගස්වලට යටින් ශීත කලාපයේ වැවෙන පළු වර්ග සහිත පඳුරුය. ගිම්හාන කාලයේදී කොල්ලෝ සහ කෙල්ලෝ පළු සහ හතු වර්ග එකතු කිරීමට කැලයට වදිති. සීත කාලයේදී සෙල්ලම් කිරීමට හා ඇවිදීමට කැලයට යති.

එක් ප්‍රීතිමත් දවසක් අද මෙන් මතකය.

ගමේ පොඩිත්තෝ කැලයට වැද විහිළු තහළු කරමින් සිනාසුණාහ. හිටිහැටියේ ඔවුන් මත හිම ගුලියක් පතිත විය. එය වැටුනේ කොහි සිටද? කවුද එය විසි කළේ? පොඩිත්තෝ වට පිට බලති. එවිටම වාගේ තවත් හිම ගුලියක් ඔවුන්ට වැදිණ. දේවදර ගසකට මුවාවී ලෙනින් ඔවුන් දෙස හිම ගුලි විසි කරයි. හැමදම අඳින හිම කබාය හැඳ ගෙන හිම තොප්පියක් ලා ගෙන ගස කට මුවා වී සිටින ඔහු ළමයි දුටුවෝය.

ළමයි හනික හිම ගුලි සාද ලෙනින් වෙත විසි කළහ. ලෙනින්ද ඔවුන් වෙත හිම ගුලි යවයි. ළමයින් බලා ගන්නා කාන්තාව කලබල වූවාය.

''අනේ ළමයිනේ, ඔහොම කරන්ට එපා. ඒ ලෙනින් සහෝදරය නේද?''

ඇගේ ඉල්ලීමට ඔවුහු සවන් නොදුන්හ. නියම හිම සටනකි. දෙපිළ බෙදී හිම සටන කෙරේ. ලෙනින් හිම ගුලියක් ඔවුන් දෙස විසි කොට ගසකට මුවාවෙයි. ලෙනින්ට වැදෙන සේ හිමගුලි විසි කිරීමට ළමයින්ට බැරිය. සැඟවී සිටින ලෙනින් හඬ නගා සිනාසෙයි.

හිම සටන බොහෝ වේලාවක් පැවතිනි. හිම ගුලි දෙකක් හෝ තුනක් ලෙනින්ට වැදිණ. එවිට ඔහු සිනාසී කෑගසයි:

''හපනා! ඉලක්කයට ගහන්ට පුළුවන් වුණා. ලොකු වුණාම ඉලක්කයට වෙඩි තියන්ට ඉගෙන ගන්න. මව්බිම රකින්න!''

## හමුවීම

රජයේ ගොවිපළේ සත්ව ආහාර හිඟයක් ඇති විය. ළමා නිවාසය සත්ව ආහාර සොයා දී ගොවිපළට උදව් කිරීමට තීරණය කළේය. වැඩි වයස් ළමයි එකතු වී කැලයට ගොස් කොළ අතු රිකිලි ආදිය එකතු කොට ඒවා මිටි ගසා





Scanned with CamScanner

බදින්නට වූහ. ඒ සීත සෘතුවට ආසන්න කාලය විය. පොදවැස්ස නොනැවතී වසී.

ලෙනින් කිසියම් කටයුත්තකට සහභාගී වී පෙරළා ගෙදර එමින් සිටී. ඔහුගේ මොටෝ රිය මඩ හා දිය කඩිති සහිත පාරේ අමාරුවෙන් දිවෙයි. රෝද මඩවලක වැටුණු බැවින් රිය නැවතිණ.

ලෙනින් එළියට බැස්සේය. ළමයින්ගේ හඬ ඇසූ ඔහු ඔවුන් වෙත ගියේය. ලෙනින් දුටු ළමයි, ඔහුගේ මොටෝ රථය මඩවලක එරී තිබෙන සැටි දුටුවෝය. රංචුවම එකතු වී මොටෝ රිය තල්ලු කරන්නට වූහ. අතු කඩා මඩවලට දමා එරුණු රෝදය ගොඩ ගත්හ.



වැස්සට තෙමී සීතලට හසුවී සිටි ළමයින් දෙස බැලූ ලෙනින් දයාබර සිනා වක් පෑවේය.

''ළමයිනේ, කවුද කැමති කාර් එකේ යන්න?''

අකැමති අය නොවූහ. හැමදෙනාම එක හඬින් කැමතිවූහ.

එවිට ලෙනින් බැරෑරුම් ගතියක් පාමින් 'අණදුන්නේය':

''රියට නගිනු!''

ළමයි පොර කමින් රියට ගොඩ වූහ. ලෙනින්ට වාඩි වීමට පවා තැනක් නැති බව දුටු ළමයි එකි නෙකා රථයෙන් එළියට බසින්නට වූහ.

ලෙනින් ළමයින්ගේ සිත් ක්‍රියා කරන සැටි තේරුම් ගත්තේය.

''වාඩි වෙයල්ලා, ළමයිනේ. නුඹලා තෙතබරි වෙලා ඉන්නෙ. මම මුළු දවසෙම කාර්යාල කාමරේ හිටියෙ. මා කැමතියි පයින් ගමන් කරන්ට.''

මොටෝ රිය සැර දමා ගමනට පිටත් විය.

''ඉතිරි ළමයි කාණ්ඩායමත් ගෙනියන්ට ආපසු එන්න,'' යැයි ඔහු රියැදුරාට කීය. ලෙනින් කැලෑ පාර දිගේ නිවෙස බලා ගියේය.

ආපසු මොටෝ රිය එනතුරු බලා සිටි ළමා පිරිස් ඔවුන් වෙතින් ඉවතට පා තබමින් යන ලෙනින්ට අත් වැනූහ.

## නව අමුත්තෙක්

ළමා නිවසට දැන් තුන් අවුරුද්දකි. ලෙනින් නිතර මෙහි විත් ළමයින් සමග කතාබහ කරයි. ඔවුන් සමග වෙස් දම් කෙළියි, උවමනාවෙන්ම පරදී.

ළමයින් ගී ගයනවා ඇසීමටද ලෙනින් ආශා කළේය. ''දුක්බර අතීතය'' ඔහුගේ ප්‍රියතම ගීයකි. ''ටිකිරි ඕල්යා'' නැමති ගීයද ඔහුගේ සිත් ගත්තේය. පොඩිත්තන් එම ගීය ගයන විට ලෙනින් මහත් ආසාවකින් එය අසයි. 'ර'

Scanned with CamScanner

ශබ්දය වෙනුවට 'ළ' ශබ්දය යොදමින් හුරතල් බසින් ගයන පොඩිත්තන් දෙස බලන ලෙනින් ප්‍රීති සිනාපායි.

ළමයින් හැදී වැඩී ළමා නිවස අතහැර යති, ඔවුන් වෙනුවට තවත් පොඩිත්තෝ ආහ. ''අප බලන්ට අමුත්තෙක් එනවා.''

ළමා නිවස පිළිබඳ ආරංචිය හැම තැනම පැතිර ගියේය. ආලෝකය සොයා යන අඳුර සේ දෙමාපියන් නැති අනාථ ළමයි මෙහි ආහ.

ලෙනින් පහ්රා ගං ඉවුරේ බංකුවක් මත වාඩි වී විවේක ගැනීමට ආශා කළේය. ගිම්හානයේ එක් උණුසුම් දවසක ඔහු ගං ඉවුරේ බංකුව මත වාඩි වී පුවත්පතක් කියවමින් සිටියේය. ගමන් මල්ලක් උරයකින් ගත්, වැරහැලි හැඳ ගත් ළමයෙක් ඔහු වෙත ආවේය. 

''ලෙනින් සහෝදරයගෙ ගෙදර කොහිද?'' යි කොල්ලා ඇසීය.

''මොකක්ද උවමනාව?'' ලෙනින් ප්‍රශ්න කළේය.

''මට එයාව හම්බවෙන්ට ඕන. මගේ අම්මා මළා. තාත්තාව මරා දැම්මා. මිනිස්සු මට කිව ලෙනින්ව හම්බවෙලා එයාගෙ ළමා නිවසට ඇතුළු වෙන්ට කියල,'' යැයි කොල්ලා කීවේය.

නැගිට සිටි ලෙනින් ''හොඳා යමු, මම උඹව ළමා නිවසට ඇරලන්නම්,'' යැයි කීවේය.

ලෙනින් කොල්ලාව කෙළින්ම කෑම බෙදන කාමරයට ගෙන ගියේය.

''මෙන්න තව අමුත්තෙකුව් කැඳවා ගෙන ආවා!'' යැයි ලෙනින් පැවසීය.

''අමුත්තෙකුවද? ඒක හොඳ වැඩක්'' යැයි කුස්සි අම්මා කීවාය. ඇගේ නම ග්‍රවෝවාය.

''කොහොමද වැඩ කටයුතු? උවමනා දේවල් තියෙනවද?'' යි ලෙනින් ප්‍රශ්න කළේය.

''ආහාර සෑහෙන්ට තියෙනව. ගමනා ගමනය හොඳ නැහැ. පාලමක් නැහැ. ආහාර අසු පිටින් ගඟ හරහා ගේනවා.''

''පාන් සෑහෙන්ට තියෙනවද?''

''පිටි නම් තියෙනව. ඒ උනාට පාන් පුච්චන්ට බැහැ.''

''වේලාසනින් පාන් පුච්චා ලෑස්ති කරගන්න.''

ලෙනින් සමග කතා කළ කුස්සි අම්මා ළමයින් භාර කාන්තාව වෙත ගොස් මෙසේ කීවාය:

''ඇලෙක්සාන්ද්‍රා නිකොලායෙව්නා, කවුදෝ කම්කරුවෙක් තවත් අළුත් ළමයෙකුව අඩ ගහ ගෙන ඇවිල්ලා.''

කෝලසවා එළියට විත් බලන්නී, ලෙනින් දැක දෑත් විදහා ගත්තාය:

''මේ අපේ ලෙනින් සහෝදරයා නෙව!''

ග්‍රචෝවා ළමා නිවාසයේ කෑම සෑදීමට ආවේ මේ නොබෝද්‍රය.ඇ මීට පෙර කිසි දිනෙක ලෙනින් දැක නැත. ළමයින් භාර කාන්තාවගේ වචන ඇසූ ඇය ගොළු වූවාය.

ළමයාට දවල් ආහාර දෙන ලදී. ලෙනින් සුප් කෝප්පයක් බීවේය.

''ඔය ළමයව නාවල පිරිසුදු ඇඳුමක් අන්දවන්ට. එයා මෙහෙ නැවතුනා දෙන්,'' යැයි ලෙනින් කීය.

ඉදින්, ඒ ''අමුත්තා'' ළමා නිවාසයේ නතර විය.



## අවසාන හමුවීම

1923 පෑමිණියේය. ලෙනින් නිතර නිතර රෝගී වීමට පටන් ගත්තේය. දෙස්තරවරු ඔහු වැඩි කලක් ගෝර්කිහි නවත්වා ගැනීමට වෑයම් කළහ.

ලෙනින් ළමා නිවසට ඒමද හොඳටම අඩු විය. ඔහුගේ රෝගය බරපතළ විය. කෝලසොවා ලෙනින් හමුවූයේ එක වරක් පමණකි.

ඇය ළමයි රංචුවක් සමග බෑද්දේ ඇවිදින විට බලාපොරොත්තු රහිතව ඔවුන්ට ලෙනින් හමුවිය. නදේෂ්ද ක්‍රෘප්ස්කයා ලෙනින්ගේ රෝද සහිත පුටුව තල්ලු කරමින් අඩි පාර දිගේ යන සැටි ඔවුහු දුටුවාහ. ඒ වනවිට රෝගී ලෙනින්ට ගමන් කිරීමට පවා බැරි විය.

ළමයි රංචුව එකවර කෑගැසූහ:

''ලෙනින් සීයේ!'' යැයි කියමින් ඔවුහු ලෙනින් වට කර ගත්හ.

නදේෂ්ද ක්‍රෘප්ස්කයා අතක් වනමින් ඉක්මන් කරනු දුටු ළමයින් භාර කාන්තාව වහාම ළමයින් රැස් කර ගෙන ඉඩ දුන්නාය.

හවස කෝලසවා ''මහ ගෙදරට '' කැඳවන ලදී. ලෙනින් නැවතී සිටි ගෙදර හඳුන්වන ලද්දේ එනමිනි. මරියා උල්යානොවා ඇය හමුවූවාය.

''සහෝදරී, ළමයින් එක්ක මේ පැත්තේ ඇවිදින්ට එපා. අයියා ළමයින් දැක්කාම හොඳටම කලබල වෙනවා. ඒක හන්ද එයාගෙ අසනීපෙ තවත් නරක් වේවි. අයියා බරපතළ ලෙස අසනීප වෙලා ඉන්නෙ.''

## සමුගැනීම

තව වරක් ලෙනින් හමුවීමට ළමයින්ට අවස්ථාවක් ලැබිණ. නත්තල් ගහ දැකීමට එන ලෙස ලෙනින් ඔවුන්ට ආරාධනා කළේය. ''මහා ගෙදරදී'' ඔවුන්ට තෑගි ලැබිණ. ඔවුහු ප්‍රීති වූහ. තමන් දුටු දෙය ඔවුහු ආශාවෙන් කීහ...

දින කීපයකට පසු ''මහා ගෙදරින්'' භයානක ආරංචියක් ලැබිණ:

''ලෙනින් මිය ගියේය.''

Scanned with CamScanner

ළමා නිවස නිහඬ විය. පොඩිත්තෝ අඬන්නට වූහ.

එදා රෑ ළමයි නිදාගන්නට ගියද, නොනිදා නිහඬව උන්හ.

පසුදා උදෑසන ළමා නිවසේ ළමයි ලෙනින්ගේ දේහයට අවසාන ගරු බුහුමන් දැක්වීම පිණිස මල්වඩමක් ගෙන ආහ. ලෙනින්ගේ සිරුර පෙට්ටියක තබා තුබුණි. ක්ලිමෙන්ට් වොරොෂිලොව්*, මිහයිල් කලිනින්** සහ ක්ලාරා සෙට්කින්*** මළ සිරුර අසල සිට ගෙන සිටියහ. ලෙනින්ට අවසාන ගරු බුහුමන් දැක්වීම පිණිස වැළ නොකැඩී ජනයා ඇදී ආහ. රාත්‍රිය නොතකා ඇදී ආ මහා ජනකායගෙන් මහා ගෙදර පිරී ඉතිරී ගියද එහි වූයේ නිහඬතාවයකි. සු හඬ පවා නොඇසිණ.



උදෑසන ලෙනින්ගේ සිරුර සහිත මිණී පෙට්ටිය දුම්රිය පළට ගෙනෙන ලදී. මහා ජනකායක් එය පසු පසින් ගමන් ගත්හ. නිහඬව දුක් කඳුළු වැගුරූහ. එදින දැඩි සීත දිනයක් වුවද මිනිස්සු හිම තොප්පි රහිතව ගමන් කළහ.

විශේෂ දුම්රිය මැදිරියක මිණී පෙට්ටිය තබා මොස්කව් නගරයට ගෙනයන ලදී.

ළමා නිවසේ හැම දෙනෙක්ම හැඬූ කඳුලෙන් පසු වූහ.

---

* ක්ලිමෙන්ට් වොරොෂිලොව් (1881—1969) පැරණි කොමියුනිස්ට් නායකයෙකි. සෝවියට් රාජ්‍ය නායකයෙකි.

** මිහයිල් කලිනින් (1875—1946) කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් රජයේ සම්භාවණීය නායකයෙකි.

*** ක්ලාරා සෙට්කින් — ජර්මන් සහ ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ක්‍රියාශීලි නායිකාවකි.

## ලෙනින් සිහිවටණ

සෝවියට් දේශයේ ලොකු කුඩා හැම නගරයකම, හැම ගමකම ලෙනින් සිහිවටණ ඇත. ඒවායින් සමහරක් සුප්‍රසිද්ධ මූර්තිශිල්පීන් අතින් නිමැවී ඇති අතර සමහරක් ජනතා ශිල්පීන් අතින් නිමැවී ඇත.

සෝවියට් ජනතාවගේ සදදරණීය නායකයාණන්ගේ රූපය කොකේසියාවේ කඳු වැටියක කොටා ඇත. ඒ කඳු අහස සිපගනිති. එතරම් උස කඳු වැටියක ලෙනින් රූපය ඇඳීමට මිනිසුන්ට පියාපත් තිබිය යුතුය.

ලෙනින් පිටුවහල් කාලය ගත කළ ෂුෂෙන්ස්කොයෙට යන අය එක් 'පයින්' ගසකින් ගෙඩි හා ඇට ගෙනයති. ඒ පයින් ගස යට ලෙනින් විවේක සුවය ගත කළේය. මේ පයින් ගසේ ඇට ගෙනගොස් තම ගෙවතුවල සිටවීම සෝවියට් ජනතාව අතර පවතින පුරුද්දකි. එය තම හිතවත් නායකයා සිහිවීම පිණිසය.

ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ එයිස්ලෙබෙන් නගරය ලෙනින්ගේ ජීවිතය හා සම්බන්ධ වූවකි. දෙවන ලෝක මහා යුද්ධය අවසානයේදී සෝවියට් යුද්ධ හමුද එයිස්ලෙබෙන් නගරය මුද ගත්හ. පැසිට්වාදීන් සතුව පැවැති එම නගරයේ චතුරශ්‍රයක ලෙනින්ගේ ලෝහමය පිළිරුවක් තිබෙනු දුටු ඔවුහු පුදුම වූහ. පැසිස්ට්වාදී වධ කඳවුරුවලින් මුද හරිනු ලැබූ පෝලන්ත, බෙල්ජියම්, ප්‍රංශ, චෙක් ජාතිකයෝ මේ නගරය හරහා නැගෙනහිර බලා ගියහ. ලෙනින්ගේ පිළිරුව දුටු ඔවුන්ද පුදුමයට පත් විය. පැසිස්ට් මාග පාලනය අවසන් වී නැවතත් නව දිවියක් උදවී ඇති බව ලෙනින්ගේ පිළිරුව ඔවුන්ට කියා පෑවා විය හැකිය.

මේ ලෝහමය ලෙනින් පිළිරුව සෝවියට් සංගමයේ සිට ජර්මන් පැසිස්ට්වරුන් සොරා ගෙන ආවේ එය උණු කොට අවි සෑදීම පිණිසය. එහෙත් පැසිස්ට් විරෝධී ජර්මන් කම්කරුවෝ එවැන්නකට ඉඩ නොතැබූහ. ඔවුහු පිළිරුව සැඟවූහ. ජීවිතය පවා නොතකා සෝවියට් යුද්ධ හමුදව එනතුරු එය ආරක්ෂා කළහ. පැසිස්ට් සේනා පැනගිය පසු, කම්කරුවෝ ඒ ලෝහමය ලෙනින් පිළිරුව චතුරශ්‍රය මැද තැබූහ. අද දක්වාත් එය එසේම පවතී.

එහෙත් සදදරණීය නායකයාණන් සිහිවීම පිණිස තැනිය හැකි ඉතාම අගනා සිහිවටණය, ඔහුගේ සීතැඟියාවන්, ඔහු සටන් කළ දේ, ඔහු වැඩ කරන

Scanned with CamScanner

සියලුම ජාතික උත්සව දිනවලදී සෝවියට් ජනතාව රතු චතුරශ්‍රය හා ලෙනින් සොහොන වෙත එති.




Scanned with CamScanner

පයනියර්වරු ලෙනින්ගේ සොහොන වෙත පැමිණ ඔහු පෙන්වූ මග ඔස්සේ යාමට දිවුරුම් දී පොරොන්දු වෙති.
ලෙනින්ග්‍රාඩයේ ඉතාම උසස් මන්දිරයක් පයනියර් වරුන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කොට ඇත.





Scanned with CamScanner

මොස්කව්හි ලෙනින් පොත්ගුල.

වොල්ගාහි මේ යෝධ විදුලි බල ස්ථානයට ලෙනින්ගේ නම තබා ඇත.





Scanned with CamScanner

සෝවියට් අජටාකාශ ගාමීන් වන ගියොර්ගි බ්‍රිගවොයි සහ ව්ලදිමීර් ෂටාලොව්, අජටාකාශ තරණයට පෙර ක්‍රෙම්ලින්හි ලෙනින්ගේ කාර්යාල කාමරය නැරඹූහ.



ස්මොල්නිහි ලෙනින්ගේ කාමරය. එද තිබූ පරිදිම ආරක්ෂා කොට තබා ඇත.



Scanned with CamScanner

කොලොම්බියා රටින් පැමිණි නියෝජිත පිරිසක් ස්මොල්නිය නරඹති.



Scanned with CamScanner

මේ ඩෙස්ක් එක මත හැමදම මල් පොකුරකි. වලෝද්යා උල්යානොව් හත්වැනි පංතියේ ඉගෙන ගනිද්දී ඔහු මේ ඩෙස්කය පාවිච්චි කළේය.



Scanned with CamScanner

මීට අවුරුදු බොහෝ ගණනකට පෙර ලෙනින් ඉගෙනගත් පංති කාමරය තුළ අද භෞතික විද්‍යාව පිළිබඳ පංති පවත්වති.

අන්ගෝලාව, සැම්බියාව, කිනියාව සහ ගිනියාව ආදී රටවලින් පැමිණි නියෝජිතවරු ලෙනින් ළමා කාලය ගතකළ නිවෙස නරඹති.





Scanned with CamScanner

ලෙනින් සොහොන මත ජවහර්ලාල්
නේරු මල් වඩමක් තබයි.



Scanned with CamScanner

ලයිප්සිග්හි ඉස්ක්‍රා කෞතුකාගාරයේ
ලෙනින් සිහිවටණ.




Scanned with CamScanner

අරාබි රටවලින් පැමිණි කාන්තා
නියෝජිත මණ්ඩලයක් ස්මෝල්නිය
නරඹයි.



Scanned with CamScanner

කියුබාවේ හවානාහි පවත්වනලද ලෙනින් ප්‍රදර්ශනය.



Scanned with CamScanner

මොස්කව්හි ලෙනින් කෞතුකාගාරය.



ජනතාවට දුන් උපදෙස් ක්‍රියාවට යෙදවීමය. එවැනි අනගි සිහිවටණයක්ද ලෙනින් සිහිවීම පිණිස ජනතාව විසින් ගොඩ නගන ලදී.

ලෝකයේ දියුණුතම ධනපති රටවල් අවුරුදු සියයක්, දෙසියයක් තුළදී කළ දේ සමාජවාදී සෝවියට් රජය අවුරුදු පනහක් තුළදී කර ඇත. සෝවියට් සංගමයේ ට්‍රැක්ටර් හා කොම්බයින් යන්ත්‍ර දස ලක්ෂ ගණනක් සමූහ ගොවිපළවල වැඩ කරයි. බලගතු ගංගා මෙල්ල කොට යෝධමය ජල විදුලි ස්ථාන සාදා ඇත. බිම් ප්‍රමාණය අනුව සෝවියට් සංගමය ලංකාව මෙන් තුන්සිය විසි වාරයක් විශාලය. මෙතරම් විශාල රටක හැම තැනම විදුලි එළිය ඇත. සාර් රජ කාලයේ මූකලන් කැලෑවකට සමානවූ සයිබීරියාව අද නවීන කම්හල් වලින්ද, විද්‍යා — ඇකැඩමි වලින් හා රහහල් වලින්ද යුක්තය. පළමුවරට අජටාකාශය සැරිසැරීමේ භාග්‍යයද සෝවියට් රට වැසියකුට හිමි විය. අකුරු නොදත් අය අද අප රටේ නැත. බාල පරම්පරාව පාසල්වල හා සරසවිවල උගනිති. මේ සියල්ලම ලෙනින්ගේ සිහිනයන්ය. ඒ හැම ජයක්ම ලෙනින් සිහි කරවන අගනා සිහිවටනයන්ය.

සෝවියට් සමාජවාදී ජනරජ සංගමය තුළ ජාතිහු සියයකට අධික ගණනක් වාසය කරති. ''අ'' යන්නෙන් පටන් ගෙන අවසාන අකුර දක්වා හැම අකුර කින්ම ඒ ඒ ජාතීන්ගේ නම් කිව හැකිය. නිදසුනක් වශයෙන් ''අ'' යන්නෙන් පටන් ගනිමු. අසර්බයිජාන්, ආර්මේනියානු, අබ්හාසියානු, අදිගෙයිට්සියානු, අබසින්යානු, අවාර්ට්සියානු, අයිසොරියානු, අල්තායි, අලෙඋට්... මේ විවිධ ජාතීන්ගේ සිරිත්, විරිත්, බස, සම්ප්‍රදයන් එකිනෙකට වෙනස්ය. එහෙත් මොවුන් එකම සමගි පවුලකි. සහෝදරයෝ මෙන් ජීවත් වෙති. ඔවුහු රට සමෘධිමත් කිරීමේ පොදු කාර්යයේ යෙදී සිටිති. සෝවියට් ජනතාවගේ සහෝදරත්වය හා මිත්‍රත්වය ලෙනින් සඳහාවූ අනගි සිහිවටනයකි.

ස්වාධීනත්වය සහ වඩාත් හොඳ ජීවිතයක් සඳහා සටන් කරන අනිකුත් රටවල ජනතාවට ආධාර දෙන ලෙස ලෙනින් අපට කීවේය. අප්‍රිකාවේ ගම්වලට වැද ජනතාවට වෙදකම් කරන සෝවියට් දොස්තරවරුන් නිසාද, එක්සත් අරාබි ජනරජයේ විදුලි එළිය නිපදවන සෝවියට් ටර්බයින් යන්ත්‍ර නිසාද, සතුරු අහස්යානා බිඳ හෙළීමට වීර වියට්නාම් ජනතාව පාවිච්චි කරන නවීන සෝවියට් රොකට් වෙඩි හා සටන්කරන වියට්නාම් ජනතාවට දෙන සෝවියට් ජනතාව නිසාද අපි ආඩම්බර වෙමු... මේ සියල්ලම ලෙනින් වෙනුවෙන් ඉදිකොට ඇති අගනා සිහිවටණයන්ය.



Scanned with CamScanner